# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2020.01.21

වර්ෂ 2020 ක් වූ ජනවාරි මස 21 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ජනවාරි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
16. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
17. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
18. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
19. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
20. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
21. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි**

01. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමනාකරණ සහකාර පී.එච්.සී.ඩී. විජේසේන මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>01) 2020 වර්ෂයේ අයවැය කෙටුම්පත සභා සම්මත කිරීම සඳහා පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම (I. පළමු කොටස 2019-11-05 හා II. දෙවන කොටස 2019-12-03)</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ අයවැය කෙටුම්පත සභා සම්මත කිරීම සඳහා පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව (I. පළමු කොටස 2019-11-05 හා II. දෙවන කොටස 2019-12-03) කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020 වර්ෂයේ අයවැය කෙටුම්පත සභා සම්මත කිරීම සඳහා පැවැත්වූ විශේෂ

මහා සභා රැස්වීමේ වාර්තාව (I. පළමු කොටස 2019-11-05 හා II. දෙවන කොටස 2019-12-03) ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** **:-** 2020 වර්ෂයේ අයවැය කෙටුම්පත සභා සම්මත කිරීම සඳහා පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව (I. පළමු කොටස 2019-11-05 හා II. දෙවන කොටස 2019-12-03) සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා** **:-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

2020 වර්ෂයේ අයවැය කෙටුම්පත සභා සම්මත කිරීම සඳහා පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව (I. පළමු කොටස 2019-11-05 හා II. දෙවන කොටස 2019-12-03) ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගි වීම සිදුවිය.)

<u>**02) 2019-12-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** 2019-12-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2019-12-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා** **:-** 2019-12-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** **:-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා** **:-** ගරු සභාපතිතුමා ඇතුළු සම්භාවනීය සියලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. 2019-12-17 දින පැවැත්වූ මහා සභාවේ චමින්ද මන්ත්‍රීතුමාත්, මමත් අතර ඇතිවූ කතාව සම්බන්ධව කිසිම විස්තරයක් සභා වාර්තාවේ නෑ. චමින්ද මන්ත්‍රීතුමා කිවුවා රෙකෝඩින් එකක් තියෙනවා කියලා මා සමග දුරකථනයෙන් කතා කරපු. චමින්ද මන්ත්‍රීතුමා එක්ක මම මෙතෙක් කතා කරලා නෑ. හැබැයි රෙකෝඩින් එකක් තියෙනවා කියලා කිවුවා. ඒක දාන්න කියලා එදත් මම ඉල්ලීමක් කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** ඒකේ විජේපාල මන්ත්‍රීතුමා සම්බන්ධ සියලු කාරණා අයින් කරන්න කියලා කිවුවානේ. ඒ යටතේ තියෙන කාරණාව වෙන්න ඇති ඔය කියන්නේ. දැන් ඒක දාන්නද ඕන.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා** **:-** ඔව්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** ඒක අයින් කරන්න කියලා කිවුවා නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා** **:-** විජේපාල මහත්තයාගේ කතාව නෙමෙයි මේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** ඒ කතාව පටන් ගනිපු තැන ඉඳන් අයින් කරා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා** **:-** ඒක නෙමෙයි අපි කිවුවේ. ඒ කතාව නෙමෙයි අපි කිවුවේ. මෙතුමා පාර සම්බන්ධව මට චෝදනාවක් දැම්මා. මන්ත්‍රීවරු දෙන්නෙක් ඉන්නවා කිවුවා මේකට අකුල් හෙලන. දුරකථන ඇමතුම් ඔක්කොම මගේ ළඟ තියෙයි කිවුවා. මම මෙතෙක් දුරකථන ඇමතුමකින් චමින්ද මන්ත්‍රීතුමා එක්ක කතා කරලා නෑ. මම කිවුවා ඒක නිසා ඒක සභාගත කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** ඒක සභාගත කරන එක ප්‍රශ්නයක් නැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** **:-** සභා වාර්තාවෙන් අයින් කරලා තියෙනවා ඒ ගියපු සංවාද. ඒ කියන්නේ ඒ කර්මාන්තය කරපු සමිතිය නිත්‍යානුකූල නැතුව අස් කරපු සමිතියක්. ඒ කර්මාන්තය කරපු එක ගැන සංවාදයක් ගියා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒක සම්පූර්ණයෙන්ම අයින් කරලා. විජේපාල මහත්තයාගේ කතාව නෙමෙයි අපි කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක සම්පූර්ණයෙන්ම යන්න ඕන ඊළඟ සභාවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඊළඟ සභාවට ඉදිරිපත් කරන්න. ඒකෙදි විජේපාල මන්ත්‍රීතුමා ගැන කතා කරපු ටික ඇරෙන්න ඉතුරු ටික ඉදිරිපත් කරන්න. තවත් සංශෝධන තියෙනවාද?.

<u>**2019 දෙසැම්බර් 17 වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාවෙන් ඉවත් කරන ලද කොටස සංශෝධනය**</u>

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, යෝජනා අවසන් වූ නිසා ඔබතුමාගෙන් දෙයක් දැන ගැනීම සඳහා අවස්ථාව ඉල්ලා සිටිනවා. මේක කෙනෙකුට මඩ ගහනවා නෙමෙයි. මටත් වාසනා මන්ත්‍රීතුමියටත් පොඩි ගැටළුවක් මතු වුණා ගිය සතිය ඇතුළත. ඒක නිරාකරණය කර ගැනීමක් කරන්නේ. සති දෙකකට කලින් සභාවට එනකොට සභාවේ නිලධාරි මහත්මයා මට ප්‍රකාශයක් කරා "අපරාදේ මන්ත්‍රීතුමා පාරවල් දෙකක් තියෙනවා ඔබතුමාගේ කොට්ඨාශයේ මුදල් ඇවිල්ලා. මේක අපරාදේ, නැවතත් ඒ මුදල් ආපස්සට යනවා. මේක කරන්නේ නැද්ද" කියලා. මම එතකොට කිවුවා සභාවේ මුදල් නෙමෙයි නේද කියලා. නෑ කිවුවා. ගම්පෙරළියෙන් ආව මුදල් කිවුවා. ඊට පස්සේ මේ මුදල් යොදවන්න කොන්ත්‍රාත්කරුවෙකුට කතා කරාම කිවුවා ඔය මුදල් විශ්වාස නෑ. ඒ නිසා කරන්න බැහැ කියලා. ඊට පස්සේ අළුත් කෙනෙක් සම්බන්ධ වුණාම එතුමා කිවුවා කමක් නෑ මම කරන්නම් කියලා. මම කිවුවා ගාමිණි මහත්තයා හමුවන්න. හමුවෙලා අවශ්‍ය කරුණු කාරණා කරගෙන මේ කොන්ත්‍රාත්තුව සිදු කරන්න කියලා. කාගේ වුණත් රජයේ සල්ලි. ගමට ඇවිල්ලා තියෙන සල්ලි. මොන නමකින් ආවත්, මොන පක්ෂයකින් ආවත් ගමට ආව සල්ලි මේ. ඒ නිසා මේ ව්‍යාපෘතිය කරන්න අවස්ථාව ලබා දුන්නා. ඒ වගේම වාසනා මන්ත්‍රීතුමියත් ඒ මුදල් යොදවලා පාරක් කරලා තියෙනවා. ව්‍යාපෘතියක් සිදු කරලා තියෙනවා. හැබැයි අවසානයේ පෙරේදා කොන්ත්‍රාත්කරු කතා කරා. බිල්පත අරගෙන ගියාම බංගලාවත්ත ග්‍රාමසංවර්ධන සමිතියේ නිලධාරීන් කවුරුවත් අත්සන් කරන්නේ නෑ කියලා කිවුවා. මම කිවුවා මට සම්බන්ධ වෙන්න බෑ කියලා. ඔබතුමා කොන්ත්‍රාත්කරු විදියට සම්බන්ධ වෙන්න කියලා මම කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ ගිවිසුම අත්සන් කරලද තිබුණේ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගිවිසුම් ඔක්කොම අත්සන් කරපු නිසා තමයි පාර කරන්න කිවුවේ බංගලාවත්ත ග්‍රාම සංවර්ධන සමිතියට. අනිත් අය කතා කරන්න එපා මගේ කතාව ඉවර වෙනකම්. මොකද මම කැමති නෑ එහෙම කතා කරනවාට. ඊළඟට මේ කරුණු කාරණා එක්ක සමිතියේ ලේකම්ට, සභාපතිට කතා කරාම පැහැදිලිව මන්ත්‍රීවරු දෙදෙනෙකුගේ නම් කියලා තිබුණා මේ අය විරුද්ධයි කියලා මේක අත්සන් කරනවාට. එතකොට මම කිවුවා ඇයිද කියලා අහන්න කියලා විරුද්ධ වෙන්න හේතුව. පාර හරියට කරලා නැද්ද. ඒ වගේ හේතු සාධක තියෙන්න ඕන. එහෙම නැත්නම් දින හරියට නැත්නම් ඒකට හේතු සාධක තියෙන්න ඕන. දින 28 ක් ගියාට පස්සේ තමයි මුදල් ගෙවන්නේ. ඒ කරුණු කාරණා පිළිවෙලට වෙන්න ඕන. කවදාවත් කොන්ත්‍රාත්කරු ගිහින් දැන් සල්ලි ඉල්ලන්නේ නෑ මම දන්න විදියට. ඊළඟට නම් වශයෙන් කිවුවලු මේ මන්ත්‍රීවරු විරුද්ධයි මේකට අත්සන් කරන්න එපා කිවුවා කියලා. ඉතිං ඇයි එහෙම තත්ත්වයක් මේ සමාජය තුළ වෙන්නේ. මන්ත්‍රීවරයෙක් විදියට ආවා නම් කාගේ හෝ සල්ලි වෙන්න පුළුවන්. මොන පක්ෂයේද කියලා වැඩක් නෑ. ගමටයි ඇවිල්ලා තියෙන්නේ. ඇයි පුද්ගලිකව විරුද්ධ වෙලා මේ බිල් අත්සන් කරන්න එපා කියන්නේ. ඒ කාරණාව මම මතුකරනවා. මම දන්නේ නෑ හේතුව මොකක්ද කියන්න. බොහෝ අය දන්න අය මේකේ ඉන්නේ. අපි අලුත් අය කියලා තමයි හැමෝම කියන්නේ. ප්‍රශ්නයක් නෑ මට දැනගන්න කියන්න ඇයි එහෙම අත්සන් කරන්න බැරි හේතුව කියලා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. ඇත්ත වශයෙන්ම චමින්ද මන්ත්‍රීතුමාගේ යෝජනාවට මම අදහස් ප්‍රකාශ කරන්න හිටියේ. ගරු සභාපතිතුමනි, නරිදූව මාර්ගයේ පළමු පටුමග සංවර්ධනය කරන්න මම බංගලාවත්ත ග්‍රාම සංවර්ධන යෝජනා කරලා ඒකත් ඔබතුමාට දුන්නා. ඒපාර අබේසේකර මන්ත්‍රීතුමාට එකක් ආවා. ඒ දෙකම අත්සන් කෙරුවේ බංගලාවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය. මේක කරගෙන යනකොට ආණ්ඩුව වෙනස් වුණා. ග්‍රාම සංවර්ධන සමිතිය ගියා වැඩ කරන්න නරිදූව මාර්ගයේ පළමු පටුමගේ. කොන්ත්‍රාත්කරු ගලුත් ගෙනැල්ලා බාලා, සේවකයෝ දාලා වැඩ කරනකොට කිවුවා මේකේ වැඩ කරන්න එපා කියලා. අපි තාර දාන්න තිබුණේ. මේකේ කාපට් දාන්න ඕන කිවුවා. ඔයගොල්ලෝ අර පාර කාපට් දාලා දුන්නා කිවුවා. මේකත් කාපට් දාලා දෙන්න ඒ නිසා මේක කරන්න එපා කිවුවා. කොන්ත්‍රාත්කරු ඒ ටිකත් පටවාගෙන ඒ සේවකයොත් එක්ක දවල් 11ට විතර ගියා. ගියාට පස්සේ මට

කිවුවා මේක කරන්න දෙන්නේ නැතෙයි කියලා. මම ඒපාර කිවුවා එහෙම නම් කරන්න දෙයක් නෑ කියලා. අපි වැඳ වැඳ ගිහිල්ලා රජයේ සල්ලි මේවා කරන්න ඕන නැහැ මිනිස්සුන්ට ගෙවල් ගානේ ගිහිල්ලා. මම නම් කොන්ත්‍රාත් කරන්නේ නැනේ. ගෙවල් ගානේ ගිහින් අනේ මට මේ කොන්ත්‍රාත් එක කරන්න දෙන්නෙයි. ඔයා ඉන්නෙයි, අරයා විරුද්ධයි කියලා මම කොන්ත්‍රාත් කරන්නේ නැහැ. ඒ නිසා මම ඒවලෙම කිවුවා ඔබතුමා මේවායෙන් අයින් වෙන්න ගිහින් දෙන්න කියලා. 2019-12-02 දින එහෙන් ලියුමක් භාරදුන්නා අපි ගිවිසුමෙන් අයින් වෙනවා කියලා. මේක කරන්න බැහැ මේ වගේ ප්‍රශ්න තියෙනවා, ඒ නිසා ගිවිසුමෙන් අයින් වෙනවා කියලා දුන්නා. ඊට පස්සේ පෙරේදත් මට කතා කරා එතුමා. මෙහෙම කරලා තියෙනවා කිවුවා. අඩුගානේ ඒ කොන්ත්‍රාත් එක ගනිපු සමිතිය දන්නේ නෑ කවුද කෙරුවේ කියලා. පුද්ගලායාවත් ඇහැට දැකලා නෑ. පෙරේදා ඒ වවුචර්පත් ගේනකම් අත්සන් කරන්න ඒ පුද්ගලයාවත් දැකලා නෑ. කවුරුද කරේ කියලාවත් දන්නේ නෑ. ඉතින් ඒ මිනිස්සු අත්සන් කරන්නේ කොහොමද. මේ සභාවට ගිවිසුමෙන් ඉල්ලා අස්වෙන්න නම් මොකක්ද සභාවේ නීතිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් මන්ත්‍රීතුමා, ඒ මිනිස්සු කියලා තියෙන්නේ වෙන කාරණාවක්නේ. ඒ කාරණාව නෙමෙයි කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒ මිනිස්සු කියපුවා, සමිතියේ සභාපති, ලේකම් කියපුවා රෙකෝඩින් කරා. ඒවා ඉදිරිපත් කරන්න පුළුවන්. මන්ත්‍රීවරු දෙන්නෙක් විරුද්ධ නිසා මේක අත්සන් කරන්න බැහැ කිවුවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඒක තමයි මම කිවුවේ ප්‍රසිද්ධියේ විරුද්ධයි. පොඩ්ඩක් ඉන්න. ඔබතුමා කොන්ත්‍රාත් කරාට මම කරන්නේ නැහැ. ඒ නිසා පොඩ්ඩක් ඉන්න. ඔබතුමා කොන්ත්‍රාත් කරාට මම කරන්නේ නැහැ. මම ඒක නිසා තමයි කිවුවේ. මම ප්‍රසිද්ධියේ කිවුවනේ. මම කිවුවා මේ ගිවිසුමෙන් අයින් වුණා කියලා. එයලා ගිවිසුමෙන් අයින් වුණා. අයින් වුණාට පස්සේ ගිවිසුම් වලින් පාර කරලා. මේ මිනිස්සු දන්නේ නෑ. මම කොන්ත්‍රාත් කරන්නේ නැහැ. මට එහෙම කොන්ත්‍රාත් කරන්න ඕන නැහැ ඒක නිසා. මෙතුමා දන්නවා මගේ හොඳ මිත්‍රයෙක් කියලා නන්දසිරි මහත්තයා. විනී කාරියවසම් මහත්තයා කියලා තමයි මම සැප්තැම්බර් මාසයේ මෙතනට ආපු ගිවිසුම දුන්නේ. විනී කාරියවසම් සභාපතිතුමා කිවුවට පස්සේ මම ගිවිසුම දුන්නේ. මෙතුමා දන්නවා. ළඟ තියන් හිටියා ගොඩක් කල් මේවා වෙවී ඉඳලා. කොහොම හරි ආණ්ඩු මේවා වෙලා කොන්ත්‍රාත් එක කරන්න ගියාම එක්කෙනෙක් විරුද්ධයි කිවුවා. විරුද්ධ වෙච්ච මිනිස්සුන්ට අපි රජයේ සල්ලිවලින් බොරුවට කරන්න ඕන නැහැනේ. විරුද්ධ නම් කරන්න ඕන නැහැ අපි. මිනිස්සු විරුද්ධ නම් කරන්න ඕන නැහැ. මිනිස්සු කැමති නම් ඕන ඒ සල්ලි වියදම් කරලා කරන්න ඕන. ඒ මිනිස්සුන්ට ඕනකම තිබුණේ අල්ලපු පාර කාපට් කරපු නිසා මේකත් කාපට් කරලා දෙන්න කියන ඉල්ලීම. මම හිතන්නේ ගුණසේකර මහත්තයා ඒක දාලා තිබුණේ සංවර්ධනය කිරීමට. තාර දාන්න, කොන්ක්‍රීට් දාන්න කියලා නෙමෙයි. මම කිවුවා මේකේ තාර දාන්න බැහැ කියලා හැමදාම යටවෙන ප්‍රදේශයක් නිසා. ඒ නිසා කොන්ක්‍රීට් දාන්න ඕන කියලා. මේක මිනිස්සුන්ට එපා නම් බලහත්කාරයෙන් කරන්න ඕන නැහැනේ. මම ගිවිසුමෙන් අයින් වුණා. මම නෙමෙයි ඒ කට්ටිය ගිවිසුමෙන් අයින් වුණා. දෙවෙනිදා ලියුමක් ගෙනත් දීලා ගිවිසුමෙන් අයින් වුණා. ඊට පස්සේ අර මිනිස්සු දන්නෙත් නෑ පාර හදලා. අඩුගානේ අපි එක්කවත් කතා කරන්න තිබුණා මෙන්න මෙහෙම මේ වැඩේ කරනවා කියලා. මේ ගිවිසුමෙන් බැරි නම් වෙන ගිවිසුමක් බලාත්මක කරන්න තිබුණා. මම කොන්ත්‍රාත් කරනවාට විරුද්ධ නැහැ. ඒ කොන්ත්‍රාත් එක කරන ක්‍රමවේදය ඔබතුමාලා අඩුගානේ කලින් කියන්න ඕන.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගිවිසුමෙන් අයින් වෙනවා කියලා ලිඛිතව මෙහෙට දන්වලා තියෙනවාද.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** සභාවට ලියුමක් ගෙනත් දුන්නා දෙවෙනිදා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එහෙම නම් සභාපතිතුමා ලිඛිතව දැන්නුවා කියලා කියනවා නම් ඒක නීත්‍යානුකූලව සාකච්ඡා කරා කියලා ලියුමක් ගෙනත් දීලා තිබුණා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** වෙන මොකක්ද කරන්නේ

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ඒ පාරේ ඒ ගෙවල් පහම අත්සන් කරලා මට දුන්නා ඒ පාර කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගෙවල් පහේ කතාව නෙමෙයි.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** පොඩ්ඩක් ඉන්න මන්ත්‍රීතුමිය.

**ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** දැන් ඔබතුමා කතා කරානේ. දැන් මටත් කතා කරන්න අවස්ථාව දෙන්න. සමිතියේ කට්ටිය අත්සන් කරන්න කැමති නම් ඔබතුමන්ලා දෙන්නට ඇති ප්‍රශ්නය මොකක්ද. සමිතියේ කට්ටිය අත්සන් කරන්න කැමතියි. ඔබතුමාලා තමයි එයාලට අත්සන් කරන්න එපා කියන්නේ. ඔබතුමන්ලාට එහෙම කතා කරන්න කිසිම අවශ්‍යතාවයක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කිසිසේත්ම මම නම් දැනුවත් නෑ පාර කරන්න එපා කිවුවා කියලා. මිනිස්සු එපා කිවුවා කියන එක ගැන මම දැනුවත් නෑ. මට කවුරුවත් කිවුවේ නෑ පාර කරන්න එපා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිට කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් අර පස්දෙනා අත්සන් කරලා දුන්නේ කොහොමද

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගලගාව දූව පාරටත් එක්ක තමයි දුන්නේ. දෙකටම දුන්නේ.

**ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ඔබතුමාලට කිසිම අයිතියක් නෑ මේකට කතා කරන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** මොකක්ද අයිතියක් නැත්තේ.

**ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ඔබතුමාලා එක්ක නෙමෙයි, සමිතිය එක්කයි මේක ඉවර කරගන්න තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සමිතිය ගිවිසුමෙන් ඉල්ලා අස්වුණා නම් කොහොමද කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙන්නේ අබේසේකර මන්ත්‍රීතුමා. සමිතියට කිසි ප්‍රශ්නයක් තිබුණේ නැහැ. මට වාසනා මන්ත්‍රීතුමිය දුරකථනය දුන්නම මම ඇහුවා මොකක්ද ප්‍රශ්නය කියලා. අහවල් අහවල් මන්ත්‍රීවරු දෙන්නා ඇවිත් බලපෑම් කරනවා කිවුවා මේක අත්සන් කරන්න එපා කියලා. මම වෙන මුකුත් දන්නේ නැහැ. ඔබතුමාලා කියලා තිබුණා මේක කැන්සල් වෙලා ගියා කියලා. මම කිවුවා මම වගකීමෙන් කියන්නේ කැන්සල් වුණේ නෑ කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නමුත් ඉල්ලා අස්කර ගත්තා මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතින් ඒ අය ඒ කතාව කිවුවේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා දැනගන්න. මාස ගාණක් ඕක තියාගෙන තිබුණා. දුන්නේ නෑ. එතුමා මට කිවුවා කරන්න බැහැ ඉල්ලා අස් වෙනවා කියලා. ගාමිණි මහත්තයාගෙන් ඉල්ලා අස්කර ගන්නවා කිවුවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඊට පස්සේ වෙන සමිතියක් දාලා කරා නම් හරි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉල්ලා අස්වීමේ ලියුමක් දීලා තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ගැටළුව සම්බන්ධව වැඩසටහන් සහකාර ගාමිණි හෙට්ටිආරච්චි මහතාට සභාව දැනුවත් කිරීම සඳහා මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී ගාමිණි හෙට්ටිආරච්චි මහතා පහත අදහස් දක්වා සිටින ලදි.

- ❖ ගලගාවදූව වත්ත පාර, පතිරගොඩ වත්ත පාර හා නරිදූව මාර්ගයේ පළමු පටුමග යන පාරවල් සංවර්ධනයට 2019-10-09 වන දින බංගලාවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය ගිවිසුම් අත්සන් කළ බව.

- ❖ 2019-12-02 දින මෙම ව්‍යාපෘති කිරීමට කෙනෙකු නැති බවට ලිපියකින් දැනුම් දුන් බව.

- ❖ අදාළ ව්‍යාපෘති ඉටු කිරීමට කෙනෙකු හමුවූවිට අමාත්‍යංශයෙන් පැමිණි ප්‍රතිපාදන බැවින් මෙම ගිවිසුමටම අදාල ව්‍යාපෘති සිදුකරන බවට එවිට සමිතිය දැනුවත් කළ බව.

- ❖ 20219-12-20 වන දින වන විට බිල්පත් අමාත්‍යංශය වෙත ලැබීමට සලස්වන ලෙස උපදෙස් ලැබී තිබුණ බව.

- ❖ අදාළ පාරවල් පිහිටි කොට්ඨාස දෙක නියෝජනය මන්ත්‍රීවරු දෙපළ වන වාසනා මන්ත්‍රීතුමිය හා චමින්ද මන්ත්‍රීතුමාව මේ සිද්ධිය පිළිබඳව දැනුවත් කළ බව.

- ❖ එම මන්ත්‍රීවරු දෙපළ දෙදෙනෙකු හොයාගෙන අදාළ සංවර්ධන ව්‍යාපෘති දෙක සිදුකළ බව.

- ❖ අදාළ ග්‍රාම සංවර්ධන සමිතිය කිසිමවිටක ගිවිසුමෙන් ඉවත් වී නැති බවත්, එවැනි සඳහනක් කිසිම තැනක නැති බව.

- ❖ මීට අමතරව මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව ඇති ගැටළු සාකච්ඡා කරන ලදි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීමට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතින් ඔය කාරණාවේදී මෙහෙමයි. මම සතියක් එක හමාරක් ඒ කාරණාවට ගත්තා මේක නීත්‍යානුකූලද නැද්ද කියන එක බලන්න. කරාට පස්සේ මුදල් ගෙවන්න ඕන නිසා. නැත්නම් ඒ මිනිස්සු අමාරුවේ වැටෙනවා මුදල් නොගෙව්වොත්. ඉතින් ඒකෙදී මම ඒ උපදෙස් දුන්නා. මේක හරවා යවන්න උත්සාහ කරේ නෑ. සියලු කර්මාන්ත ටික ඕන සමිතියක් දාලා අත්සන් කරන්න කිවුවා. මම බලපෑම් කරේ නෑ කොයි සමිතියද කියලා. අත්සන් කරපු ටික ඒ සමිතිවලින් කරන්නයි, අත්සන් නොකරපු ටික ඕන සමිතියක් දාලා අත්සන් කරන්න කිවුවා. ඕන කොන්ත්‍රාත් එකක් කැමති කෙනෙකුට දෙන්න කියලා තමයි ඕක ඉවර කරේ. මොකද ඉක්මනට ඉවර කරන්න ඕන. හැබැයි මම ස්තුතිවන්ත වෙනවා ඒ සමිතිවලටයි, ඒ කොන්ත්‍රාත් කරපු අයටයි. ඒ කර්මාන්ත සියල්ලම ඉවර කරා. ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මොකද නැවත ඒ ටික කරන්න වෙන්නේ සභාවේ අරමුදලින්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිට බාධා කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතින් අපි බාධා කරේ නැනේ අබේසේකර මන්ත්‍රීතුමා. කොයි වෙලාවකවත් කරන්න බාධා කරේ නැනේ. ඒකට බාධාවක් වුණේ, ඔබතුමාලාගේ සංවිධායකතුමා කිවුවා ඔබතුමාලාට දෙන්න එපා කියලා. ඒක බාධාවක් වුණා. ඒක අපි කියනවා. ඒක ඔබතුමා එහෙන් දැන ගන්න ඕන. ඒක ඔබතුමා බේරගෙන එන්න.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මෙහෙමයි අබේසේකර මන්ත්‍රීතුමා ඒක යසරත්න මන්ත්‍රීතුමාට අත්සන් කරන්න කිවුවා. මට ඒක කිව්වා හැබැයි. මම ඒ කර්මාන්ත කිසි එකකට බාධා කරේ නෑ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මම අනුන්ගේ කර්මාන්ත කරන්න යන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ඔබතුමා පිළිගන්න ඕන කාරණාවක් තියෙනවා. මම එකක්වත් නැවැත්වූවේ නෑ. මම ඔබතුමාට කිවුවා එතුමා යෝජනා කරපු ටික කරන්න කියලා.

(සභාව පැහැදිලි නොවීය.)

**2019 දෙසැම්බර් 17 වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාවෙන් ඉවත් කරන ලද කොටසේ සංශෝධනය අවසන් වේ.**

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම කතා කරපු ඡේදයක සඳහන් වෙනවා තුසිත චාමින්ද මන්ත්‍රීතුමා, බන්දුසේන වීරක්කොඩි මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරපු වෙලාවෙ. ඒ කතාව සංශෝධනය විය යුතුයි. ඒකේ මෙහෙම තියෙනවා. " මම

ගොඩක් සතුටු වෙනවා මට වෙන් වෙච්ච මුදලින් මේක කරගන්න බැරි වුණ එකට.'' ඒක එහෙම නෙමෙයි සඳහන් වෙන්න ඕන. කරගන්න බැරි වෙච්ච එකට සතුටු වෙනවා නෙමෙයි. එම අවස්ථාවේ මම කතා කරපු එක හරියට රෙකෝඩින් එක බලලා සංශෝධනය කරන්න. කරගන්න බැරි වුණාට සතුටු වෙනවා කියන එක නෙමෙයි මම නම් සඳහන් කරේ. ඒක නිසා ඒක සංශෝධනය කරලා දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** එතනදී එහෙම තමයි ඔබතුමිය කියන්නේ. ඔබතුමිය කියන්නේ එහෙමයි. එතකොට චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා අහනවා ඔබතුමියගෙන්, ඔබතුමිය සතුටු වෙන්නේ කරගන්න බැරි වුණ එකටද කියලා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ៖-** චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා කියපු දේ මේකේ සඳහන් වෙලා නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒක සඳහන් කරන්නම්. ඔබතුමියට ඒකනේ ඕන.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ៖-** එහෙම දාන්න බෑනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඔබතුමිය කියපු විදියට තමයි දැන් මේකේ සඳහන් වෙලා තියෙන්නේ. ඒක සංශෝධනය කරන්නම්. නමුත් ඔබතුමිය කියපු විදියට තමයි සටහන් වෙලා තියෙන්නේ.

2019-12-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ៖-** ගරු සභාපතිතුමනි, මම ඉස්සෙල්ලම අපේ ඩඩ්ලි විජේසිංහ මන්ත්‍රීතුමාට නිවාඩු අනුමත කරන්න කියන ඉල්ලීම කරනවා අසනීපයෙන් පසුවන නිසා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ៖-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ៖-** ගරු සභාපතිතුමනි, මේ සභා දෙකේ නීත්‍යානුකූල තත්ත්වය පිළිබඳව මම එදා කරුණු මතුකරා. මතුකරලා කිව්වා ඒ සභාව නීත්‍යානුකූල නෑ කියලා. මම ඒ ස්ථාවරයේ ඉන්නවා කියන එක මම සඳහන් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඔබතුමා ඉතිං කොහොමත් ඒ ස්ථාවරයේ තමයි හැමදාම ඉන්නේ. හැම සභාවක්ම නීත්‍යානුකූල නෑ කියන මට්ටමේ ඔබතුමා ඉන්නේ. ඉතිං ඒක පිළිබඳව ගැටලුවක් නෑ. අනිත් එක ඒ සභාව උපදෙස් අරගෙන කරේ. ඔබතුමා පුන පුනා කිව්වා. මට ඒකයි හිතට කණගාටු. ඉන්දික මන්ත්‍රීතුමත් පුන පුනා කිව්වා. මැතිවරණයක් තියෙනවා. මේ මැතිවරණය වෙලාවේ මේක ගේන්න එපා කියලා පුන පුනා කිව්වා. ඒක හින්දා තමයි මම මේක කල් දැම්මේ. උප සභාපතිතුමත් ඉල්ලීමක් කරා මේ කතාවේ යම් සාධාරණයක් තියෙනවා, ඒ හින්දා මේක කල් දාන්න කියලා. ඒක හින්දා තමයි මේක කල් දැම්මේ. කල් දැම්මම මැතිවරණය ඉවර වුණ ගමන්මත් මේක කරන්න බැහැ. ඔබතුමන්ලා ඒක දන්නවා. ඒක හින්දා තමයි අවසානයේ තිබ්බේ. ඒකෙදි ඔබතුමා ඔය මට්ටමින් හැසිරීම පිළිබඳව මම කණගාටු වෙනවා.

(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ៖-** ගරු සභාපතිතුමා, මම ඔබතුමාට කියන්නම්. මේකේ තියෙනවා. එදාට මේක තියන්න බැරිනම්, පහුවෙනවා නම් අඩාලව කල් තැබීමේ ක්‍රමයක් නීත්‍යානුකූලව තියෙනවා. ඒ අනුව කතා කරලා පැයකින් දෙකකින් කල් තියනවා මෙදාට තියෙනවා කියලා. මම කිව්වේ ඒකයි. වෙන දෙයක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඔබතුමාට එහෙම එන්න පුළුවන්. ඔබතුමාට වෙන විශේෂ වැඩක් නැති නිසා ඔබතුමාට එන්න පුළුවන්. නමුත් අනිත් රජයේ සේවකයෝ ඉන්නවා. අනිත් මන්ත්‍රීවරු ඉන්නවා. ඔබතුමා ඔය කතාවම කියනවා ඔබතුමාට ඡන්දය දවස්වල එන්න කිව්වා නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ៖-** දැන් ඔබතුමා ඇහුම්කන් දෙන්නේ නැනේ. දැන් ඇත්තටම මම මේ නිකං ඉන්නවා කියලා එකක් නෑ. අනිත් රජයේ සේවකයෝ ඕන කෙනෙකුට රාජකාරි නිවාඩු ගන්න පුළුවන්. එහෙම ප්‍රශ්නයක් නෑ. ඒක නෙමෙයි මම කියන්න ගියේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** පස්වෙනිදා කැඳෙව්වේ. එතකොට මෙතුමා කියන විදියට දින 14 ක් ඇතුළත නම් 19 වෙනිදා. ඡන්දය තිබුණේ 16 වෙනිදා. ඔන්න තත්ත්වය.

ඔන්න මේ අයගේ මානසික තත්ත්වය. අයවැය විශේෂ සභාව කැඳෙව්වේ පස්වෙනිදා. පස්වෙනිදා බැහැයි කිවුවේ ඡන්දය හින්දා. අවංකවම කතා කරමු අපි විවෘතව හැංගි හොරා ගේම් ගහන්නේ නැතුව. ඉන්දික මන්ත්‍රීතුමා ඡන්දය හින්දා නේද සභාව තියන්න බැහැ කිවුවේ. එතකොට දින 14 ක් කියන්නේ 19 වෙනිදා. එතකොට 19 වෙනිදාට කලින් කැඳෙව්වත් ඡන්දය තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සණ පූර්ණය නැති වුණොත් අඩාලව කල් තියන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම කරන්න තරම් මට පිස්සුවක් නෑ. මම කියන්නේ ඒක නීත්‍යානුකූලයි. ඔබතුමා ඕන දෙයක් කරන්න. ඔබතුමා ඉන්නේ අන්න ඒ වගේ ගේම් එහෙක. මම ඒ වචනය කියන්නේ නෑ. ඔබතුමා කියන එක ප්‍රායෝගික කතාවක් නෙමෙයිනේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්තට ඒ වෙලාවේ සියලු දෙනාම මැතිවරණයේ නියැලී ඉන්න මොහොතක්. අපි ඒ ඉල්ලීම කරා. සභාවේ ඉල්ලීමක් තිබුණා ඒක කරන්න කියලා. සභාපතිතුමා ඒ ඉල්ලීම උඩ සභාව කල් තිබ්බා. ඒකේ නීත්‍යානුකූලභාවය පිළිබඳ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් විමසලා තමයි ඒක නැවත සභාවේ ක්‍රියාත්මක කරේ. ඒක නීත්‍යානුකූල නෑ කියලා මේ ගරු සභාවේ නොකිය යුතුයි. එතුමා උපදෙස් අරගෙන තමයි ඒ කටයුත්ත කරේ. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ සභාවේ සම්මත වුණාම මගේ මතය තියෙන්න ඕන. අපි ඉල්ලලා තියෙනවා ඒක යාව්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එපා අබේසේකර මන්ත්‍රීතුමා. එහෙම කරන්න හොඳ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම මේ සියලු මන්ත්‍රීවරු දැන ගන්න ඕන. ඔබතුමාලට මම කොමසාරිස්තුමා එක්ක සාකච්ඡාවක් කැඳවලා දෙන්නම්. ගාල්ල දිස්ත්‍රික්කයේ තියෙන පළාත් පාලන ආයතන 20 න් පෙත්සම් ගහලා කුණු වෙච්ච, අජූතම සභාව තමයි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව. මේ අබේසේකර මන්ත්‍රීවරයාට බැනලා එළවලා තිබුණා පහුගිය දවසක. මට දුරකථනයෙන් දැනුම් දීලා කිවුවා. උස්සගෙන එනවා කිවුවා හැමදාම පෙත්සම්. ගාල්ල දිස්ත්‍රික්කයේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ පෙත්සම්වලට ඇහුම්කන් දෙනවට වැඩිය වැඩක් නැහැයි කිවුවා. ඒ තරම් බෝපෙ පෝද්දල කියන නම බින්දුවට දාලා තියෙන්නේ. එක සභාපතිවරයෙක්ට කරන්න දුන්නේ නෑ සභාවක්. එක සංවිධායකවරයෙක්ට කරන්න දුන්නේ නෑ දේශපාලනය. හැමදාම පෙත්සම්.

(ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගී වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** නමුත් සභාපතිතුමා මේ සභාවේ තමයි දූෂණ වෙච්ච තරමක් වෙලා තියෙන්නේ. අදටත් අපි පෙන්වන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පෙන්වන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කරුණාකරලා ගරු සභාපතිතුමා මේකට ඔබතුමා අහගෙන ඉඳලා ඕන උත්තරයක් ලබා දෙන්න.

මම බොහොම පැහැදිලිව කියනවා මේ කොමසාරිස්තුමා ඇවිල්ලා තාම වැඩි කාලයක් ගියේ නෑ. අපේ මන්ත්‍රීවරු අත්සන් කරලා ලියුමක් ගිහින් භාර දුන්නා ප්‍රශ්න කිහිපයක් පිළිබඳව. එතකොට කොමසාරිස්තුමාගේ දැනුම හා එයා කොහේද ඉන්නේ කියන එක තමයි අපිට ප්‍රශ්නය. මීට කලින් හිටියා කොමසාරිස්වරු තොග ගාණක්. දිලේඛා මැතිතුමිය හිටියා. මුහන්දිරම් මැතිතුමා හිටියා. රනිල් වික්‍රමසේකර මැතිතුමා හිටියා. මේ ඔක්කොම හිටියා. මේ සභාවේ ප්‍රශ්න ආවම ඒ ප්‍රශ්න ඉදිරිපත් කරාම අවශ්‍ය පරීක්ෂණ කරා. මේවා සඳහන් වෙන්න ඕන එක අකුරක් නැරැ. මේ කොමසාරිස්තුමාගේ දැනුම පිළිබඳව කියනවා නම්, "මට අයිතියක් නෑ මේ සභාවේ මේවා කරන්න. මේ සභාවේ විතරයි මේ ප්‍රශ්න තියෙන්නේ." කියලා තමයි කොමසාරිස්තුමා කිවුවේ. මෙච්චරකල් හිටපු කොමසාරිස්ලා මොකක්වත් කිවුවේ නෑ. එතුමාලා ඉතාම නිවැරදිව පරීක්ෂණ කරා. ඒ අත්සන් කරන කොට ඒ කාලේ මේ සභාපතිතුමා අත්සන් කරේ. දැන් මේ අවුරුදු දෙක නේ මේ තියෙන්නේ. ඊට ඉස්සෙල්ලා හැම එකක්ම අත්සන් කරා. ඒවාට දුන්නා හොඳ තීන්දු. තමුන්නාන්සේගේ අතේ තමයි දැන් හැන්ද තියෙන්නේ. හැබැයි ඒ තීන්දු එකක්වත් ක්‍රියාත්මක කරලා නෑ. ඒකයි තියෙන තදබලම වැරැද්ද. මේක තමයි තියෙන්නේ. මම බොහොම පැහැදිලිව මේ කොමසාරිස්තුමාට චෝදනා කරනවා. මට ඔබතුමා කිවුවා. එහෙම නම් ඔබතුමා එක්ක විශේෂ සම්බන්ධයක් ඇති. අනිත් සභාවල ප්‍රශ්න තියෙනවා

එන්නේ නැත්නම් ඒ සභාවල ඉන්න මන්ත්‍රීවරුන්ගේ දැනුම හා තේරුමේ තරම තමයි ඒ තියෙන්නේ. මේ සභාවේ කෙරිච්ච වැරදි වැඩ පිළිබඳව අපි දැක්කම හෙට දවසෙත් ඒක කරනවා. මේ සියලු දෙනා එක්කහු වෙන්නේ නැත්නම් තනිවම වුණත් ඒක කරන්න පුළුවන්. ඒක හෙට දවසෙත් මම ඉන්න කම් කරනවා. එතකොට වැඩේ තියෙන්නේ ඊට පස්සේ ඒ පරීක්ෂණය පටන් ගත්තා. ඊට පස්සේ විමර්ශන නිලධාරිතුමා බොහොම පැහැදිලිව කිවුවා අනේ මන්ත්‍රීතුමා ගණන් ගන්න එපා මෙහෙම මෙහෙමයි කියලා. මේකේ තියෙනවා මේ කොමසාරිස්ට මොකක් හරි ලොකු සම්බන්ධයක් මේ දූෂණ වහන්න. එක දිගටම මේක කරා. එතුමා කොහොමද බැහැයි කියන්නේ. මම එතුමාගෙන් ඉල්ලුවා තමුන්නාන්සේට මේ පරීක්ෂණය කරන්න බෑ කියලා මට ලිඛිතව දෙන්න කියලා. මට ලිඛිතව දුන්නේ නෑ. මම අද ඉල්ලනවා කරුණාකරලා මේ සභාවේදී ලිඛිතව දෙන්න. මේ කොමසාරිස්තුමා පනත හා එතුමාගේ වගකීම් දන්නේ නෑ. එහෙම නැත්නම් එතුමා පක්ෂග්‍රාහිව වැඩ කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඕක නෙමෙයි කිවුවේ. මම කිවුවේ ඕන පරීක්ෂණයක් කරන්න ඕන දේකට අපි විවෘතව මුහුණ දෙනවා කියලා. කිසි ගැටලුවක් නෑ. නමුත් දිගින් දිගටම එතුමාට බලපෑම් කරනවා. මේ හිටපු හැම කොමසාරිස්ටම බලපෑම් කරේ කවුද. ඒක කවුරුත් දන්නවා. හැම කෙනෙකුටම බලපෑම් කරමින් තර්ජනය කරමින් යන්නේ. මම කියන්න ගියේ මේක නෙමෙයි. මෙතුමා වැඩ කරන්න දීපු සභාපතිවරයා කවුද කියලා මට කියන්න. කාත් එක්කද මෙතුමා හොඳින් වැඩ කරේ. මෙතන අද නෑ අපේ වඩුඩ් මන්ත්‍රීතුමා. එතුමා ප්‍රසිද්ධියේ කිවුවා මෙතනට බුදු හාමුදුරුවෝ සභාපති වෙලා ආවත් මේ අබේසේකර මන්ත්‍රීතුමා වැඩ කරන්න දෙන්නේ නැහැ කියලා. ඒක බොහොම ප්‍රසිද්ධියේ කිවුවා පහුගිය සභාවල. මෙතුමාගේ නෝනා මෙතන හිටුවත් සභාපති විදියට එයාටත් මෙයා වැඩ කරන්න දෙන්නේ නෑ. මම ඒක දන්නවා. මම දැනගෙන තමයි මෙතන වැඩ කරේ. කොටින්ම කොට්ඨාශයක් ඉල්ලන්නේ නැතුව ලැයිස්තුවෙන් ඉල්ලලා මන්ත්‍රීධූරයක් දීපු තමන්ගේ සංවිධායකවරයාටත් මේ සභාවේ කතා කරපු විදිය බැලුවම අපිට කරන දේ මොකක්ද?. ඒක අමුතුවෙන් කියන්න දෙයක් නෑ. අපිට මේ කරන දේවල් ගැන අමුතුවෙන් කණගාටු වෙන්නේ නෑ. තමන්ව නිකම්ම ලැයිස්තුවට දාලා, මන්ත්‍රීධූරයකුත් දීලා තියෙනවා. ඉල්ලලා පරාද වෙච්ච අයට දෙන්න ඕන හරි නම්. ඒ අය තමන් මුහුණ දීලා ඡන්දයට යම් මනාප ප්‍රමාණයක් ගත්තා. එහෙම තියෙද්දි කෙලින්ම මන්ත්‍රීකමක් දීපු එතුමාට කතා කරපු විදිය බැලුවම අනිත් අයට කවර කතාද. මම අහන්නේ එච්චරයි මේ මන්ත්‍රීවරුන්ගෙන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට ඔබතුමා දිග චෝදනාවක් කරා. මට ඒකට උත්තර දෙන්න ඕන. දැන් කොමසාරිස්තුමාගේ ප්‍රශ්නයට මම උත්තර දුන්නා. කරුණාකරලා මම එතුමාගෙන් ඉල්ලුවා එදා මට ලිඛිතව දෙන්න කියලා මේ පරීක්ෂණය කරන්න බැරිනම්. නමුත් ඒ පරීක්ෂණය කරනවා. එදා කරන්න බැහැයි කියපු එක කරනවා.

දෙවැනි ප්‍රශ්නය තමයි ගරු සභාපතිතුමනි, ඉතාම පැහැදිලිව මේ සංවිධායකතුමා ගැන ඇහුවා. ඉතිං එකක් තියෙනවා මට නිකං දීපු පිං මන්ත්‍රී කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පිං කතාව කිවුවේ නෑ. ඒක ඕන නම් දා ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ සභාවේ ඉස්සෙල්ලා කිවුවා පිං මන්ත්‍රී කියලා. දැන් පිං නෙමෙයි. නිකං දීපු මන්ත්‍රීකම. හැබැයි අමතක කරන්න එපා මම ඉල්ලපු හැම සභාවකම, හිටපු හැම කෙනෙකුම පරාද කරන්න වැඩ කරාට මට මිනිස්සු ඡන්දය දීලා මම මෙතනට ඇවිල්ලා තියෙනවා. ඒ මම ඡන්දයෙන් ඇවිල්ලා තියෙන්නේ. අමතක කරන්න එපා මම තමුන්නාන්සේලා හිටපු තැනින් එළවලා ආවේ නෑ. චන්දිම වීරක්කොඩි හිටපු ඇමතිතුමා සාක්ෂි දරයි මොකක්ද කතාව කියලා. ඒක නෙමෙයි ප්‍රශ්නය තියෙන්නේ. ප්‍රශ්නය එතන නෙමෙයි ගරු සභාපතිතුමනි තියෙන්නේ. මේ පිං මන්ත්‍රීලා නම්, මේ පත්කරපු මන්ත්‍රීලා නම්, එහෙම නම් ඔය කියන විජේපාල හෙට්ටිආරච්චිවත්, කවුරුවත්, මේ පක්ෂය ගැන මම කතා කරන්නේ. එක්සත් ජාතික පක්ෂයවත් අනිත් ඒවා ගැනත් ඕන නම් කතා කරමු. ප්‍රශ්නයක් නෑ. එතකොට එහෙම නම් එකක් තියෙනවා වජිර අබේවර්ධන මැතිතුමා ඇරෙන්න අනිත් ඔක්කොම පිං මන්ත්‍රීවරු ගරු සභාපතිතුමා. දැන් තමුන්නාන්සේලාගෙත් කොච්චර තියෙනවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මේ කියන එක පැහැදිලි කර ගන්න. මම පිං මන්ත්‍රීවරු ගැන කිවුවේ නෑ. මම කිවුවේ ඔබතුමාට මන්ත්‍රීධූරය දීපු ඔබතුමාගේ සංවිධායකතුමා ගැන ඔබතුමා ඔහොම කතා කරනවා නම් අපි ගැන කවර කතාද කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා කතා කරන්න ඕන තැන කතා කරනවා. ඒක ගැන කතාවක් නෑ. ගරු සභාපතිතුමා මට පොඩ්ඩක් ඉඩ දෙන්න මේක කියන්න. එතකොට මම නිකම්ම ආපු, නිකම්ම දීපු මන්ත්‍රී නම් එතකොට එහෙම නම් එකක් තියෙනවා මේ ඉන්න මන්ත්‍රීවරු තව හතර පස් දෙනෙක් ඉන්නවානේ. මම අනිත් අයට කියන්නේ නෑ. එතුමා කියපු

නිසා කියන්නේ සංවිධායකතුමා ගැන. එතකොට සංවිධායකතුමත් එහෙමයි. ඒ විතරක් නෙමෙයි සමහර වෙලාවට මම දන්නේ නෑ එහෙම නීතියේ ප්‍රතිපාදන මුකුත් තියේද කියලා. මේ ඉන්න අපේ මන්ත්‍රී කණ්ඩායමේ කියාස් මන්ත්‍රීතුමා ඇරෙන්න අනිත් මන්ත්‍රීවරුන්ගේ අවසාන මහා සභා රැස්වීම තමයි මේ අපේ සංවිධායකතුමා කියපු විදියට. කියාස් මන්ත්‍රීතුමා ආසනයක් දිනලා ඇවිල්ලා තියෙන්නේ. දැන් දෙන්න හදනවා මාස හයෙන් හයට මන්ත්‍රීධුර. ඒ මොකද මැරුණට පස්සේ දාන්න ඕන අර හිටපු මන්ත්‍රී කියන කෑල්ල. දැන් ලේස්ති වෙනවා මාස හයෙන් හයට දෙන්න. මේක තමයි අපේ සංවිධායකතුමාගේ මොළේ තරම. එතකොට ගරු සභාපතිතුමා දන්නවා, ඊයේ පෙරේදා එවුවා ලයිට් වගයක් දාන්න. අනේ දෙයිහාමුදුරුවනේ කරුණාකරලා මේකට ඇහුම්කන් දෙන්න. ඔබතුමන්ලාට මේක වටිනවා. චනක මන්ත්‍රීතුමා ගෞරවයෙන් ඉල්ලන්නේ ඇහුම්කන් දෙන්න. මේක වටිනවා. දැන් බලන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දාලා තියෙනවා සභාවේ ලයිට් දාන්න. ලිස්ට් එකක් එවලා තියෙනවා සභාවට. හැබැයි ප්‍රේමලාල් අබේසේකර නෑ. ඉල්ලපු අපේක්ෂකයොත් ඉන්නවා. අපේක්ෂකතුමන්ලාත් ඉන්නවා. ඉතිං මෙන්න මේ තීරණය, පක්ෂයට කරපු දේ තමයි මේ තියෙන්නේ. පක්ෂයට කරපු දේවල් මම හිතන්නේ ඔබතුමන්ලාට අදාළ නෑ. අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට කියන්නේ අද පහලට වැටිච්ච තරම අනුව බල්බ් එක බෙදන්නත් එතුමා එවනවා ලැයිස්තුව එතුමාගේ අත්සන ගහලා මන්ත්‍රීවරු ඉන්දෙද්දි. දැන් අනේ කරුණාකරලා මන්ත්‍රීතුමා ඔබතුමාලා දැන් හිටියානේ. දැන්වත් කරුණාකරලා දෙන්න. වෙලාවක් නෑ. හේතුව තමයි තව මාස කිහිපයයිනේ තියෙන්නේ මේකේ. නැත්නම් ඉස්සෙල්ලා ගෙනාවා නම් මොන තරම් සාධාරණද ඔය චින්තනේ. ඕක තිබුණා නම් පැරදුණ අනිත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් අවස්ථාව දෙන්න තිබුණා නේ. ගරු මන්ත්‍රීවරුනි මම එතනින් නවත්වනවා. මම කියන්නේ මේ ප්‍රශ්නය ඔබතුමාලාට ආවේ නෑ. හේතුව ඔක්කොම කොට්ඨාශ ටික දිනපු නිසා. ආවා නම් ඒ එන මන්ත්‍රීවරුන්ටත් මේ ප්‍රශ්නය එනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** සභාපතිතුමා න්‍යාය පත්‍රයට අනුව සභාව කරගෙන යන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා මේ වෙලාවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්න කැමතියි අපේ සුගත් මන්ත්‍රීතුමා කිවුවා දූෂිතම සභාව මේක කියලා. එතුමත් අපේ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මම එක කාරණයකින් තමයි මේ වැඩේ පටන් ගත්තේ. ඊට පස්සේ අනිත් ඒවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියන්නකෝ බලන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මට හම්බ වෙනවා ප්‍රශ්නයක් මම පහුගිය දිනක යනකොට බබල්ලෑන්ඩ් කියන ඉඩමට. ඒ ඉඩම හරහා තිබුණ කාණුව වහලා දැන් තාප්පෙකුත් බැඳලා තියෙනවා. ඒ තාප්පය දැන් කඩාගෙන වැටිලා ඒ මිනිස්සු යටවෙන තත්ත්වයට පත් වෙලා තියෙනවා. නමුත් මේක ගැන නිශ්චිත තොරතුරක් නැති හින්දා මේ ප්ලෑන් එක ගත්තා. මේ ප්ලෑන් එක ගත්තම මම දකිනවා මේ ප්ලෑන් එකේ දැන් කැබලි 27 ක් තියෙනවා. ඒ කැබලි 27 න් ලොට් අංක 22,23,24,25,26,27,28,29,30 ඉඩම් කැබලි වල ජලය බැස යාම සඳහා කපා ඇති කාණුව නිසි පරිදි සකස් කිරීම හා අංක 13 හා 10 යන කැබලි ප්‍රාදේශීය සභාවට පවරා දීමේ කොන්දේසි වලට යටත්ව මෙම ඉඩම බෙදා දීම සඳහා සුදුසු බවට යෝජනා කරලා තියෙනවා ඒ වෙනකොට ඉඳපු සභාපතිතුමා හෝ කවුරුහරි. මම කියන්නේ එතකොට සභාවට තිබුණ ඉඩම් කැබලි දෙක තමයි මේ අංක 13 හා 10. අංක 13 හා 10 කැබලි අතරින් තමයි මේ කාණුව බැහැල යන්නේ. මේ ඉඩම් කැබලි දෙකත් අද වෙනකොට විකුණලා. මම ඒක නිසයි මේ සභාව දූෂිතයි කියලා කියන්නේ. අපි මුල ඉඳන් බලමු මොකද වෙලා තියෙන්නේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා චෝදනා කරේ මොන කාලේ එකක් ගැනද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** 2002

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට ඔබතුමා මේ සභාව දූෂිතයි කියන්නේ මොකක්ද. මේ සභාව කියන්නේ වර්තමාන සභාව. ඔබතුමා මාර කතාවක්නේ කියන්නේ. මම අනිත් මන්ත්‍රීවරුන්ගෙන් අහන්නේ. මේ සභාව දූෂිතයි කියලා කිවුවම අර්ථ දැක්වෙන්නේ මොකක්ද?.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක මෙහෙමයි. තොප්පිය දා ගන්න ඕන නම් තොප්පිය දා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තොප්පිය දා ගන්න නෙමෙයි මේ සභාව දූෂිතයි කිවුවම අදහස් වෙන්නේ මොකක්ද?.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඒකේ අදහස වෙන්නේ වර්තමානයේ භාවිතයේ පවතින සභාව. අදහස් වෙන්නේ ඒක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එතුමා කතා කරන කොට බොහොම පැහැදිලිව කිවුවා එක සභාවක්වත් කරන්න දුන්නේ නෑ කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එක සභාවක්වත් කරන්න දුන්නේ නෑ කියපු එකට උත්තරය මේ. මේ සභාවෙත් වේච් ඉස්සරහට. දැනට නෑ කියලා කියමුකෝ. මෙන්න අද මම මේක ඉදිරිපත් කරනවා. මේක සී. අයි. ඩී. එකට භාර දෙන්නකෝ. සි. අයි. ඩී. එකට භාර දීලා සභාවෙනුත් පරීක්ෂණයක් කරන්න. පරීක්ෂණයක් කරලා මේ පිළිබඳව අපිට වාර්තාවක් ලබා දෙන්න. එතකොට අපිට මේ වගේ ඒවා තව ගෙනල්ලා දේවි. මේවා නොකරපු හින්දා තමයි අද මේ සභාව මේ තත්ත්වයට පත් වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේවා දිගටම අපි කතා කරා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේවා දිගටම අපි කතා කරා. වෙන්දේසි ඉඩම් වල අපේ ඉඩම් කැබලි කෝ. අපිට පෙන්වන්න එන්න කිවුවා. නමුත් ඒවා හිටපු සභාපතිතුමා හෝ කවුරු හෝ විකුණගෙන තියෙනවා. මේවා මේ විදියට හොයා ගත්තොත් අපිට පුළුවන් මේ සභාවේ වෙච්ච ඊළඟ වැරදිත් හොයා ගන්න. මේක ගැන වහාම විධිමත් පරීක්ෂණයක් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට ඕන මෙච්චරයි. ජනමාධ්‍යවේදී මහත්වරුන්ට මම මේ කියන්නේ. මෙතුමාගේ අර්ථ දැක්වීම වෙන එකක්. ඒකයි මම එතුමාට අවස්ථාව ලබා දුන්නේ. එතුමා පටන් ගත්තේ මේ සභාව දූෂිතයි කියලා. එතුමා කියන්නේ 2002 වෙච්ච සිද්ධියක්. ඒක අනුව එතුමා අර්ථ දක්වන්නේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව මිසක් වර්තමාන සභාව නෙමෙයි. නැත්නම් ඒක ගැන වැරදි මතයක් යනවා, ජනමාධ්‍යවලට ගියාම සභාව දූෂිතයි කියලා සුගත් කලංසූරිය මන්ත්‍රීතුමා කියනවා කියලා. එතකොට අර්ථ දැක්වෙන්නේ වර්තමාන සභාව ගැන. අබේසේකර මන්ත්‍රීතුමා නම් ඒකට කැමති වෙයි. එතුමා අර්ථ දක්වන්නේ වෙන එකක්. ඔබතුමා එවෙලෙත් සුගත් මන්ත්‍රීතුමාට උපදෙස් දුන්නානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා බොහොම පැහැදිලිව කිවුවා එක සභාවක්වත් කරන්න දුන්නේ නැහැ කියලා. ඒකට තමයි ගරු සභාපතිතුමාට උත්තරය දුන්නේ. ඔබතුමත් අත්සන් කරලා දීපු ඒවාට කොමසාරිස්තුමා දීලා තියෙනවා තීන්දු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අත්සන් කරපු ඒවත් තියෙනවා නැති ඒවත් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නැති ඒවා නෑ. මම තියෙන ඒවා දැන් දෙන්නම්. මම ලියුම් 25 ක් සභාගත කරා. ඒ ලියුම් 25 තියෙනවා කොමසාරිස්වරු දීපු තීන්දු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි තියෙන ඒවා දෙන්නකෝ. මගේ ළඟ නම් නෑ. ඔබතුමාගේ ඒවා ඔක්කොම කියලා දෙන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොරු කියන්න ඕන නෑ. මේ මන්ත්‍රීවරු 22 ටම දුන්නා. දුන්නද නැද්ද කියලා කියන්න කවුරුහරි. මම ලියුම් 25 ක් සභාගත කරා ඔබතුමා අත්සන් කරපු ඒවා හා නැති ඒවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අත්සන් කරපු ඒවාට පරීක්ෂණ කරනවා නම් මම අද වුණත් එකඟයි. ඒවගේම මම අදත් කියන්නේ උප සභාපතිතුමාට විරුද්ධව අත්සන් කරේ නෑ. ඒවාට අත්සන් කරේ නැතේ අබේසේකර මන්ත්‍රීතුමා. ඒකට මම බැහැයි කිවුවනේ. මම නොකරපුවා තිබුණා. වැරදි දැකපු ඒවා අත්සන් කරා ඒක හරි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක එදත් වැරැද්දක්. අදත් වැරැද්දක්. මම කියන්නේ ඒක. ඒක වෙන කතාවක්. ඔබතුමා ඒක හැම තිස්සෙම ඒක අරගෙන උප සභාපතිතුමා මෙතන රඳවා ගන්න ඕන නිසා මේක කියනවා උප සභාපතිතුමාට මම වැරැද්දක් කරා වගේ. එතකොට ඒ එදා කරපු වැරැද්ද නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා එතුමාගේ රැකියාව නැති කරන්න උපරිම දේවල් කරේ. ඔබතුමා අධ්‍යාපන අමාත්‍යාංශයටත් ලිවුවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊකියාවේ කතාවයි මේකයි වෙනස්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඔබතුමා අධ්‍යාපන අමාත්‍යාංශයට ලිවුවේ නැද්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම අධ්‍යාපන අමාත්‍යාංශයට ලිවුවේ නෑ. මම ලිවුවා කොමසාරිස්ලට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ලිවුවේ නැද්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඔබතුමාට උත්තරය දුන්නේ නෑ කියලා. ඒක තමයි ඇත්ත. දුන්නා නම් පරීක්ෂණයක් කරන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පරීක්ෂණයක් කරානේ. ඉස්කෝලෙට ඇවිල්ලා කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම දන්නේ නෑ කරාද කියලා. මට දැන්නුවේ නෑ. මට දන්වන්න එපැයි පරීක්ෂණයක් කරා නම්.

(ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේක සම්බන්ධව මෙතනදී මේ වගේ දූෂිත දෙයක් සිදු වෙලා තියෙනවා නම් ඒක මොන අවුරුද්දේ සිදු වුණත් කමක් නෑ ඒක ගැන හොයන්න. මේක සභාවට ලැබිය යුතු වත්කමක්. ඉඩම් කැබලි දෙකක්. ඒ නිසා වහාම මේ සම්බන්ධව පරීක්ෂණයක් කරලා අදාළ ඉඩම් කැබලි දෙක අපේ සභාවට ලබා ගන්න අවශ්‍ය කටයුතු සලසා දෙන්න. ඒක හොයලා බලන්න. කොහොමද ගියේ, මොකක්ද කියන එක හොයලා බලන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** කවුද එතකොට මේ නායකත්වය දැරුවේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** නායක කතා නෑ. ඔබතුමා මේකට මෙතනදී පක්ෂ බලන්න එපා. මේක 2002 දී කරපු වැඩක් වුණාට 2006 දී දුන්නා වෙන්න පුළුවන්. එදා සභාවට දීපු එක තව අවුරුදු 06 කින් දුන්නද දන්නේ නැනේ. ඒක හොයන්න ඕන. කොහොම හරි මේක 2002 දී දෙනකොට දීලා තියෙන්නේ සභාවට කැබලි දෙකක් දෙන්න කියලා. 2002 දී මේක දෙනකොට දීලා තියෙන්නේ මේකෙන් කැබලි දෙකක් සභාවට පවරා ගෙන දෙන්න කියලා. මේක ගිහින් තියෙන්නේ ඊට පස්සේ. පස්සේ විකුණලා තියෙන්නේ. ඒක නිසා පරීක්ෂණයක් කරන්න. වහාම මේක ගැන සී. අයි. ඩී. එකට දැනුම් දෙන්න. වහාම මේ සම්බන්ධව හොයලා බලන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙම ඉඩමේ අංක 13 හා 10 ඉඩම් කැබලි දෙකේ ඉන්න අය දැන් ගමේ අයත් එක්ක ආරවුලකට ඇවිත් තියෙනවා. දැන් ඒ ගොල්ලෝ ජීවිත පවා අහිමි කර ගන්න තත්ත්වයකට පත් වෙලා තියෙනවා. මම දවසක් යනකොට විශාල රණ්ඩුවක්

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඒකට සභා යෝජනාවක් ගේන්න පරීක්ෂණයක් කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේක ගැන නෙමෙයි අපි සියලු ඉඩම් පිළිබඳව පරීක්ෂණයකට යමු. පහුගිය වකවාණුව තුළ සිද්ධ වෙච්ච සියලු වෙන්දේසි ඉඩම් පිළිබඳව පරීක්ෂණයකට යමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට එහෙම කරන්න බැනේ මන්ත්‍රීතුමා. හැම ඉඩමක් ගැනම පරීක්ෂණ කරන්න බැහැ. නිශ්චිත වශයෙන් තියෙන කාරණා වලට කරමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි වාර්තාවක් හදා ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොච්චර කියලා හදන්නද?. ඉඩම් වෙන්දේසි සීයකට වැඩි වෙන්න ඇති. මේකට තීන්දුවක් ගමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ යෝජනාව කරපු එක අපි කියන්නේ නිවැරදියි. ඔබතුමා දැන් මතුකරා මෙතනදි එහෙම එකක් කරන්න අපහසුතාවයක් තියෙනවා කියලා. බලප්‍රදේශය තුළ ජනාවාසකරණය වෙච්ච මේ බිම් ප්‍රමාණ පිළිබඳ අපි ළඟ තොරතුරු තියෙනවා. අපෙන් අවසර අරගෙනනේ කරලා තියෙන්නේ. එතකොට ඒ කරපු සියල්ලම අධ්‍යයනය කරලා සභාවට ඒ ඉඩම් කට්ටි පැවරෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ මන්ත්‍රීතුමා. වෙන ඒවා වැඩක් නැනේ. ප්‍රශ්න තියෙන ටික ඉදිරිපත් කරන්න. ඒ පිළිබඳව පරීක්ෂණයක් කරමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** හැම එකකින්ම සභාවට ඉඩම් කොටසක් පැවරෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ලබන සභාවට දෙන්න. නැත්නම් ලිඛිතව දෙන්න. මම ලබන සභාවේදී සභාගත කරන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟ සභාවේදී ඉඳීවිද දන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හිටියොත් දෙන්නකෝ. මම අවංකව කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ යෝජනාව සභාගත වෙනවා. ඒ යෝජනාව අපි ස්ථිර කරනවා සභාව සතු සියලු වත්කම් ටික තහවුරු කර ගන්න කියලා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** සභාපතිතුමා න්‍යාය පත්‍රයට ගියොත් හොඳයි. සභාව දිගින් දිගටම රැඳෙනවා වැඩියි.

**<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබ කවුරුත් දන්නවා ඇති කියලා හිතනවා. අපේ බෝපෙ පෝද්දල එක්රැස් කරන කසළ ටික අපි දැම්මේ රත්ගම මොන්රෝවියා වත්තට. නමුත් ඒ ප්‍රදේශවාසීන් කිහිපදෙනෙක් අධිකරණයට ගිහින් අධිකරණ තීන්දුවක් ලබාගෙන තියෙනවා කසළ බැහැරලීම වැළැක්වීම සඳහා. ඒකට අද දින කරුණු දැක්වීමට අපේ නීතිඥ මහත්තයෙක් යොදවලා තියෙනවා. දැනටත් අධිකරණයේ විභාග වෙමින් තියෙනවා ඒ කරුණු දැක්වීම. ඉතිං අපිට ඒ ගැටලුවට මුහුණ දෙන්න වර්තමානයේ දැන් සිදු වෙලා තියෙනවා. ඉතිං මම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා දැනට තාවකාලිකව කසල බැහැර කරන්න පුළුවන් ස්ථානයක් හොයලා දෙන්න. නමුත් අපි ස්ථිර විසඳුමකට යන්න ඕන. මම කලිනුත් කිවුවා. අපි මේ සතියේ බොහෝ විට අනුරාධපුරයේ යන්න බලාපොරොත්තු වෙනවා කසළ දාහක යන්ත්‍රය පිළිබඳ හොයලා බලලා ඒ යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව බලන්න. ඒ වගේම සිට්‍රස් වත්තෙන් අක්කර 05 ක භූමි ප්‍රමාණයේ තක්සේරු මුදල් ගෙවීමෙන් පසුව ලබා ගැනීමේ ප්‍රයත්නයක් අපි දරනවා ඊට සමගාමීව. ඔය කාරණා දෙක සඳහා දීර්ඝකාලීන විසඳුම් විදියට ඉදිරියට යන අතරේ අපි බලාපොරොත්තු වෙනවා තාවකාලිකව අපේ කසළ බැහැර කිරීමට සුදුසු ස්ථානයක් අපේ මන්ත්‍රීවරුන්ගේ මැදිහත් වීමෙන් අපිට හොයලා දෙන්න කියලා. ඒ ඉල්ලීම කරනවා. ඔබ සියලු දෙනාම දන්නවා බෝපෙ පෝද්දලට තියෙන ප්‍රධාන ගැටලුවක් තමයි කසළ ගැටලුව. ඒකේ අපිට තියෙන මූලිකම ප්‍රශ්නය තමයි ඉඩමක් නොමැතිවීම. ඒ කාරණා සම්පූර්ණ වෙනවා නම් අපිට කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහනකට යාමට පුළුවන් කියන එක තමයි මගේ හැඟීම. ඉතිං ඒ කාරණා සිද්ධ වෙන අතරේ තාවකාලික ඉඩමක අවශ්‍යතාවය තියෙනවා මේ කුණු කසළ බැහැර කරන්න. ඒකෙදි ඔබතුමන්ලාගේ මැදිහත්වීම මම මේ අවස්ථාවේදී අපේක්ෂා කරනවා.

**<u>(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ-</u>** නැත

**<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ-** නැත

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** අප ප්‍රාදේශීය සභාවට අයත් මාම්පිටිය සර්වෝදය පෙර පාසල තිබූ ස්ථානයේ හෙල බොජුන්හලක් සහා අරමුදලින් ඉදිකර වාර්ෂිකව ටෙන්ඩර් කර කුලියට දීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** ප්‍රධාන කාර්යාල භූමියේ ඇති ළමා උද්‍යානය නවීකරණය කිරීමටත්, අක්‍රියව ඇති ක්‍රීඩා උපකරණ සඳහා නවීන උපකරණ මිලදීගෙන සවිකිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන ගොඩක් ඒවා මලකඩ කාලා තියෙන්නේ. පොඩි ළමයෙක්ගේ ඔළුවත් වැදුණා ඔන්විල්ලාවක. ඉතිං ඒක නිසා තමයි මම ඒක යෝජනාවක් විදියට ගෙනාවේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** අප ප්‍රාදේශීය සභාවට අයත් SP RW 7129 අංක දරණ භාවිතයෙන් ඉවත් කර ඇති වතුර බවුසරයේ වැසිය සඳහා සුදු යකඩ ටැංකියක් සවිකර භාවිතයට ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර දැනට දිරලා තියෙන කොළ පාට ටැංකිය අයින් කරලා ඒ වෙනුවට සුදු යකඩ ටැංකියක් සවි කරන්න යෝජනා කරේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** මවුන්ට් ප්ලසන්ට් වත්ත ප්‍රධාන මාර්ගයේ කැඩීගොස් ඇති බෝක්කුව සඳහා පෙට්ටි බෝක්කුවක් යෙදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** පෝද්දල පොදු වෙළඳපොල කඩ කාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇති නව තක්සේරුව මත 2020 වර්ෂයේ ජනවාරි මස 01 දින සිට ඉදිරියට කඩ කාමර බදු මුදල් අයකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 33 හා 34 සඳහා කඩ කාමර බදු මුදල් නිසි පරිදි නොගෙවීම නිසා ගිවිසුම කඩවී ඇති බැවින් 2020-01-31 දිනට සියළු හිඟ බදු මුදල් ගෙවීමට කටයුතු නොකළහොත් 2020-02-01 දින සිට එම කඩ කාමර දෙක සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දිගින් දිගටම බැලුවා හරියන්නේ නැහැ. දෙන්නෙක් ඉන්නවා ගෙවන්නේම නැහැ. ඒ දෙන්නව මම මෙහෙට ගෙන්නලා අවසන් දැනුම් දීම කරාම ඒ දෙන්නා කිවුවා ජනවාරි 31 ට කලින් සම්පූර්ණ හිඟ මුදල ගෙවනවා කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ ව්‍යාපාර ස්ථාන මොනවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 33 හා 34 කඩ කාමර. එක්කෙනෙක්ගේ නම් කකුල කැඩිලා කියලා හිටියා. කොහොම හරි ඒ දෙන්නටම දැනුම් දීලා තියෙනවා මේ දිනයට කලින් ගෙවන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මුදල් තියාගෙන ගෙවන්නේ නැතුව ඉන්නවාද දන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 34 කඩ කාමරයේ සැලූන් එකක් තියෙන්නේ. ජයවීර මහත්තයා කරන්නේ. 33 කඩ කාමරයේ දොමෙනිකා රියදුරු පුහුණු පාසල තියෙන්නේ. කවුද කියන එක අපිට අදාළ නෑ. පොදු තීන්දුවක් ගමු මුහුණු නොබලා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇති 2018 වර්ෂයේ නව තක්සේරුවේ ඇති මාසික කඩකුලී අඩු කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඔය කඩ කාමර බදු අඩු කිරීම් අරවා මේවා සියලු දේවල් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් අරගෙන කරන්න. එතකොට අපි කවුරුත් බේරිලා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කඩකාමර බදු දීම සම්බන්ධව අවුරුදු කීයකට සැරයක්ද තක්සේරුව සිදු කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවුරුදු පහකට සැරයක්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එතකොට අපේ පහුගිය ආණ්ඩුවේ අවසාන සමයේ තමයි තක්සේරුව සිදු වුණේ. දැන් නැවතත් අපේ ආණ්ඩුව ආරම්භයේදීම තමයි මේ තක්සේරුව ඇවිල්ලා තියෙන්නේ. කඩහිමියන් කියන්නේ මේක අපි කරන දෙයක් කියලා. ඒ වැරදි මතය යනවා. ඒ හින්දා මේ කඩහිමියන් දැනුවත් කරන්න ඕන මේක නීත්‍යානුකූලව අවුරුදු පහෙන් පහට සිදුවන කාර්යයක් කියලා. අපිට ඒකට බලපෑම් කරන්න බෑ කියන්න තක්සේරු දෙපාර්තමේන්තුවට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පුළුවන්. ඔබතුමාලට නවත්වන්න පුළුවන්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එහෙම කොහොමද නවත්වන්නේ. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එන තක්සේරුව ක්‍රියාත්මක කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පහුගිය දවසක මම සාකච්ඡාවක් කැඳෙව්වා. එතනදී මම කිවුවා ඒක. ඒ අය පිළිගන්නවා ඒක. නමුත් දැන් මේකේ වැරැද්දක් වෙලා තියෙන්නේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන්. 2018 දෙන්න ඕන තක්සේරුව එන්නේ 2019 දෙසැම්බර් මාසයේ. එතන ඒ වැරැද්ද තියෙනවා. අවුරුදු දෙකකට පස්සේ තමයි තක්සේරුව අපිට දැනුම් දෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** කඩහිමියන් මේ පිළිබඳව දැනුවත් කරන්න. කඩහිමියන් වැරදි වැටහීමක ඉන්නවා. මේක දැන් දේශපාලනීකරණය වෙලා තියෙන්නේ. ඒකෙන් අපිට අවාසියක් සිදු වෙනවා. ඒක ගැන දැනුවත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇති 2018 වර්ෂයේ නව තක්සේරුව අනුව 2018 හා 2019 වර්ෂවල හිඟ කඩ කාමර බදු මුදල් පොත්වලින් කපා හැරීමට හා 2018 වර්ෂයේ නව තක්සේරුව අනුව වැඩි වූ මුදලින් භාගයක් පමණක් අයකිරීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අනුමැතිය ආවොත් විතරයි ඒක වෙනස් කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** තක්සේරු දෙපාර්තමේන්තුව හැල්ලුවට ලක් වෙනවා මේකෙන්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේ එක්කම වෙළඳ සංකීර්ණයේ අඩුපාඩු ටික ප්‍රකාශ කරන්නද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පසු අවස්ථාවක ගමු.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** 2020 - 2024 (ඉදිරි සිව් වසර තුල) ඉදිකළ යුතු අත්‍යාවශ්‍ය මගී ආවරණ ප්‍රමුඛතාකරණය කොට දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත දන්වා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙන් ඉල්ලලා තියෙනවා අපිට ඉදිරි අවුරුදු හතර තුළ කෙරෙන්න ඕන මගී ආවරණ පිළිබඳ විස්තර.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විශේෂයෙන්ම බද්දේගම පාරේ යනකොට පාර පළල් වීමේ ප්‍රවණතාවයක් තියෙනවා. ඒවා ගැන අවධානය යොමු කරලා ඕන මේවා හදන්න. නැත්නම් තේරුමක් වෙන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා අවශ්‍ය ස්ථාන ටික සියලු මන්ත්‍රීවරු ලිඛිතව ලබා දෙන්න. ස්ථානයේ නම් දුන්නට වැඩක් නෑ හදන්න ඉඩ තියෙනවාද කියලා බලලා දෙන්න. නැත්නම් නම් දුන්නට වැඩක් නෑ හදන්න බැරිනම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, රිචඩ් පතිරණ විද්‍යාලය ගාව පාර දෙපසම නෑ. ඒ නිසා පාසල් භූමියෙන් හරි ඉඩම අරගෙන දෙන්න පුළුවන් වේවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඒ යෝජනාව දෙන්න. මන්ත්‍රීවරු ඔක්කොම යෝජනා ටික දෙන්න මගී ආවරණ ඉදිකරන්න සුදුසු ස්ථාන පිළිබඳව.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 10.** තොටගොඩ, අඹගහවත්ත, මල්මාවත පත්තිනි දූව සිට කටුගහහේන දක්වා පුළුල් කර අවශ්‍ය ස්ථානයන්ට සිලින්ඩර් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 11.** කපුහෙම්පල කොට්ඨාශයට සවි කිරීම සඳහා වීදි පහන් කට්ටල 20ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 12.** කපුහෙම්පල පැරමවුන්ට් පාක් මාවතේ අවසන් කොටස කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 13.** අඹගහවත්ත, ලංසිගෙවත්ත මාර්ගයේ අවසන් කොටස කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 14.** කපුහෙම්පල, මිල්ලගහ, කනත්තවත්ත මාර්ගයේ මුල් කොටස කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 15.** කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ අවසතු කරන ලද ඉඩම නැවත රජයට පවරා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේක අවසතු කරපු එක නැවත පවරා ගන්නේ කාගෙන්ද? ඒ කියන්නේ හොරට ඉඩම ගනිපු එකාගෙන් තමයි පවර ගන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට ඒකට ගෙවන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක නිසා මේ වෙනුවෙන් ඇත්තටම රමේෂ් පතිරණ මැතිතුමා ලොකු මහන්සියක් ගන්නවා. අපි ඒකට සතුටු වෙනවා. නමුත් එතුමාට තෝරලා දෙන්න ඕන පවරා ගැනීමක් නෙමෙයි කරන්න ඕන කියලා. පවරා ගැනීමක් නම් මුදල් ගෙවන්න ඕන. එයාට අයිති එකක් නෙමෙයි පැහැදිලිවම. මේක පැහැදිලි කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා පැහැදිළි කරලා දෙන්නකෝ රමේෂ් පතිරණ ඇමතිතුමාට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට ඉතිං ගිහිල්ලා පැහැදිලි කරලා දෙන්න බැරි කමක් නෑනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මේ පැත්තට එන්න නම් ලේස්ති වෙන්න එපා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ යෝජනාව මෙතනට යැවුවොත් ඒක වෙනවා. ඒ නිසා මේ යෝජනාව සංශෝධනයක් එක්ක යවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නැවත පවරා ගන්නේ ගෙවීමකින් තොරව.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ අවසතු කරන ලද ඉඩම ගෙවීමකින් තොරව රජයට පවරා ගැනීමට යෝජනා කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට නිවැරදිම වචනය යොදන්න. අයිතිය තහවුරු කර ගන්න. රජයට අයිති ඉඩම. ඒකේ අයිතිය තහවුරු කර ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අයිතිය තහවුරු වෙලානේ තියෙන්නේ. අපි මෙහෙම දාමු. කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලය අවසතු කරන ලද ඉඩම නැවත ගෙවීමකින් තොරව රජයට පවරා ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අයිතිය තහවුරු කරගත්තම ඔක්කොම තියෙනවා මේකේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකත් එකතු කර ගන්න. අරකත් තියෙන්න ඕන. නැත්නම් යෝජනාවක් දාන එකේ තේරුමක් නෑනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අයිතිය තහවුරු කර ගන්න කියලා යෝජනා දැම්මම රජය ඒක දන්නවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අයිතිය තහවුරු කරගෙන මුදල් ගෙවීමකින් තොරව පවරා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අයිතිය තහවුරු කරන්න දෙයක් නෑනේ මේකේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකේ තාමත් අයිතිය තියෙන්නේ ඉස්කෝලෙට. නමුත් හොරට ඔප්පු ලියලා තියෙන්නේ. ඒ නිසා කරන්න තියෙන්නේ අයිතිය තහවුරු කරන එක.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලය සතු ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීම තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අයිතිය තහවුරු කරගෙන නීත්‍යානුකූලව ඉස්කෝලෙට භාර දුන්නම හරිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ යෝජනාවත් එක්ක ඒක එකතු කරලා දාන්න ඕන.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මම කියන්නේ මේ ඉඩම රජයේ ඉඩමක්. රජයේ ඉඩම තමයි හොර ඔප්පුවක් හදලා මේ අශෝක කුලරත්න කියන පුද්ගලයා මේක අවසතු කර ගන්න හැදුවේ, අයිතිකර ගන්න හැදුවේ, එයාගේ නමට ගන්න හැදුවේ. අපි කියන්නේ මේක රජයේ ඉඩමක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට එහෙම කියන්න බැනේ මන්ත්‍රීතුමා. අපි කොහොමද එහෙම කියන්නේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැම්මම ඒ අය දානවා නීතිපතිට. නීතිපති දෙනවා ඒපාර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේකට නඩු නිමිත්තක් නෑ කියලා. අපිට එහෙම වෙච්ච එකේ කියන්න බෑනේ හොර ඔප්පුවක් කියලා නීතිපතිට ගිය එක. එහෙම දාලා මේක මේවා කරගන්නවාට වැඩිය හොඳයි මේක අවසතු වෙලා තියෙනවා නම් නැවත ගෙවීමකින් තොරව රජයට පවරා ගන්න යෝජනා කරන එක.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, එතකොට මම අහන්නේ මෙහෙම. මේ ඉඩම බලන්න ගරු සභාපතිතුමා ප්‍රමුඛ සියලු මන්ත්‍රීවරු ගියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක රජයේ නම් මන්ත්‍රීතුමා අපිට කරන්න දෙයක් ඇත්තෙම නැනේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක තමයි අපි අහන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් උත්තර එවලා තිබුණානේ මන්ත්‍රීතුමා. අපරාධ පරීක්ෂණ එකෙන් නීතිපතිට දාලා තිබුණා. නීතිපතිට එහා අපිට කතාකරන්න බැහැ. නමුත් මේ දැනටත් අවංකවම මේක නවත්තගෙන හිටියට මේක දෙන්න වෙනවා. නොදී මම නවත්තගෙන ඉන්න මෙතන ගැටලුවක් තියෙන්න ඕන. අබේසේකර මන්ත්‍රීතුමා නීතිපතිට ගිහින් උත්තර ආවා කියන්නේ මෙතන අපිට ගැටලුවක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නීතිපති මෙතන හරියට පරීක්ෂණය කරලා නෑ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අපිට කියන්න තියෙන්නේ ඒක තමයි. ගරු සභාපතිතුමනි මම අහන්නේ දැන් මේ ඉඩමේ වෙච්ච හානියක් තියෙනවානේ. විශාල ගස් ප්‍රමාණයක් කපා ගෙන තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඒ ප්‍රශ්නය ඉවර කර ගන්න කලින් භූමිය බේරගන්න එපැයි අපි ගස් ගැන කතා කරන්න ඔක්කොටම කලින්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේක මේ රජයේ ඉස්කෝලය සතුව තිබුණ ඉඩම නේ. නීතිපතිතුමා මොන මතයේ ඉන්නවාද, එතුමාගේ දැනුම මොකක්ද කියන එක අපිට වැඩක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම මේ ලිපිගොනුව සම්පූර්ණයෙන්ම අධීක්ෂණය කරා. නීතිපතිතුමා දෙවරක් කියලා තියෙනවා. එකවරක් ප්‍රාදේශීය ලේකම් භුක්තිය නොදී ඉන්න කොට ප්‍රාදේශීය ලේකම්ට කිවුවා භුක්තිය දෙන්න, නැත්නම් ඔබතුමාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරනවා කියලා. දෙවැනි පාර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නීතිපතිට යවපු වෙලාවේ උත්තර ඉල්ලලා, මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න නැවත දෙවැනි වරට නීතිපති එවලා තියෙනවා මේකේ නඩු නිමිත්තක් නෑ පරීක්ෂා කරන්න කියලා. නීතිපති ඔය ඉඩම සම්බන්ධව මතය දෙපාරක් දීලා තියෙනවා. එතනදී අපිට කියන්න බෑ මේකට හොර ඔප්පු ලිවුවයි කියලා. එහෙම නම් මේකට නීතිපතිගේ තත්ත්වය මොකක්ද කියලා තේරෙන්නේ නෑ. ඒ නිසා අපිට මේ වෙලාවේ මම දකින්නේ සභාව විදියට කරන්න පුළුවන්, මේ ඉඩම අවසතු කරලා නම් නැවත වන්දි ගෙවීමකින් තොරව රජයට පවර ගන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේක බොහොම වගකීමෙන් කියනවා. මම, එතකොට විදුහල්පතිතුමා, උපුල් අතුකෝරල අපේ හිටපු මන්ත්‍රීතුමා අපි ගියා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට. සම්පූර්ණ ලිපි ටික ගෙනල්ලා බැලුවම ඉතාම පැහැදිලිව ඔප්පු වෙලා තියෙන්නේ. කිසි කතාවක් නෑ. නීතිපති එකට යවන්නේ වෙන දෙයක් හින්දා නෙමෙයි. නීතිපතිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හරි අල්ලස් හා දූෂණ විමර්ශන එකෙන් හරි යවන්නේ චෝදනාවකට යන්න නිමිත්තක් තියෙනවා නම් විතරයි. ඉතාම පැහැදිලිව නඩු නිමිත්තක් තියෙනවා. තියෙන නිසා තමයි යැවුවේ. එතනට ගියාම මේ මේ වගන්තිය යටතේ මේ මේ වරද කරලා තියෙනවා කියලා තමයි කියන්නේ. නැත්නම් නීතිපති ළඟට යවන්නේ නෑ. මීට අමතරව ගරු සභාපතිතුමා ඒ දිනයේම අපි ගිහිල්ලා බොහොම පැහැදිලිව අල්ලස් හා දූෂණ විමර්ශන එකේ පැමිණිල්ලක් දාලා අද වෙන කොට ඒ පරීක්ෂණ යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් දෙවරක් මම සභාපති වුණ ගමන් දීපු එක නැවැත්වුවා. සංවර්ධන බලපත්‍රය දීපු එක නැවැත්වුවා. නැවැත්වුවේ නඩුවක් පවත්වාගෙන යනවා මේ නඩුව අවසන් වෙනකම් කියලා. නමුත් ඒ නඩු දෙකම නිශ්ප්‍රභා වුණානේ. ඊට පස්සේ ඔබතුමන්ලයි අබේසේකර මන්ත්‍රීතුමයි ඉල්ලුවා මේක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලලා යවන්න කියලා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේ නඩුවේ වගඋත්තරකරුවන් විදියට නීතිපතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමා, අශෝක කුලරත්න මැතිතුමා ඒ සියලු දෙනා සම්බන්ධ කරලා තමයි මේ නඩුව ගොනු කරන්නේ. එහිදි නීතිපතිතුමාට විරුද්ධව දිසා අධිකරණයේ නඩුවක් අහන්න බැහැ. බැරි නිසා තමයි දිසා අධිකරණය මේ නඩුව ප්‍රතික්ෂේප කරලා කොළඹට දාන්නේ. අපි ඒක නැවත අභියාචනාධිකරණයට දානවා. අපිට මේ නඩුව අරගෙන කොළඹ යන්න බෑ මොකද, මේ ගමේ මිනිස්සු එක්ක එකතු වෙලා තමයි අපි නඩු කියන්නේ. ඒ පාර දෙවැනි පාර ප්‍රතික්ෂේප වෙන්නෙත් මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් මන්ත්‍රීතුමා කිසි තැනකින් මාව දැනුවත් වීමක් වෙන්නේ නැනේ. මම අසරණ වෙලානේ ඉන්නේ. ඒක පිළිගන්න ඕනනේ. ඒක පිළිගන්න එපැයි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. සභාපතිතුමා හැටියට ඔබතුමා මෙතනදී කෙලින් හිටියා. මේ යෝජනාව දාපු උප සභාපතිතුමාටත්, මෙතනදි මට එකක් කියන්න තියෙනවා. මේ ඉඩම සම්බන්ධව කතා කරලා කරලා මේ අන්තිම මොහොතේ තීන්දුව එනකොට දැන් හරි මෙතුමා මේ යෝජනාව දාපු එක ගැන මම සන්තෝෂ වෙනවා. කොට්ඨාශයේ වගකියන මන්ත්‍රීවරයා, උප සභාපතිවරයා දැන් ඇහැරිලා තියෙනවා මේ ඉල්ලීම කරන්න. මම සතුටු වෙනවා. මෙච්චර කාලයකට මම මේ සභාවට දාපු යෝජනා අරගෙන බලන්න. උප සභාපතිතුමාගේ මේ සම්බන්ධව වචනයක් තියේද බලන්න. හරි සතුටුයි මෙහෙම එනවා නම්. එන්නේ නැති එකයි ප්‍රශ්නය තියෙන්නේ. ඔබතුමාට ඇත්තටම ස්තුතිවන්ත වෙනවා ගරු සභාපතිතුමනි, මම ගමේ මිනිස්සුන්ට කියලා තියෙනවා මේක මෙච්චර දුරකට හරි නතර කර ගෙන හිටියේ සභාපතිතුමා කියන එක. ඒක මම පැහැදිලිව කියනවා. ඒ වගේම තමයි මම අහන්නේ මේ ඉඩම රජයට පවරා ගත්තට පස්සේ හරි මේ ඉඩමේ අහිමි වෙච්ච ගස් කොළන් වල වන්දිය ගන්න පුළුවන්ද, බැරිද කියන එකත් මම මෙතනදී අහනවා. මොකද විශාල ගස් ප්‍රමාණයක් මේකෙන් කපාගෙන ගිහිල්ලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මෙතුමාගේ යෝජනාව සංශෝධනවලට යටත්ව ස්ථිර කරන්න. ඒක බොහොම සාධාරණ යෝජනාවක්.

අසාධාරණ ලෙස අවසතු කරන ලද කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලය සතුව පැවති ඉඩම නැවත ගෙවීමකින් තොරව විද්‍යාලයට පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා මෙම යෝජනාව මම සංශෝධනය කරන ලෙස ගරු සභාවෙන් ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම සංශෝධනය මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි. ඒකට පළාත් පාලනයෙන් උපදෙස් ලබා ගන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ යෝජනාව ස්ථිර වුණානේ. අනිල් මන්ත්‍රීතුමා සතුටුයිනේ. හරි බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේකයි සභාපතිතුමා මේ ඉඩම සම්බන්ධව මට දැනගන්න තියෙන කාරණාව වන්නේ මේ ඉඩමට යම්කිසි නීතිඥවරයෙකු විසින් එන්තරවාසියක් සභාව වෙත එවලා තියෙනවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එන්තරවාසි දෙකක් මට එවලා තියෙනවා. එකක මිලියන සීයක් වන්දි ඉල්ලලා තියෙනවා. අනිකේ මිලියන දෙසීයක් වන්දි ඉල්ලලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එතකොට මෙම එන්තරවාසි සඳහා අපේ සභාව නමින් හෝ ඔබතුමා නමින් ප්‍රතිඋත්තරයක් සපයලා තියෙනවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රතිඋත්තරයක් කලින් එකට සපයලා තියෙනවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණය අවසන් වෙනකම් කියලා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මෙතනයි ප්‍රශ්නය තියෙන්නේ ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි මේ එන්තරවාසියක් යම්කිසි නීතිඥ මහත්තයෙක් විසින්, යම්කිසි විෂයකට අදාළව සභාවට හෝ සභාපතිතුමාට හෝ සිවිල් පුරවැසියෙකුට එවපු අවස්ථාවක අපිට ඒක නොසලකා හරින්න බැහැ. ඉස්සර එහෙම තත්ත්වයක් තිබුණා. දැන් ගරු අධිකරණය විසින් එම එන්තරවාසියට බැඳපු උත්තරය පිළිබඳව විශාල උනන්දුවක් දක්වනවා. ඉස්සර නීතියට වඩා දැන් නීතිය වෙනස්. ඒ නිසා එන්තරවාසියක් කියන එකේ තේරුම ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා කියන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඉස්සර නීතියට වඩා දැන් නීතිය වෙනස් කියන්නේ මොකක්ද?.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** පැහැදිලි කරන්නම් ගරු මන්ත්‍රීතුමා අහගන්න. ඉන්න මම උත්තරය දෙන්නම් පැහැදිලිවම. මතක හිටින්න උත්තරය දෙන්නම්. ඒක නිසා මගේ අවස්ථාව මට දෙන්න. මේක බරපතල කාරණයක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම ඇහුව ප්‍රශ්නය වන්නේ ඉස්සර නීතියට වඩා දැන් නීතියේ වෙනසක් තියෙනවාද?.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඔව් පැහැදිලිවම තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම දන්න තරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනයක් වුණේ නෑ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සංශෝධනයක් වුණේ නෑ. ඉස්සරට වඩා නීතිමය කරුණු ගණන් ගැනීම නීතියේදී වෙනස් වෙනවා. දැන් ඉස්සර තාක්ෂණික ක්‍රමවේදයන් නීතියට උපයෝගි කර ගත්තේ නැහැ. ඒවාට පනත වෙනස් වෙලා නැති වුණාට දැන් තාක්ෂණික ක්‍රමවේද නීතිය සලකා බලනවා. ඒ නිසා නීතිය කාලීනව යාවත්කාලීන වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** තාක්ෂණිකව කිවුවේ හඬ පටද?.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒක ඔබතුමා ඕන විදියකට හිතා ගන්න. ඒක නෙමෙයි අපේ ප්‍රශ්නය. ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. මේක අපි දකින්නේ ආයතනයක් හැටියට අපිට වගකීමක් තියෙනවා. ගරු සභාපතිතුමාට එම නිලයේ වගකීම තියෙනවා. ඒ නිසා අපි බැඳී ඉන්නවා ඒ ඒ කටයුතු වලදී නීතිමය තත්ත්වය යටතේ නීතියට වැඩ කරන්න. එතකොට එන්තරවාසියක් එවීම මගින් බලාපොරොත්තු වෙනවා දෙයක්.

එන්තරවාසියක් කියන්නේ යම් පාර්ශවයක් හෝ යම් පුද්ගලයෙකු විසින් කරනු ලබන වරදක් පිළිබඳව හෝ කිරීමට අපේක්ෂිත වරදක් පිළිබඳව අනෙකුත් පාර්ශවයක් නීති මගින් දැනුවත් කර ඔවුන් එම වරදින් වලක්වා ගැනීම හෝ නැතිනම් එම වරද තවදුරටත් සිදුකරමින් පවතින්නේ නම් ඒ සඳහා විරුද්ධ පාර්ශවය විසින් ගනු ලබන නීතිමය තත්ත්වයන් පිළිබඳ දැනුම් දීමේ ලියවිල්ල. ඒකට වන්දියක් ඉල්ලන්න පුළුවන්. නඩු ගාස්තු ඉල්ලන්නත් පුළුවන්. ඒ අයිතිය තියෙනවා. අපිට දැන් සභාවක් හැටියට මේ ඉඩම සම්බන්ධව එන්තරවාසි දෙකක් ලැබිලා තියෙනවා. එතකොට අපි වගකිව යුතු සභාවක් හැටියට මේ එන්තරවාසි එවුවම පිළිතුරක් යවන්නත් ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක මට පැහැදිලියි. එන්තරවාසියක් ආවා නම් සභාපතිතුමා උත්තර යවන්න ඕන. එන්තරවාසියක් කියන්නේ මන්ත්‍රීතුමා, නීතිඥවරයෙක් යවනවා අදාළ පුද්ගලයාට මෙහෙම දෙයක් තියෙනවා කියලා. එතුමා ඒකට උත්තරයක් යැව්වේ නැත්නම් නඩුවක් දානවා කියලා. නැත්නම් නිකං ඉන්නවා එයා. බොරුවට ඕනම නීතිඥයෙකුට එන්තරවාසියක් යවන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** නෑ. ඒක තමයි මෙතන තියෙන වැරදි මතය මන්ත්‍රීතුමා. ඒක තමයි මෙතන තියෙන වැරැද්ද.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපිටත් එවුවා අරලිය වත්තේ ඉඩමට ඉක්රම් මහතා එන්තරවාසියක්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අපේ ආයතනයට ආපු එන්තරවාසියට අපි උත්තරයක් යැවීමේ වරද මොකක්ද?. නැත්නම් නඩු කටයුත්තේදී අවාසියක් සිදු වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක කියන්න ඕන. අපි ඔය යටතේ දිගින් දිගට හිටියා. සභාපති වුණත් හිටියා, වෙන්න කලිනුත් හිටියා. මන්ත්‍රීවරයෙක් විදියටත් හිටියා. මන්ත්‍රීවරයෙක් වෙන්න කලිනුත් හිටියා. අපි ඔය සටනේ ඉන්නවා. මම පුද්ගලිකව විරුද්ධයි මේක අවසතු කිරීම පිළිබඳව. ඒක හින්දා තමයි සභාපති වෙච්ච ගමන් දීපු සංවර්ධන බලපත්‍රය නඩුව හින්දා අහෝසි කරේ. තාවකාලිකව අත්හිටෙව්වේ ඒක හින්දා. ඒ හිටපු මතය හින්දා. අදටත් මම ඒ මතයේ ඉන්නේ. නමුත් චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා කියපු කාරණයේ සාධාරණයක් තියෙනවා. මොකද පළවෙනි එන්තරවාසිය එවුවා මම මේක හිතාමතා ද්වේශ සහගත විදියට නවත්තගෙන ඉන්නවා කියලා. ඒකට මම උත්තරයක් යැව්වා, නෑ එහෙම නෙමෙයි. ද්වේශ සහගත විදියට නෙමෙයි මේක දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරලා තියෙනවා ඒකේ උත්තර ආවට පස්සේ සලකා බලනවා කියලා පිළිතුරක් ඇරියා. ඊට පස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වර්තමානයේ උත්තරයක් ඇවිල්ලා තියෙනවා මේක නීතිපතිට යොමු කරයි නඩු නිමිත්තක් නෑ කියලා. නැවත ඇවිල්ලා තියෙන්නේ මේක. නමුත් ඊට පස්සේ දොළොස්වන මාසයේ නැවත එන්තරවාසියක් එවුවා මිලියන දෙසීයක් ඉල්ලලා. නමුත් මම අදටත් ඉන්නේ මේක අවසතු නොවිය යුතුයි කියන මතයේ. ඉතිං මට වගකීමක් තියෙනවා මහාධිකරණයටත් වැඩිය මහජනතාව වෙනුවෙන්. අනිත් එක මේ සභාව වෙනුවෙන් මට වගකීමක් තියෙනවා. ඒක දෙවැනි කාරණය. ඉතිං ඒක හින්දා තමයි අද මේ සභාවට යෝජනාවක් ඉදිරිපත් වෙන්නේ මේක අවසතු කරලා තියෙනවා නම් නැවත පවර ගන්න මට ආවරණයක් විදියට. මේක මට ආවරණයක් විදියට ඉදිරිපත් කර ගත්තේ. මේකට පළාත් පාලන කොමසාරිස්තුමාගේ මතය විමසන්න වෙනවා. අපිට දිගින් දිගටම මේක වලක්වන්න පුළුවන්ද, බැරිද කියන මට්ටමේ දැන් තියෙන්නේ. නඩුවක් දැම්මා නම් ඒක ඉක්මනට එවන්න කරුණාකරලා මට මේ අහවල් අංක දරණ නඩුවක් මේකට යනවා කියලා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මට එවලා නෑ මේකට පරීක්ෂණයක් කරනවා කියලා අබේසේකර මන්ත්‍රීතුමා. මොන දේ කරත්, සභාව විදියට අපිට ලිඛිතව එවන්න. අපිටත් ඕන මේක නොදී ඉන්න. බොරු කියන්න ඕන නැතේ. ඇත්ත කතාව ඒක. නොදී ඉන්න බලන්නේ. ඒකට තමයි අපි මේ හොයාගෙන යන්නේ. මම වගකීමෙන් කියනවා මේක අපි පුළුවන් තරම් කල් නවත්තගෙන ඉන්නවා. නමුත් මේකත් කියන්න ඕන. වැරදි විදියකින් හරි මේකේ නඩුවක් දාලා වැරදිකරුවෝ වුණොත් මට පුද්ගලිකව නෙමෙයි මේක සභාවක් විදියට අපි කාටත් එනවා. සභා අරමුදලින් තමයි මේ වගකීම යන්නේ. ඒකත් කියන්න ඕන. විශේෂයෙන්ම මේ කටයුත්තේදී ඒ වගකීම යන්නේ සභා අරමුදලට. මම ඒක යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට මේක පුද්ගලිකව ගෙවන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකෙන් ඔබතුමාට තියෙන වාසියත් කියන්න ඕන. එන්තරවාසිවලට උත්තර යවන්නත් පුළුවන්, නොයවා ඉන්නත් පුලුවන්. ඒක වෙනයි. මේ ඇරෙන්න මේ නීතිය පැත්තෙනුත් තියෙනවා. අණ දෙන විශාලම තැන තියෙන්නේ ත්‍රිවිධ හමුදාවනේ. ඒ දෙන අණක පවා අණ නොතකා ඉදීමේ අයිතියක් තියෙනවා. හැබැයි සාධාරණ හේතුවක් උඩ. ඒ කියන්නේ හොඳ හැඟීමෙන්. ඒ නිසා මුළු සභාවම එකඟයි මේ සිද්ධියට පමණක් අපි ඉතාම පැහැදිලිව ඉන්නවා. ඔබතුමා කෙලින් ඉන්න. ඉස්සරහ සතියේදී අපි ගේන්නම් අල්ලස් හා දූෂණ කොමිසමේ යන එක. අභියාචනයක් දානවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට. අපරාධ පරීක්ෂණ එකෙන් නිලධාරීන් ගෙන්වලා සම්පූර්ණයෙන්ම බලලා නඩුවක් තියෙනවා නම් විතරයි යවන්නේ. නඩුවක් නැත්නම් එතනින් පැත්තකට දානවා. ඒ හින්දා නීතිපතිතුමා දරුණු ගණයේ වැරැද්දක් කරලා තියෙනවා මෙතන. මේවා සඳහන් කරාට ප්‍රශ්නයක් නෑ. ඉතාම දරුණු ගණයේ වැරැද්දක් මේක. මම දකින්නේ මේ රටේ දැන් ජනාධිපති ඉන්නේ අලුත්ම කෙනෙක් හින්දා අපිට මුකුත්ම කියන්න යන්න බැහැ. නමුත් එකක් තියෙනවා මේ රටේ හිටපු ජනාධිපති ඕන කෙනෙකුට සුදුසු මිනිහෙක් මේ කුලරත්න කියන මිනිහා. අල්ලන්න බැරි, අල්ලපු නැති එක්කෙනෙක් නැහැ. හැම එක්කෙනාවම ගිහිල්ලා ඇල්ලුවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා මේ කපුහෙම්පල ඉඩම සම්බන්ධව ක්‍රියාකිරීම පිළිබඳව අපිට පැහැදිළියි. ඒකට අපි සතුටට පත්වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක ඇත්ත.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේ කටයුතු දිගින් දිගටම අපිට අවාසනාවකට යන්න වුණොත්, දිගින් දිගට තව ඉදිරියට යන්න වුණොත් අපිට ආපු දෙවැනි එන්තරවාසියටත් ඔබතුමා

පළවෙනි එකට වගේ දැන් තත්ත්වයත් එක්ක පිළිතුරක් බඳින්න කියලා අපි ඉල්ලා සිටිනවා. ඒක අපිට කොයි වෙලේ හරි වාසියක් වෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විශේෂ අවසරයක් ලබා දෙනවා අබේසේකර මන්ත්‍රීතුමාට අත්‍යවශ්‍ය කටයුත්තකට යාමට තිබෙන නිසා එතුමාගේ යෝජනා ටික දැන් ඉදිරිපත් කරන්න.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 53.** 2019 ජනවාරි සිට 2019 දෙසැම්බර් දක්වා අනවසර ඉදිකිරීම්, අනවසර ගොඩකිරීම් සහ අනතුරුදායක ගස් සම්බන්ධව විස්තරාත්මක වාර්තාවක් සභාගත කිරීමට කටයුතු කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ යෝජනාවට අමතරව මම ඔබතුමාට සඳහන් කරනවා විශේෂ සභාවකට දිනයක් ඔබතුමාම යොදාගෙන විශේෂ සභාවක් කැඳවන්න. මේක තමයි සභාවක තියෙන වැඩ කටයුතු තියෙන්නේ. මේක මම ඔබතුමාගෙන් දිගින් දිගටමත් ඉල්ලලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 54.** තාක්ෂණ නිලධාරීන් වෙත වෙන්කර දී ඇති බල ප්‍රදේශය තුළ සියලු රාජකාරී ( විශේෂයෙන් ඉදිකිරීම්, කර්මාන්ත, වෙන්දේසි ඉඩම් සම්බන්ධ සියලු වගකීම්) අදාල තාක්ෂණ නිලධාරියා වෙත පැවරිය යුතු යැයි යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් එහෙම තමයි භාර දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම වෙනවා නම් කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම තමයි භාර දීලා තියෙන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 16.** දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සතු ගොඩකන්ද කරාපිටිය මාර්ගය කඩිනමින් කාපට් යොදා සංවර්ධනය කර දෙන මෙන් අති ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් ඉල්ලා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ මාර්ගය බද්දේගම, ඇල්පිටිය, කරන්දෙණිය, ගෝනපීනුවල වැනි ප්‍රදේශවල විශාල ජනතාවක් කරාපිටිය රෝහලට ලඟා වෙන කෙටිම මාර්ගය. දැන් අවුරුදු දෙකක කාලයක සිට මේ මාර්ගය අබලන්. මේ මාර්ගය කාපට් කරලා හරි, යන්න පුළුවන් මට්ටමකට හරි හදලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකේ බෝඩ් එකක් ගහලා තිබුණා මතකයි මට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ః-** රන් මාවත, අන්තිමට ඒක ගලවාගෙන ගිහින් තියෙනවා. බෝඩ් එකත් නෑ. ඒ නිසා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙනුත් අපි ඉල්ලීමක් කරා. හැබැයි මේ මාර්ගය කෙරුණේ නෑ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ః-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ දැන් පාරේ වාහන යාමට නොහැකි තත්ත්වයටම අබලන් වෙලා තියෙනවා. ලොකු වලවල් තියෙනවා. මම හිතන්නේ ඒක කඩිනමින් සිදු කරොත් හොඳයි කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ః-** ගරු සභාපතිතුමනි,මේ යෝජනාව සම්බන්ධයෙන් අහන්නේ. මේ මාර්ගය සභාවටද අයිති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයිති.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ః-** ප්‍රශ්නය තියෙන්නේ මෙතුමා මේක ජනාධිපතිතුමාට දන්වා යැවීමට යෝජනා කරන්නේ මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවාද?. ඇයි ඒක පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කරවන්නේ නැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** පිටපතක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ః-** දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් මේ සභාව ඉල්ලීමක් කරා. දේශපාලන නායකත්වයක් මෙතනට ඇවිත් උත්සවයක් තියලා බෝඩ් එකක් ගහලා අන්තිමට බෝඩ් එකත් ගලවා ගෙන ගියා. ගෝඨාභය රාජපක්ෂ කියන්නේ අපි විශ්වාසයෙන් පත්කරපු නායකයා. ඒක හින්දා අපි එතුමාගෙන් ඉල්ලීම කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ః-** පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයිති පාරකට ඇයි මෙහෙම කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** ළඟදී තවත් පාරවල් කිහිපයක් කාපට් වෙන්න නියමිතයි. එතනදී මේකට ප්‍රමුඛතාවය දෙන්න තමයි මෙතුමාගේ ඉල්ලීම තියෙන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ః- 17.** කරාපිටියේ ඉදිකෙරෙමින් පවතින මාතෘ රෝහල අවට සිට බෝගහවේල්ල දක්වා ජලය බැසයන කාණුව එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදාගෙන පිරිසිදු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ః-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

එතන පොඩි ගැටළුවක් තියෙනවා මන්ත්‍රීතුමා. එක්ස්කැවේටර් යන්ත්‍රය මගින් අර බෝගහවේල්ලේ කාණුව සුද්ධ පවිත්‍ර කිරීමේදී කාණු පද්ධතිය අවට තියෙන පස් කණ්ඩිය කඩාගෙන වැටුණා එක්ස්කැවේටර් යන්ත්‍රය යාම නිසා. මම හිතන්නේ ඒක හින්දා අපි කලින් කතා කර ගත්තා වගේ එතන කාණු පද්ධතිය සකස් කර ගන්න පුළුවන් නම් ගල් වැටියක් යොදලා ගොඩක් හොඳයි. මම සභාපතිතුමාටත් යොමු කරා ගල්කැටිය වත්ත මාර්ගයේ කාණු පද්ධතිය සකස් කරන්න කියලා. මොකද දැනට පාර ගිලා බහිනවා සමහර තැන් වලින්. ඒ හින්දා ඒක කඩිනම් කරන්න කියලා මම යෝජනා කරනවා. ඒක කඩිනමින් කර ගත්තොත් හොඳයි සභාපතිතුමා. දැනටම ගොඩක් තැන්වලින් ගිලා බැහැලා කාණු පද්ධතියටම ගිහිල්ලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ః- 18.** ගොඩකන්ද, මැද පාර ( කජ්ජුගහවත්ත මාර්ගය ) දෙපස අදාළ හිමියන්ට මාර්ගයට අවහිර ගස් ඉවත් කර ගන්නා ලෙස දැනුම් දෙන්නටත්, එසේ ඔවුන් ඉවත් නොකරන්නේ නම් සභාව සතු බලතල යොදා ගස් ඉවත්කර නීතිය ක්‍රියාත්මක කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ః-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේක දීර්ඝකාලීනව එන ගැටළුවක්. දැන් විශාල ගස් ප්‍රමාණයක් වැවිලා තියෙනවා. එක පැත්තකින් පාර්ලිමේන්තු මන්ත්‍රී වජිර අබේවර්ධන මැතිතුමාගේ ඉඩම තියෙන්නේ. අනෙක් පැත්තෙන් සොම්පාල ඉලේපෙරුම මහතාගේ ඉඩම තියෙන්නේ. දෙපැත්තෙන්ම ගස් තියෙනවා. කවුරුවත් කපන්න යන්නේ නෑ. ඒකයි සභාවට යෝජනා කරේ නීතිය ක්‍රියාත්මක කරන්න. අපි මුලින් මේ පාර්ශවයන්ට දැනුම් දෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට මේ පාර්ශවයන් දෙකේ ලිපිනයන් ලබා දෙන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** දැන්ම ලියා ගත්තා නම් හරි. සොම්පාල ඉලේපෙරුම මයා, කජ්ජුගස් මාවත, අම්බලන්දූව වත්ත, ගොඩකන්ද, ගාල්ල.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනෙක් පාර්ශවය කවුද?.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අනෙක් පාර්ශවය වජිර මහත්තයාගේ එක. අපි ඒක බලමු. එක මායිමනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දානවා නම් මායිම් දෙකටම දාන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** වජිර අබේවර්ධන මැතිතුමාටත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමාගේ නමටද තියෙන්නේ ඉඩම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒක තමයි හරියට දන්නේ නැත්තේ. මේක නම් සොම්පාල ඉලේපෙරුම මහතාගේ. මම කියනවා මේක ඉල්ලීම හැටියට දාන්න. විශාල වශයෙන් තියෙන්නේ උඩ ටිකේ ගස් ටිකනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පරීක්ෂා කරලා වාර්තාවක් දෙන්න. ඒකේ පිටපත ලියනගේ මන්ත්‍රීතුමාට දාන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** නෑ ගැටලුවක් නෑ. මම යනවා කපන තැනට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 19.** ගොඩකන්ද ඔබවත්ත මාර්ගය සභාවේ බැකෝ යන්ත්‍රය යොදවා ගමන් කළ හැකි ආකාරයට සකසාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 20.** වැඩිහිටි දීමනාව ලබාදීමේදී 2019 නොවැම්බර් මස නිකුත් කරන ලද නව චක්‍රලේඛය අහෝසි කිරීමටත්, රු.1,900.00 ක් කරන ලද එම දීමනාව රු.2,000.00 ක දීමනාවක් කිරීම වෙනුවෙන් මුදල් වෙන් කරන ලෙස ගරු මුදල් අමාත්‍යවරයාටත්, අතිගරු ජනාධිපතිතුමාටත් දන්වා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** පහුගිය වකවාණුව තුළ ගම්වල සිටින වැඩිහිටියන්ට රුපියල් 2000 ක දීමනාවක් දුන්නා. 2015 න් පසුව ඒක 1900 ක් කරලා තියෙනවා. ඒ දෙන මුදලින් රුපියල් 100 ක් කපා ගත්තා. ඊට අමතරව දැන් ගම්වල සමහර දෙමව්පියන් ඉන්නවා රජයේ රැකියා කරන ළමයි ඉන්න. හැබැයි මේ ළමයි තමන්ගේ දෙමව්පියන් ගැන බලන්නේවත් නෑ. සමහර ළමයි ඉන්නේ අනුරාධපුරයේ, පොළොන්නරුවේ. අම්මලා, තාත්තලා මෙහේ ඉන්නේ. මේ චක්‍රලේඛය හරහා සිදු වෙලා තියෙන්නේ රජයේ රැකියාවක් කරන එක ළමයෙකු හරි පවුලේ ඉන්නවා නම් මේක දෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ළමයින්ට ඒ දෙමව්පියන්ට සලකගන්න බැරි නම් මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එම නිසා තමයි මේ දීමනාව දෙන්න කියලා අපි යෝජනා කරන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඇත්තටම ලියනගේ මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාම සාධාරණ යෝජනාවක්. මොකද පහුගිය කාල සීමාවේ වැඩිහිටි දීමනාව සමහර කට්ටියට අහිමි කරා. මම හොඳටම දන්න කට්ටිය ඉන්නවා. අපේ ගෙවල්වලට ඇවිත් කිවුවා. ඒ අවශ්‍ය අංශ දැනුවත් කරලා නැවත ඒ දීමනාව ඒ දෙමව්පියන්ට ලබා දෙන්න කටයුතු කරන්න.

ඒකත් එක්කම සම්බන්ධ කරන්නේ. අපි සිංහල බෞද්ධයෝ හැටියට හරි කෘතවේදී ජාතියක්. එහෙම තමයි ලෝකෙ කතා කරන්නේ. හැබැයි අපිට කණගාටුවෙන් කියන්න ඕන. බොහොම වත්පොහොසත්කම් තියෙන දරුවෝ තමුන්ගේ අම්මා, තාත්තාට නොසලකා හරින තත්ත්වයක් තියෙනවා. ඒක මම උදාහරණයක් විදියට ඊයෙත් දැක්කා. අදත් දැක්කා. කරාපිටිය රෝහල ඉදිරිපිට මල් ශාලාවල මම හොඳට හොයලා බැලුවා. හොඳට වත්පොහොසත්කම් තියෙන පවුල්වල දෙමව්පියෝ මිය ගියාට පස්සේ ඒ මෘත දේහ පැයක් ගෙදර තියා ගන්න බැරි බොහොම අවාසනාවන්ත තත්ත්වයකට පත්වෙලා තියෙනවා. ඒ නිසා කණගාටුවෙන් කතා කරන්නේ. මොකද හේතුව හදාවඩා ගනිපු දෙමව්පියෝ මැරුණට පස්සේ මල්ශාලාවේ පැයක් දෙකක් තියලා වළලන තත්ත්වයට පත්වෙලා තියෙනවා අපේ ජාතිය. අපේ පෙර ජාතීන් වැඩ කරපු උදලු මිටටත්, පොරව මිටටත් ගරු කලා. ඒක ලිපට දැම්මේ නෑ. එහෙම ජාතියක් මේ තත්ත්වයට වැටීම පිළිබඳව ඉතාම කණගාටුදායකයි. ඒක සභාවේ අවධානයට යොමු කරනවා. මෙතුමාගේ යෝජනාව පිළිබඳව ඒ අදාළ අංශ දැනුවත් කරලා ක්‍රියාවට නගන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔය රුපියල් 2000/- නෙමෙයි ඕක රුපියල් 5000/- ක් වත් කරන්න පුළුවන් නම් ගොඩක් හොඳයි. මොකද වැඩිහිටි මනුස්සයෙකුට ඔය රුපියල් 2000/- න් හැරෙන්නවත් මදි. බෙහෙත් ගන්නත් මදි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම විෂයභාර අමාත්‍යතුමා හෝ ජනාධිපතිතුමා වුණාම කරලා දෙන්නම්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මේ ගමන්ම යෝජනා කරන්න බැරිද?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මුදල් වෙන් කරන්න පුළුවන් නම් ඒක කරයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අඩු ගානේ 2500/- ක් වත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකේ තියෙන එක දාමුකෝ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 21.** හිරිඹුර ගැමුණු මාවත දෙපස කාණු සභාවේ බැකෝ යන්ත්‍රය යොදා කැපීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මෙතන එක ගෙදරකට ඇතුලු වෙන ස්ථානයක පස් පුරවලා දැන් වතුර පිරිලා තියෙනවා මේ දවස්වල. මේ ජලය බැසයන ආකාරයට මේ ඇතුල්වෙන මාර්ගය කඩලා හෝ බෝක්කුවක් දාලා මේ කටයුත්ත කරන්න යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභාවට සහභාගී වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 22.** අප බල ප්‍රදේශය පුරා පවතින පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන (පෙර පාසල්) නිසි ක්‍රමවේදයකට සැකසීමටත්, ළමුන් බහුලව සිටින අඩු පහසුකම් සහිත පෙර පාසල් සංවර්ධනය කිරීමට සුදුසු වැඩපිළිවෙලක් යෙදීමටත් එම පෙර පාසල් ගුරුවරුන් සඳහා තෘප්තිමත් දීමනාවක් ලබාදීමටත් අවශ්‍ය කටයුතු සලසන මෙන් දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය සභාවේ වගකීමක් විදියට තිබුණට පෙර පාසල් නඩත්තු කරලා ගෙනියන්න අපිට එහෙම වත්කමක්වත් මුදලක්වත් නැනේ. ඒ නිසා මේ ගුරුවරු අවුරුදු 20 ක් 25 ක් වැඩ කරලා වයසට යනකොට ගම්වල ළමයි ප්‍රමාණය එනවත් අඩුයි. එතකොට අවුරුදු 20 ක විතර සේවා කාලයක් බලලා ඒ මිනිස්සුන්ට

තෘප්තිමත් වැඩපිළිවෙලක් අපි සභාවේ කතා කරලා හදලා යවමු. අපි වැඩපිළිවෙලක් හදලා ඕන ආණ්ඩුකාරතුමාට යවන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ලියනගේ මන්ත්‍රීතුමාගේ යෝජනාව හොඳ යෝජනාවක්. මම දන්න පෙර පාසලක් තිබුණා උළුවිටිකේ කුමුදු පෙර පාසල කියලා පහුගිය දවස්වල ඒ පෙර පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය පැවැත්වූවා. එතනදී ඒ ගුරුතුමිය කිවුවා මට දැන් මේක කරගෙන යන්න ආර්ථික ශක්තියක් නෑ කියලා. මම දැන් මේක අවුරුදු 25 ක් 30 ක් කරා කිවුවා. මේ අවුරුද්ද තමයි මගේ අවසාන අවුරුද්ද කියලා ඉතා සංවේදී කතාවක් කරා. ඇත්තටම ලියනගේ මන්ත්‍රීතුමා කිවුවා වගේ ඒ අයට යම්කිසි වැඩපිළිවෙලක් සකස් කරා නම් ඇත්තටම මේ පෙර පාසල් තවදුරටත් පවත්වාගෙන යන්න පුළුවන්. ඒක හින්දා ඒ අයගේ ආර්ථිකයත් නැංවෙන පරිදි ඒ වගේම ඒ ළමයින්ට සුභ සාධක වැඩපිළිවෙලක් වෙන පරිදි මේ කටයුත්ත සිදු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** පෙර පාසල් සම්බන්ධව කතා වුණ නිසා, යෝජනා ස්ථිර වුණ නිසා ඒකට පොඩ්ඩක් කතා කරන්න ඕන. නොමිලේ අධ්‍යාපනය ලබා දෙන පෙර පාසල් බොහොම ටිකයි තියෙන්නේ. සභාවෙනුත් දෙකක් නඩත්තු කරනවා. සභාවෙනුත් ඒ පාලිකාවන්ට ගෙවීම් කටයුතු සිදු කරනවා. අනිත් සෑම පෙර පාසලකම දෙමව්පියන්ගෙන් මුදල් අය කරලා කරන්නේ. ඒ නිසා මේ කියන දුක්ගැනවිලි ගැන නෙමෙයි, ඒ අය වාරයෙන් වාරයට, කාලයෙන් කාලයට ඒ මුදල් වැඩිකරගෙන ඒ අයගේ අවශ්‍යතාවයන් හා ළමයින්ගේ සියලු දේවල් දෙමව්පියෝ ඉටු කරන්නේ. එහෙම නොකරන තැන් හොයලා කරන්න. මම ඒකට විරුද්ධව නෙමෙයි කියන්නේ. එහෙම මුදල් නොගෙන තමන්ගේ දේවල් යොමු කරලා පෙර පාසල් පවත්වාගෙන යනවා නම් පමණක් මේ යෝජනාවට අනුව කටයුතු කරන්න. ඒකට අපේ සහාය ලැබෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි වැඩපිළිවෙලක් හදලා ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් කරන්න ඉල්ලන්නේ. ඔබතුමාගේ යෝජනාවත් හොඳයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දලට විතරක් නෙමෙයි පොදු වැඩපිළිවෙලක් හදන්න කිවුවේ. අපි හදලා යැව්වම එහෙන් යෝජනා අරගෙන ඒ අය ඒක ක්‍රියාත්මක කරාවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 23.** කරාපිටිය ගෝල්ඩන්රේන්ජ් මාර්ගය හා සන්සයිඩ් මාර්ගය දෙපස කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

<u>ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමාගේ යෝජනා</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඩඩ්ලි මන්ත්‍රීතුමා නැති හින්දා මම ඒ යෝජනාව ඉදිරිපත් කරන්නම්.

**24.** ලබුදූව වෙළඳ සංකීර්ණය නිසියාකාරව නඩත්තු කිරීම සඳහා පහත දක්වා ඇති කාර්යයන් සිදු කිරීමට යෝජනා කරමි.

I. ගොඩනැගිලිවල බිත්ති මත පැළවී ඇති වල්ගස් ඉවත් කිරීම.

II. බිම් මහලේ වැසිකිළි පද්ධතිය ප්‍රයෝජනයට ගත හැකිවන පරිදි අලුත්වැඩියා කිරීම.

III. සංකීර්ණය පිටුපස විදුලි පහන් අලුත්වැඩියා කර ක්‍රියාත්මක කරවීම.

IV. ඉහළ මහලේ වැසිකිළි පද්ධතියෙන් කඩ කාමරවලට ජලය කාන්දුවීම අලුත්වැඩියා කරදීම.

V. සංකීර්ණය පිටුපස වල්නෙලා පිරිසිදු කිරීමට දිනක් කම්කරුවන් යොදවා කටයුතු කිරීමටත්, එය භාරව සිටින කම්කරු මහතාට නඩත්තු කරන ලෙසට උපදෙස් දී ඔහුට භාරදීම.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ එක්කම අඩුපාඩු රාශියක් තියෙනවා ඊට අමතරව. මම ඒවා ටිකක් සඳහන් කරන්නම්. ලබුදූව වෙළඳ සංකීර්ණයේ පළවෙනි කාරණාව තමයි ගොඩනැගිල්ලේ බිත්තිමත පැළ වී ඇති වල් ගස් ඉවත් කිරීම. මම හිතන්නේ වැසිකිළියේ සිරිධම්ම පැත්තට මුහුණදාලා තියෙනවා බෝ ගහක් පැළ වෙලා. සභාවේ කම්කරුවන්ට කිවුවම කිව්වලු මට කරන්න විදියක් නැහැ කියලා. කපන්න විදියක් නැහැ කියලා මග ඇරියලු. අද කම්කරුවා වැඩ කරා එතන. උදේ මම ඇහුවා ගිහිල්ලා මෙතන මොකක්ද තියෙන ගැටළුව කියලා. කඩහිමියන් කියනදේ විතරක් නෙමෙයි අපේ සභාවේ නියෝජිතයා කියනදේත් අහන්න ඕන. දෙපැත්තම සාධාරණීකරණය කරන්න ඕන. මම ඇහුවහම කිවුවා කම්කරුවට පිහියක් නැහැයි කියලා. පිහියක් කාගෙන් හරි ඉල්ල ගන්න පුළුවන් පොඩි දෙයක්. ඒක අතින් කඩන්න පුළුවන් බිත්තියට ඉනිමගක් තිබ්බම. පිහියකින් කපන්න පුළුවන් ඇත්තටම. ගොඩක් අය බෝ ගස් කිවුවම කපන්න බය වෙනවා වස් වදිනවා කියලා. එහෙම කතාවකුත් තියෙනවා. ඉතිං අන්න ඒක නිසා බිත්තියට ඒ ගහ හානිකරයි, ගොඩනැගිල්ලට හානි කරයි. බෝ ගහක් ක්‍රම ක්‍රමයෙන් පැළවෙමින් පවතින නිසා ඉක්මනින් බිත්තිය දිරාපත් වෙන්න පුළුවන්. ඒ හින්දා ගරු සභාපතිතුමනි පියවරක් ගත යුතුයි සභාවක් වශයෙන්.

දෙවැනි කාරණයට දාලා තියෙනවා ඩඩ්ලි මන්ත්‍රීතුමා, බිම්මහලේ වැසිකිළි පද්ධතිය ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි අළුත්වැඩියා කරන්න කියලා. මේ වැසිකිළි පද්ධතිය ගැන කතා කරොත් ගරු සභාපතිතුමා මම ඒක නිරීක්ෂණය කරා. පහළ මහලේ වැසිකිළිය අවුරුදු එකහමාරක් තිස්සේ ඉඳන් වහලා දාලා තියෙනවා භාවිතයට නොගෙනම. මම හිතන්නේ ඒ වැසිකිළිය අවහිර වෙලා කියලා තමයි කිවුවේ ඒ කඩහිමියෝ. මම හිතන්නේ ඒක ලොකු අපරාධයක්. වැසිකිළි වලේ ප්‍රශ්නයක් තියෙනවා පහත නිසා වතුර බැසයාමේදී. මම හිතන්නේ ඒ ගැටළුව නිරාකරණය කරලා අලුත් වැසිකිළියක් හදන එක නෙමෙයි අප සභාවෙන් කළ යුත්තේ. තියෙන වැසිකිළියම ප්‍රයෝජනයට ගන්න. ගොඩක් අය උඩ වැසිකිළියට යන්නේ නෑ පඩිපෙළ නැගගෙන. අද වුණත් වැසිකිළියට යන්න කෙනෙක් ආවා පිටින් යනකොට කිවුවා පහල එක වහලා කියලා කඩහිමියෝ. ඒ පාර උඩට යන්න කිවුවම නැහැයි කියලා ගියා. ගොඩක් අය උඩට යන්න මදිකමක් වගේ දක්වනවා. පහළ එක වහලා තියෙන නිසා ධනය අපරාධයක් වීම වෙන්නේ. සභාවෙනුත් නඩත්තු කරනවා වෙළඳ සංකීර්ණය. ඒ නිසා වැසිකිළි පද්ධතිය ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියලා මම යෝජනා කරනවා.

තුන්වෙනි කාරණාව හැටියට ඩඩ්ලි මන්ත්‍රීතුමා දාලා තියෙනවා සංකීර්ණයේ පිටුපස විදුලි පහන් අලුත්වැඩියාකර ක්‍රියාත්මක කරවීම කියන කාරණය. එතනදී මට කියන්න ඕන ගරු සභාපතිතුමා, පිටිපස්සේ එකම විදුලි පහනක්වත් දැල්වෙන්නේ නෑ. ඒ පැත්ත තනිකර අඳුරේ තියෙන්නේ. ඒක හදන එක අපේ සභාවෙන් විය යුතු යුතුකමක්. පොදුවේ සභාවක් හැටියට කියන්න තියෙන අඩුපාඩු හා කළ යුතු දේවල් මේ කියන්නේ. ඒ නිසා ඒවා ක්‍රියාත්මක කරන්න.

ඊළඟට ඩඩ්ලි මන්ත්‍රීතුමාගේ යෝජනාවලට දාලා තියෙනවා ඉහළ මහලේ වැසිකිළි පද්ධතිය කඩ කාමර වලට ජලය කාන්දු වීම අලුත්වැඩියා කර දීම කියලා. එතනත් ගැටළුවක් තියෙනවා ගරු සභාපතිතුමනි, ඒක හොයා බලා කටයුතු කරන්න ඕන.

තව තියෙනවා සංකීර්ණය පිටුපස වල්නෙලා පිරිසිදු කිරීමට දිනක් කම්කරුවන් යොදවා කටයුතු කිරීමටත්, එය භාරව සිටින කම්කරු මහතාට නඩත්තු කරන ලෙසට උපදෙස් දී ඔහුට භාර දීම කියලා. මම හිතන්නේ දැන් පිටිපස්සේ වල් නෙළලා තියෙන්නේ. මම ගිහිල්ලා නිරීක්ෂණය කරා. නමුත් අර කුණුගොඩවල් තියෙනවා මාස ගාණක් තිස්සේ ගොඩගැහිලා. අපේ සභාවෙත් කසළ බැහැර කිරීමේ ක්‍රමවේදයේ තියෙන ප්‍රශ්න නිසා ගැටළුවක් මතු වෙලා තියෙනවා. නමුත් ඉතාමත් අපවිත්‍ර වෙලා තියෙනවා වෙළඳ සංකීර්ණයේ සිරිධම්ම විද්‍යාලයට මුහුණලා තියෙන කොටස. එතන තියෙනවා කුණු ගොඩක් ගොඩ ගහලා. එතනට එහා පැත්තේ කෘෂිකර්මය පැත්තට වෙන්න කුණු ගොඩක් ගහලා තියෙනවා. කුණුගොඩවල් දෙකක් ගොඩ ගහලා තියෙනවා. ඉතිං මේක අපි කඩිනමින් අස් කරලා පරිසරය ලස්සන කරොත් නම් වඩා හොඳයි කියලා මම සභාවට යෝජනා කරනවා.

ඒ වගේම තවත් මම අඩුපාඩු දැක්කා. අර එළියේ පේමන්ට් එකේ කණු හයිකරලා ලයිට් 10 ක් තියෙනවා. මම හිතන්නේ දැන් අවුරුදු දෙකක් තිස්සේ ඉඳන් එක විදුලි බල්බයක්වත් දැල්වෙන්නේ නෑ. වෙනම විදුලි පහන් කණු සවිකරලා තියෙනවා. වෙළඳසැල් හිමියන් කියන්නේ ඒ කණු සියල්ලම ඉවත් කරලා ලයිට් කණු වගේ දෙකක් හරි තුනක් හරි දාලා උඩින් ලයිට් දෙන්න කියලා. වෙළඳ සංකීර්ණයේ එළිය අඩුයි කියන කතාව කියන්නේ. රාත්‍රී කාලයේ වුණත් අඳුරු ගතියක් තියෙනවා.

ඊළඟට කිවුවා වෙළඳ සංකීර්ණයේ කඩ හිමියෝ අලුතින් ප්ලැෂ් ලයිට් වගයක් සවි කරලා තියෙනවා කියලා. එතනත් ලොකු ගැටලුවක් තියෙනවා. එතන ප්ලැෂ් ලයිට් ටික ගහලා තියෙන්නේ බිමට එළිය එන්න. කඩ කාමර වලට එළිය එන්නේ නෑ. ඒක පොඩ්ඩක් හරවලා ගැහුවා නම් කඩ කාමර ඉදිරිපසට යොමු වෙන්න එළිය එනවා. කෘෂිකර්මය පැත්තේ තියෙන ප්ලැෂ් ලයිට් එකයි, සිරිධම්ම

විද්‍යාලය පැත්තේ තියෙන ප්ලෑෂ් ලයිට් එකයි හරවලා ගැහුවා නම් එළිය එනවා. ඒ කඩකාමර වලටත්, අවට මිදුලටත්, එළිය වැටෙන ලෙස ඒක සකස් කරන්න කියලා මම යෝජනා කරනවා.

ඒ වගේම කඩ හිමියෝ තවත් දෙයක් කියනවා. මම යෝජනාවක් ගෙනාවා පහුගිය කාලේ මේක තීන්ත ආලේප කරලා අළුත්වැඩියා කරන්න. එයාලා කියනවා ඒ යන යම් කිසි මුදලක් තියෙනවානේ, ඒ මිල ගණන බලලා ඊට අඩුවෙන් ඒ අය කරලා දෙන්නම් කියලා කියනවා වෙළඳ සංගමය හරහා ලබා දෙනවා නම්. මම හිතන්නේ ඒක හොඳ යෝජනාවක්. අපේ සභාවටත් මුදල් ඉතිරි වෙනවා. ඒකටත් අපි අවධානය යොමු කරමු ගරු සභාපතිතුමා. ඒක අපිට අඩු මුදලට කරගන්න පුළුවන් නම් එයාලා ලවාම කරමු. එතකොට ඕකේ ගැටළු නිරාකරණය කර ගන්න පුළුවන්.

ඊළඟට තව කාරණයක් ඒ අය කිවුවා. දැන් ඒ පහළ මහළ සඳහා කඩකාමර තක්සේරු මුදල රුපියල් හාරදහස් පන්සීයකුත්, ඉහළ මහල සඳහා රුපියල් තුන්දාස් හත්සීය පනහකුත් අපේ සභාවට ගෙවනවානේ ගරු සභාපතිතුමා. දැන් මේ දවස්වල අපි මුදල් ගැනීම කරන්නේ නෑ නේද? ප්‍රශ්නය නිරාකරණය වෙනකම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ නෑ මුදල් ගන්නවා. මුදල් ගෙවන්න ඕන. මම මේ සභාවට යෝජනාවක් දාලා තිබුණා ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලා යවන්න වැඩි කරපු තක්සේරු මුදලින් 50% ක් නිදහස් කරන්න කියලා. ඒක එහෙම වුණොත් අයකරපු මුදල ඊළඟ මාස වලට හිලව් කරනවා. ගිය 15 ට කලින් ගෙව්වේ නැති වුණොත් දඩ ගෙවන්න වෙනවා. ඒවා අපි කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** දඩ මුදල ක්‍රියාත්මක වෙනවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමම ක්‍රියාත්මක වෙනවා. ඒක වෙනස් වෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එතකොට තව දෙයක් තමයි සභාපතිතුමා මේ පාසල් වෑන් වෙළඳ සංකීර්ණය ඉදිරිපිට දිගටම නවත්වලා තියෙනවා. අද උදෙත් මම දැක්කා. සිරිධම්ම විද්‍යාලයට එන බස් රථ, පාසල් වෑන් නවත්වලා තියෙනවා. ඒ හින්දා වෙළඳසැල් අවහිර වෙලා තියෙනවා. ගොඩක් වෙලාවට වෙළඳසැල් වලට එන කට්ටිය එන්නේ නෑ අර වාහන දිගට පේළියට ගහලා තියෙන කොට. පිටිපස්සෙත් නවත්වනවා. ඉස්සරහිනුත් නවත්වනවා. පැත්තෙනුත් නවත්වනවා. ඒකටත් අපි මොකක් හරි ක්‍රියාමාර්ගයක් ගත්තොත් හොඳයි. මොකද වෙළඳසැල් අවහිර වීම නිසා ඒ අයගේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේ අපහසුතාවයක් තියෙනවා. ඒ සඳහාත් අපි පියවරක් ගත යුතුයි.

ඊළඟට තියෙනවා වැසිකිළි වල තියෙද්දි තවත් වැසිකිළි වලක් සෑදීම පිළිබඳව ඒ අය කියනවා ඒක අනවශ්‍ය දෙයක් කියලා. ඒ නිසා තිබුණු වැසිකිළි වලම තිබුණා නම් ඒක සුද්ධ පවිත්‍ර කරලා ගත්තා නම් හොඳයි කියලා ඒ අය කියන්නේ. මොකද පහුගිය දවස්වලත් අවහිර වීම නිසා මම හිතන්නේ ඔබතුමාගේ මැදිහත්වීමෙන් තමයි ඒ කාර්යය සාර්ථක කර ගත්තේ කම්කරුවෙක් යොදවලා. ඒ නිසා ඒකට නිසි පියවරක් ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම රෑට එතන කසිප්පුකාරයන්ගේ, මත්ද්‍රව්‍යකරුවන්ගේ, කුඩුකාරයන්ගේ තිප්පොලක් බවට පත්වෙලා තියෙනවා. ඔය පඩිපෙළවල් දෙකෙන් උඩට යනවා ඒ අය රාත්‍රී කාලයේ අඳුරු ගතියත් එක්ක. ඊළඟට පිස්සෝ දෙතුන් දෙනෙක් සැරිසරනවා. කාන්තාවනුත් අපහසුතාවයට පත් වෙනවා කියලා වෙළඳසැල් හිමියෝ ප්‍රකාශ කරේ. වෙළඳසැල් හිමියන් කියනවා කාන්තාවන්ටත් යන්න බැරිලු. සමහර වෙලාවට අසභ්‍ය වචනයෙන් බැන විදිනවාලු. සමහර වෙලාවට අනවශ්‍ය තැන්වලින් ඇල්ලීම සිදු කරනවාලු. කාන්තාවන් අපහසුතාවයට පත් කරනවාලු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොනවද දන්නේ නෑ ඒ තැන්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** අනවශ්‍යතැන් ඇල්ලීම කියලා අදහස් කරේ ගරු සභාපතිතුමා කාන්තාවන්ට හිරිහැර වන පරිදි මෙතන ක්‍රියාකරනවා කියලා. ඒක හින්දා කාන්තාවන් අපහසුතාවයන්ට ලක් නොවන්න කටයුතු කරන්න. ඒ ගැන සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්න. කාන්තාවන්ගේ අයිතීන් අපි සුරකින්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** කාන්තාවන් වෙනුවෙන් අපි හඬක් නැගිය යුතුයි. සමහර වෙලාවට ඒ කාන්තාවක් විදියට අපහසුතාවයට පත්වෙන්නේ අපේ සහෝදරියක් වෙන්න පුළුවන්. අපේ මවක් වෙන්න පුළුවන්. ඒ වගේ අපි හිතනවා නම් මේ සමාජය මීට වැඩිය දියුණු තත්ත්වයට පත්වෙනවා.

ඊළඟට මම මතක්කරන්න ඕන සිවිලිම ගැන. අවුරුදු එකහමාරකට කලින් මේ සභාවේ මම කතාකරා සිවිලිම කැඩිලා කියලා. නමුත් අද වෙනකම් අරගනිපු ක්‍රියාමාර්ගයක් නෑ. සිවිලිම ඒ තත්ත්වයෙන්ම තියෙනවා. මම හිතන්නේ උඩ කඩකාමරයකුත් තියෙනවා නිවාස සැලසුම් අඳින. ඒ කඩකාමරයේ ඇඳපු ගොඩක් නිවාස සැලසුම් වතුර වැටුණ නිසා දිරාපත් වෙලා තියෙනවා. ඒ කඩහිමියෝ ඒක නිසා අපහසුතාවයට ලක් වෙලා තියෙනවා. අපි සභාවක් හැටියට අපේ අඩුපාඩු සකස් කරලා දිය යුතුයි කියලා මම අදහස් කරනවා. ඒ වගේම වෙළඳ සංකීර්ණය පිටිපස්සේ තියෙනවා වතුර මෝටරයක්. ඒ වතුර මෝටරය වහන්න දොරක්වත් නෑ. ඕන කෙනෙකුට, කුඩුකාරයෙකුට වුණත් ඕක ගලවා ගෙන ගිහින් විකුණ ගන්න පුළුවන්. ඒ තත්ත්වයේ තියෙන්නේ. ඉතිං ඒකට ලොකු මුදලක් යන්නේ නෑ. දොරක් සවිකරලා එතන ආරක්ෂාව තහවුරු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඊළඟට එතන කම්කරුවට දැන් අවශ්‍යයි කියනවා පිහියකුයි, විසි කැත්තකුයි මේක සුද්ධ පවිත්‍ර කරලා මේක නඩත්තු කරන්න. එයා කියනවා කුණුගොඩ අයින් කරන්න සවලක්වත් නැහැ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් එයා ඉල්ලීමක් කරලා තියෙනවාද ඔබතුමාගේ නෙමෙයි, සභාවෙන් ඉල්ලීමක් කරලා තියෙනවාද, වැඩ පරිපාලකගෙන් ඉල්ලීමක් කරලා තියෙනවාද, කරුණාකරලා ඒක ගැන එයාගෙන් අහන්න ඔක්කොටම ඉස්සෙල්ලා. මට නම් කියලා නෑ. කරුණාකරලා එයාගෙන් අහන්න ඒ වැඩ නොකිරීමට හේතුව මොකක්ද කියලා. එයාට මාව මුණ ගැහෙන්න කියන්න අද හවස.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒක නම් මම දන්නේ නෑ. මට කිවුවා පිහියක්, විසි කැත්තක් නෑ කියලා වැඩ කටයුතු කරන්න. ඒ දෙක අඩුපාඩුවක් කියලා කිවුවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, වෙළඳ සංකීර්ණය පිටුපසට යන්න බෑ මුත්‍රා ගඳේ. ගොඩක් අය වැසිකිළිය භාවිතා නොකිරීම නිසා එහා පැත්තට මුත්‍රා කරලා යනවා. ඒකටත් නිසි ක්‍රමවේදයක් අපි ගත්තොත් හොඳයි. එතන ඉතාමත් අප්‍රසන්නයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන ඉන්න අය නෙමෙයි බාහිරින් එන අය තමයි ඕක කරන්න ඇත්තේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** වෙළඳ සංකීර්ණයේ ඉන්න අය නෙමෙයි ඇත්තටම ඒක කරන්නේ. ගොඩක් අය අඳුරුගතියත් එක්ක එතනටම යනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, අර බෝඩ් එකක් ගහලා තියෙනවා අරලිය ලෑන්ඩ්ස් එකෙන්. ඒකේ කාලසීමාව ඉවරයි. ඒක තාම ගහලා තියෙනවා. අපි එදත් කතා කරා ඕක. ඕකට සභාවට මුදල් ගෙවලා තියෙනවා කියලා කිවුවා. ඒ බෝඩ් එක ඉවත් කරලා දාන්න. තාම තියෙනවා බෝඩ් එක අරලිය ලෑන්ඩ් එකේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දැන් නැනේ. ඒක ඉවත් කරන්න. ඒ ලෑන්ඩ් එකත් නෑ, ලොක්කත් නෑ, කවුරුත් නැනේ. ඒක ඉවත් කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඊළඟට ගරු සභාපතිතුමනි, තව දෙයක් තියෙනවා. වෙළඳ සංකීර්ණයේ කණු දිගේ එන බට ගැලවිලා තියෙනවා සමහර ඒවා. සමහර ඒවා කැඩිලා තියෙනවා. ඒ නිසා වතුර කාන්දුව සිදු වෙනවා. අපි ඒකටත් සභාවක් හැටියට පියවරක් ගත යුතුයි.

ඔය කාරණා තමයි වෙළඳ සංකීර්ණය සම්බන්ධයෙන් අපේ සභාවෙන් ඉටුවිය යුත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ටික ලියාගෙන ආපු කොළේ දෙනවද මට.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** හරි මම දෙන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, අපේ සභාව තුළට ඇවිල්ලා උදුල මන්ත්‍රීතුමා මන්ත්‍රීවරයෙක් හැටියට ප්‍රකාශ කරපු කාරණා බරපතල කාරණාවක්. එකක් තමයි

කෙටියෙන්ම අපිට කරන්න පුළුවන් දේවල් ටිකක් තියෙනවා. සභාවෙන් පිරිසිදු කිරීම, තීන්ත ආලේප කිරීම වගේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතනදී මන්ත්‍රීතුමා ඒකට දැන් ඇස්තමේන්තු සකස් කරලා ඔක්කොම කරලා තියෙන්නේ. නමුත් ඇස්තමේන්තු සකස් කරාට ඒක සෘජු ශ්‍රමික පදනම යටතේ කරන්නේ සභාවේ සේවකයන් යොදවලා. නමුත් ඇස්තමේන්තු දැනට සකස් කරලා තියෙනවා. ඒක කරන කොට ඕකේ බහුතරයක් කාරණා ඉවර වෙනවා. අනිත් කාරණා වලට මම ඉදිරි සතිය තුළ ක්‍රියාමාර්ග ගන්නවා. වීදි පහන් වලට මිල ගණන් කැඳවලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, ඊළඟ කාරණය තමයි සභාවේ කම්කරු මහතා කරන ලද ප්‍රකාශය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පිළිබඳව මම ක්‍රියාමාර්ගයක් ගන්නවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කම්කරු මහතාට උදැල්ලක්, පිහියක් ඕන නම් මෙහෙට කිව්වා නම් ගන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පිළිබඳව එයාට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගන්නවා මම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේ වගේ චෝදනාවක් සභාවට කරපු එක වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්නම් මේක ඉවර වෙලා ගිහින් මම ඒ ගහ ගලවනවා. එතකොට බලමු කරන දේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මට පුළුවන්කම තිබුණා නම් එවෙලේ ගහ ගලවලා එනවා. ඇත්තටම මම උදේ ගිහින් පැයකට වඩා එතන නිරීක්ෂණය කරලා සාකච්ඡා කරා. තව කාරණයක් ගරු සභාපතිතුමනි, මකුණු දැල් කඩලා නෑ වෙළඳ සංකීර්ණයේ. ඉතිං කම්කරුවට කිව්වම කියනවා ඒ ටික කඩන්න ඕන කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරිතුමා දැනුම් දුන්නා බිත්තියේ තියෙන ගහ කීප පාරක් ගැලෙව්වත්, යට මුල් තියෙන හින්දා ඒ මුලෙන් නැවත ගහ හැදෙනවාලු. ඒ යට කොටසම ඉවත් කරලා අළුත්වැඩියා කරන්න ඕන.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** කඩ ඇතුලේ තියෙන මකුණු දැල් කඩ හිමියන්ට කඩා ගන්න පුළුවන්. නමුත් අර කොරිඩෝවේ දිගටම මකුණු දැල් බැඳිලා. ඒක මතක් කරාම කිව්වා හා මම කඩන්නම් කියලා ඊට පස්සේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට දැන් ඒකට මොකක්ද දන්නේ නෑ එයාට ඕන. ඒකට මේවා එකක් බැඳලා ඉල්ලයිද දන්නේ නෑ එයා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ කම්කරුවත් එක්ක පොඩ්ඩක් කතා කරලා බලන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඊට පස්සේ බරපතල කාරණාවක් කිව්වා ලබුදූවේ කාන්තාවන්ට යන්න බැහැයි කියලා. මේ සභාවක ඕක කතා කරාම බරපතල කාරණයක් එච්චරටම පිරිහෙච්ච සංස්කෘතියක් එතන තියෙනවද කියන එක. ඒ පිළිබඳව සභාව විදියට අපිට හොඳ නෑ. නීතිය ක්‍රියාත්මක කරන ආයතන තියෙනවා. ඒ තැන් වලට ඒක යොමු කරවන්න. ඒකේ සත්‍ය අසත්‍යතාවය හොයලා බලන්න ඇයි මෙහෙම කාන්තාවන් හිරිහැරයට ලක්වන්නේ කියලා. ඇයි එයාලා පොලීසියට ගිහින් පැමිණිල්ලක් දාලා නැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම එකකුත් තියෙනවා. කොයිම වෙලාවකවත් අපිට දැනුවත් කිරීමක් කරලා නෑ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මේක ගැන කාරණා ගොඩක් සාකච්ඡා කරන්න පුළුවන් එතනට ගියා නම්.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** මම නිවැරදි කිරීම කරන්නම් උදුල මන්ත්‍රීතුමා. සභාපතිතුමා පළමුවෙන්ම කියන්න ඕන මම කවදත් වෙළඳ සංකීර්ණයේ අඩුපාඩු ගැන කතා කරා. ඒ

මිනිස්සුන්ගේ පැත්ත තමයි මම හැමදාම ගත්තේ. එතකොට මට ලේකම් මහත්තයා කිව්වා මන්ත්‍රීතුමිය සභාවට එන ආදායම් අහුරවලා ඔබතුමිය ඉල්ලන්න එපා කිව්වා සභාවෙන් දේවල්. මට දවසක් එහෙමත් කිව්වා කඩබදු මුදල් ගැන, වෙළඳසංකීර්ණයේ අඩුපාඩු ගැන කතා කරාම. දැන්නම් සභාපතිතුමා මට මේ ටික කියන්නම වෙනවා. ගිය මාසේ වෙනකම්ම මම කතා කරේ වෙළඳ සංගමයයේ කට්ටිය ගැන තමයි එයාලගේ පැත්ත අරගෙන. ගිය මාසයේ සභාවේ අපි කතා කරපු දේකට, කඩබදු මුදල් වැඩිකරපු එකට මම නොදැනුවත්කම නිසා ඇහුවා අවුරුදු පහෙන් පහට තක්සේරු වාර්තා එනවද කියලා. මම කතා කරපු ටික ඔක්කොම මන්ත්‍රීවරයෙක් ගිහින් කඩකාමර හිමියන්ට කියලා. මට එදාම හවස කෝල් කරා. මන්ත්‍රීතුමිය ඔබතුමිය තමයි කිව්වා ඉස්සෙල්ලම අත උස්සලා තියෙන්නේ. මට ලොකු වේදනාවක් දැනුණා ඒකට. එයාලගේ පැත්ත අරන් කතා කරපු මට එදා විරුද්ධව එහෙම කිව්වම. මම ඔබතුමාටත් එදා හවස ඒක කිව්වා. ඒක පළවෙනි කාරණාව.

අනික ඊට පස්සේ ඒ අය සභාවට කැඳවලා කඩබදු මුදල් ගැන කතා කරාට පස්සේ කිසිම කෙනෙකුට කඩ බදු මුදල් ගෙවන්න එපා කියලා කඩහිමියන්ට කියලා තියෙනවා ඉන්දික අයියා. මම නම් වශයෙන් කියන්නම්. මම කිසිම කෙනෙකුට බය නෑ ඇත්ත කතා කරන්න. ඉන්දික අයියා අනිත් කඩවලට ගිහින් කියලා තියෙනවා කඩබදු මුදල් ගෙවන්න එපා කියලා වැඩ් කරපු ඒවා. අපිට මිනිස්සු ඇවිල්ලා කිව්වා කඩබදු මුදල් ගෙවන්න එපා කිව්වා කියලා. මම කිව්වා ඒක මට ප්‍රශ්නයක් නෑ. ගෙවනවා නම් ගෙවන්න ප්‍රශ්නයක් නෑ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් අපි එවෙලේ තීන්දුව ගත්තේ වැඩිවෙච්ච බදු මුදල් ගෙවන්න. නමුත් අරහෙන් තීන්දුව ආවොත් බදු මුදල් අඩු කරන්න, ඒවා ඉදිරියට හිලවු කරන්න.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** අනික සභාපතිතුමා උදුල මන්ත්‍රීතුමා, ඩඩ්ලි මන්ත්‍රීතුමා කරපු යෝජනා ගැන මම මීට අවුරුද්දකට විතර ඉහත ඉඳන් මේ සභාවේ කතාකරපු දේවල්. අපිට මේකේ කරන්න පුළුවන් දේවලුත් තියෙනවා, බැරි දේවලුත් තියෙනවා. දැන් ඒකේ තීන්ත ගාන්න කියලා මම තමයි සභාවේ යෝජනා කරේ. දැන් හැම තැනම කියනවා, මටත් කිව්වා, මෙතනදිත් කිව්වා අපිට තීන්ත ගාන්න ඕන නෑ කියලා. එහෙම නම් අපි ඒක කරන්න ඕන නෑ කියලා මම හිතනවා. ඔබතුමාට එතනදී හයියෙන් කතා කරලා කිව්වා අපිට තීන්ත වලට වැඩිය දේවල් තියෙනවා කියලා. තීන්ත ගාන්න ඕන නෑ කිව්වා. ගියසැරේ සභාවෙන් ලක්ෂ 10 ක් පාස් කරා කිව්වා. උන් සල්ලි ගැහුවයි කිව්වා. ඔබතුමාට කියන්නේ එක කතාවක්. මට කියන්නේ එක කතාවක්. කරනවා නම් එයාලට දෙන්න කිව්වා. එයාලට දීලා කරන්න ඕන නෑ. මේක සභාවෙන් පාලනය වෙනවා නම් මේ සියලු තීන්දු තීරණ සභාවෙන් තමයි ගන්න ඕන.

ඊළඟට වැසිකිළියට යන්න දෙන්නේ නෑ. ඒක මම පැහැදිලිවම දන්නවා. මොකද මම ගිහිල්ලා ඒ වගේ අස්සක් මුල්ලක් නෑර අවුස්සපු මනුස්සයෙක්. එයාලා ලොක් කරලා යතුර අරගෙන යනවා. උදුල මන්ත්‍රීතුමා ගිහින් බලන්න ඒක. පිට කෙනෙක්ට, පහළ කඩකාමරයක කෙනෙකුට වැසිකිළියට යන්න නම් යතුර තියෙන කෙනාව හොයන්න යන්න ඕන. එහෙම කරන්න දෙන්න බෑ සභාපතිතුමා. මේක සභාවේ. මේක නඩත්තු කරන්නේ සභාවෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පුද්ගලිකව තියාගෙන ඉන්නවාද?.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** පුද්ගලිකව යතුර එක කඩේක කෙනෙක් ළඟ තියෙන්නේ. කාටහරි වැසිකිළියට යන්න ඕන වුණාම යතුර අරගෙන එන්න ඕන. මම හිතනවා ඒවා තමයි අඩුපාඩු. අරවා නෙමෙයි ඒවා තමයි අඩුපාඩු වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමියගේ කතාවට මම පොඩි ඌන පූරණයක් කරන්නම්. ඔතනදී මම අවුරුදු එකහමාරකට කලින් වෙනම ෆයිල් එකක් තියාගෙන ලබුදූව වෙළඳ සංකීර්ණය අධ්‍යයනය කළා. මම හිතන්නේ සභාවෙත් ඇවිල්ලා කතා කරා. එතනදී ඒ වැසිකිළි පද්ධතිය ලොක් කරන්න හේතු ඇහුවා. මොකද කියලා ඇහුවා ලොක් කරලා තියෙන්නේ. අනිත් මිනිස්සු යන්නේ කොහොමද කියලා ඇහුවා. එයාලා එක වැසිකිළියක් ලොක් කරලා තිබුණේ ඉබ්බෙක් දාලා. මොකද හැමෝම ගිහිල්ලා ජරා කරලා වතුරත් ගහන්නේ නැතුව එහෙමම යනවා කිව්වා. ඉතිං අපි මේක හැමදාම උදේට හවසට පිරිසිදු කරනවා කිව්වා. බොහොම අමාරුවෙන් කිව්වා මේක රැකගෙන ඉන්නේ. අනිත් ඒවා ලොක් කරලා නෑ කිව්වා. එතනත් යම් කිසි සත්‍යතාවයක් තියෙනවා ගරු සභාපතිතුමා. අනිත් මිනිස්සු ඇවිල්ලා ඒකේ ජරා කරලා ගියාම වැසිකිළියට යන්නත් බැහැ. වෙළඳ සංකීර්ණයේ අයට යන්න බෑ පිට අය ඇවිත් ගියාම.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** දැන් එතන කම්කරුවෙක් ඉන්නවානේ. එයා දිනපතා ඒක පිරිසිදු කරනවා නම් ලොක් කරන්න අවශ්‍යතාවයක් නෑ. ඒක එයාලාගේ අඩුපාඩුවක්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ කම්කරුවගේ වැඩ කොටස වෙන්නේ නැත්නම් එතන ලොකු ගැටළුවක් තියෙනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ඒක හරි අනික මම හිතනවා මේක මාධ්‍යවලට ගියොත් බොහොම වැරදි දෙයක්. කාන්තාවන්ට හිරිහැර කරන කෙනෙක් එතන ඉන්නවා කිවුවා. මම බොහොම පැහැදිලිව කියනවා එතන එහෙම කෙනෙක් නෙමෙයි ඉන්නේ. "ජයේ" කියන මනුස්සයෙක් එතන ඉන්නේ. ඇත්තටම සභාපතිතුමා එහෙම කියනවාට මම කැමති නෑ. මනුස්සයොන්ට එහෙම කියන්න හොඳ නෑ. දැන් ඒ මිනිස්සුන්ට ඒ මනුස්සයාගෙන් කරදරයි කඩවලට එබෙන නිසා. නමුත් ඒ මනුස්සයට ඉන්න තැනක් තියෙනවා. හොඳ පවුල් පසුබිමක් තියෙනවා. සහෝදරයෝ ඉන්නවා. තුත්තිරිපිටිය වත්තේ තමයි ගෙවල් තියෙන්නේ. එයා මන්දමානසික මනුස්සයෙක්. එතකොට කාන්තාවන්ට හිරිහැර කරනවා කියන කතාවේ වැරැද්දක් නෑ. පොඩි ඇත්තකුත් තියෙනවා. කාන්තාවන් කීපදෙනෙක්ගේ ළඟින් යනකොට අතින් අල්ලලා තියෙනවා. මගේ අතිනුත් අල්ලලා තියෙනවා. බොරු කියන්න ඕන නැනේ. මම හැමදාම රුපියල් පනහක්, සීයක් දෙනවා. අපි මිනිස්සුන්ට ඇඟිල්ල දිගු කරන කොට දෙපාරක් හිතන්න ඕන. මම ඒකට විරුද්ධයි. කාන්තාවක් විදියට මට තමයි කියන්න පුළුවන් එතන කාන්තාවකට ඉන්න දෙන්නේ නෑ කියලා. මමත් ගියාම හෑන්ඩ් බෑග් එක ඇරලා බලනවා. එක සතයක් ගන්නේ නෑ බෑග් එක එතනින් තියනවා. හැමදාම මගේ ළඟට ඇවිල්ලා අතින් අල්ලනවා. මම අහනවා ඇයි ජයේ කෑවද කියලා. අපි මනුස්සයෙක් විදියට මනුසත්භාවයෙන් මන්දමානසික මනුස්සයෙක් දිහා බලන්න පුරුදු වෙන්න ඕන. කඩහිමියොන්ට තියෙන කරදරය හින්දා එහෙම කියනවා ඇති. ඒ ගෙදර මිනිස්සු මේක දැන ගත්තොත් ඒක සභාවටත් හොඳ නෑ. ඒ මනුස්සයාගෙන් කාටවත් කරදරයක් නෑ. එයාට තියෙන්නේ මානසික ආබාධයක්. හිනා වෙනවා. ළඟට ඇවිල්ලා අත ගානවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමිය කියන එක හරි වෙන්න පුළුවන්. නමුත් ව්‍යාපාරික ස්ථානයක් වුණාම එන්නේ බාහිර පුද්ගලයෝ. එයා ගැන දන්නේ නෑ. එතන ඒ ව්‍යාපාරයට හානියක් වෙන්න පුළුවන්. ඒකට අපි වැඩපිළිවෙලක් හදමු.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** එයත් එක්ක සභාපතිතුමා ඔය හැමෝම තරහයි. ඒ මනුස්සයා හරිම අහිංසක මනුස්සයෙක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ මන්ත්‍රීතුමිය තරහා වගේම අරහෙම ප්‍රශ්නෙකුත් ඔතන තියෙනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** තියෙනවා. නැත්තේ නෑ. ඔතන ඉන්න කෙනා එයා. ඒ කියන්නේ එයාට විරුද්ධව අපිට මුකුත් කරන්න බැරිවෙයි. ලබුදූවේ පදිංචි වෙලා ඉන්න මනුස්සයෙක්. ඒ නිසා අපිට එයාව කොහාටවත් ගෙනිහින් දාන්නවත්, වෙනත් ක්‍රියාමාර්ගයක් ගන්න අයිතියක් නැති වෙයි. එයා හැමතිස්සෙම කඩවල් ළඟට එන්නේ නෑ. අනික උදුල මන්ත්‍රීතුමා තමන්ගේ කඩේ ඉස්සරහ මකුණු දැල් ටිකක්වත් කඩා ගන්න බැරි නම් අපි ඒ මිනිස්සුන්ට කොහොමද ආකල්ප පුරුදු කරන්නේ. ඒ ටිකවත් කර ගන්න ඕන. සභාව බලාගෙන ඉන්න ඕන නෑ සභාපතිතුමා. හැමදේකටම සභාවට, මන්ත්‍රීතුමියට, සභාපතිතුමාට කතා කරන්න දැන් ඒ අය පුරුදු වෙලා ඉන්නවා. එයාලගේ අඩුපාඩු හදාගන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වර්තමානයේ එයාලාගේ කඩ බදු වැඩිකිරීම අපි කරපු දෙයක් නෙමෙයි. තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව ඇතුව මුළු සභාවම ඒකමතිකව තීන්දු කරපු දෙයක්. ඒක තුළ ඒ අය දැන් පෙන්වන්නේ ඔක්කොම අපි කර ගන්න ඕන මේ දේවල් කෙරෙන්නේ නෑ කියලා. එදා සාකච්ඡාවේදී මේක පිළිගත්තා. ඒ අය කියන්නේ කිසි දෙයක් කරන්න එපා කියලා. ඒ අය කියනවා තීන්ත ගාන එකත් කරන්න එපා කියලා. අපිට ඕන නෑ කිවුවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් කිවුවා ගරු සභාපතිතුමා. තීන්ත ගෑම අනවශ්‍යයි. නමුත් කරනවා නම් සභාවෙන් ඒක එයාලා හරහා කරන්න ඉඩ දෙන්න කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයාලා හරහා කරන්නේ නෑ. ඒක කරන්නේ ඍජු ශ්‍රමික පදනමින්. සභාවෙන් මිල ගණන් කැඳවලා තීන්ත ටික ගේනවා. අනිත් ටිකත් කරනවා. අමාරු වෙන්න පුළුවන්. නැත්නම් චෝදනාවත් ඒ වගේම තමයි. ඒක හින්දා සභාවෙන් ඍජු ශ්‍රමික පදනමින් අපි කරන්නේ. ගිය සැරේ කරේ අපි නෙමෙයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මාසික බදු මුදල කීයද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රුපියල් හාරදහස් පන්සීයයි තිබුණේ. දැන් එක්දහස් පන්සීයකින් වැඩි කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඉතිං ඒක සාධාරණයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඔය අඩුපාඩු කිව්වම ඒ අඩුපාඩු හදන්නත් ඕන එක පැත්තකින්. නිකං උදාහරණයක් විදියට මාධ්‍යවේදී මහත්වරුන් දැන ගන්න ඕන මේක. ලක්ෂ නමයක ඇස්තමේන්තුවක් තියෙනවා තීන්ත ආලේප කිරීමට පමණක්. නමුත් ඒ ලක්ෂ නමයම යන්නේ නෑ. සභාවෙන් ඍජු ශ්‍රමික පදනම යටතේ කරන්නේ. කලින් ඒ මුදල කඩබඳු විදියට අයකරන්න කොපමණ කාලයක් යනවාද මම අහන්නේ. ඒවත් බලාපොරොත්තු වෙනවා. නමුත් මෙතන කඩ කුලිය වැඩි කරාම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඒකටත් විරුද්ධයි. මේක දෙපැත්ත සමබර වෙන්න එපැයි. ආදායමක් එන්නේ නැතුව කොහොමද වියදමක් කරන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** තව එකක් තියෙනවා ගරු සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාත් මන්ත්‍රීවරයෙක් විදියට ජනප්‍රිය වෙන්නත් කරන්න පුලුවන් මන්ත්‍රීතුමා. ඔබතුමා කියන එකේ වැරැද්දක් නෙමෙයි මම දකින්නේ මන්ත්‍රීතුමා. නමුත් ඇත්ත ඒ අය කියන එකම නෙමෙයි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මේ කතා කරන්නේ ජනප්‍රියවීමටවත්, කිසිම දේකටවත් නෙමෙයි. සද්භාවයෙන් මේ කතා කරන්නේ අපේ සභාව ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මන්ත්‍රීතුමා මෙහෙම දේකුත් තියෙනවා. එයාලා අපිට ගෙවන රු.4500/- තව රු. 1500/- කින් වැඩි වෙලා රු.6000/- ක් වෙච්ච එකට කෑ ගහනවා. නමුත් ඔබතුමා විශ්වාස කරන්න රු. 25000/- මාසික කුලියක් ගෙවන අය ඉන්නවා කියලා ඔබතුමා පිළිගන්නවාද?. ඕක අතුරුබදු දීපු අයට මාසෙට රු. 25000/- ක් ගෙවන අය ඉන්නවා ඕකේ. සභාවට වැඩිවුණු එකත් එක්ක රු. 6000/- යි ගෙවන්නේ. ඔතන මාෆියාවකුත් තියෙනවා. ඔතන සාධාරණයට කරන අයත් ඉන්නවා. උඩ තට්ටුවේ බිස්නස් හොඳටම කරන අයත් ඉන්නවා. නැති අයත් ඉන්නවා. අපි පිළිගන්නවා නැත්තේ නෑ. ඕකෙම තව මාෆියාවක් ක්‍රියාත්මක වෙනවා. අතුරුබදු අරගෙන ඒ අයට රු.25000/- ක් ගෙවන අය ඉන්නවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒකේ නම් වැරැද්දක් මමත් දකිනවා. වැරැද්ද වැරැද්ද හැටියට දකිනවා. මෙහෙම දෙයක් තියෙනවා සභාපතිතුමා. සමහර කඩවල් වලට ඇත්තටම බිස්නස් එකක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බිස්නස් එක නැති හේතුව මන්ත්‍රීතුමා, තැනට අවශ්‍ය බිස්නස් එකක් කරන්න ඕන. උදාහරණයකට ලබුදූව හන්දියේ තියෙන වෙනත් ව්‍යාපාරයකුයි ඔතනත් දැම්මම අතන කිට්ටුයි. ව්‍යාපාරය දියුණුයි. එතනට යනවද, උඩ තට්ටුවට යනවද, පොදුවේ ගත්තම ඒකනේ කාරණාව. අනික අද කොහොමත් කවුරුත් බලන්නෙත් ක්ෂණිකවම තමන්ට අවශ්‍ය දේ මිලදී ගෙන යන්න. එතනදී උඩ තට්ටුවට යාම ගැටළුවක් තියෙනවා. නමුත් ඔබතුමා බලන්න උඩ තට්ටුවේ තියෙන සැලූන් එකේ පෝලිම තියෙන විදිය. ඒක තමයි මන්ත්‍රීතුමා තමන් දැන ගන්න ඕන තමන් කරන ව්‍යාපාරයේ ලාභය අඩු නම් අපිට බැන බැන ඉඳලා තක්සේරුව ගැන කතා කියලා වැඩක් නෑ. තමන් වෙනත් ව්‍යාපාරයකට අනුගත වෙන්න ඕන. අනිත් එක එක්කෙනෙක් කිව්වා මෙතනදී එයා ව්‍යාපාර තුනක් කරා කියලා. මුල් එක කරා අසාර්ථකයි කිව්වා. දෙවැනි එක කරා අසාර්ථකයි කිව්වා. බිස්නස් නෑ කිව්වා. මම අද යන්තම් තුන්වෙනි එකෙන් කිව්වා ලාභ ලබමින් ඉන්නේ. මෙතනදී කිව්වා එදා. ඉතිං ඕක තමයි ඇත්ත තත්ත්වය.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** තව දෙයක් කියන්න ඕන. මට මෙතන ගිහින් ජනප්‍රිය වෙන්න නෙමෙයි වුවමනාව තිබුණේ. සභාවත් එක්ක ලොකු ගැටුමක් තිබුණා වෙළඳ සංකීර්ණයේ අය. මම කිව්වේ මෙතන ඉන්න කිසි කෙනෙක් ඔයාලත් එක්ක විරෝධතාවයක් නෑ. අපිට ඕන සභාවක් හැටියට දෙගොල්ලොම රැකගෙන යන්න කියලා මම කිව්වා. සමහරු කාංචනා මන්ත්‍රීතුමිය අපහසුතාවයට පත්වෙන ආකාරයට කතාකරලා තිබුණා. මම ඒක හෙළා දකිනවා. අදත් කතා කරලා ඇහුවා කවුද මේකට විරුද්ධ කියලා. මම කිව්වා කවුරුවත් නෑ, ගරු සභාපතිතුමත් ඔයගොල්ලෝ වෙනුවෙන් කතා කරන්න පෙළඹුණා නේද කියලා එදා රැස්වීමේදී. ඒ අතර, මම ඇත්තටම කණගාටුව පළ කරනවා අපේ මන්ත්‍රීතුමිය අපහසුතාවයට පත්වෙන විදියට කතා කරපු එක ගැන. මම දන්නේ නෑ මොන මන්ත්‍රීතුමාද, මොන මන්ත්‍රීතුමියද කතා කරේ කියන එක ගැන. එහෙම කතා කරා නම් ඇත්තටම වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ආරාධනා කරනවා සියලු ගරු මන්ත්‍රීතුමන්ලාටත්, මන්ත්‍රීතුමියන්ලාටත් 31 වෙනිදා නිරීක්ෂණයකට යමු කියලා. ගිහින් අඩුපාඩු බලමු.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මම හිතන්නේ ඒක නම් හොඳ වැඩපිළිවෙලක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ වගේම තමයි සභාවාර දෙකක විසඳිච්ච නැති ප්‍රශ්නයක් තමයි අපි සභාව පටන් ගනිපු වෙලාවේම විසඳලා දුන්නේ ඒ අයට. ඒකත් ඒ අය මතක තියා ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම බලාපොරොත්තු වෙනවා. නමුත් ඊට කලින් අපේ මේ ක්‍රියාවලියට ඒ අය අනුගත වෙන්න ඕන. නැත්නම් අපිට මුකුත් කරන්න බැහැ. අපේ ක්‍රියාවලියට අනුගත වෙන්න ඕන. ඊට පස්සේ අපි බලමු මොකක්ද කරන්න පුළුවන් කියලා. දැන් ඉල්ලීමක් කරලා තියෙනවා ආණ්ඩුකාරතුමාගෙන් 50% ක් අඩු කරන්න කියලා. ඒක කෙරුණත් නොකෙරුණත් අපි ඉල්ලීම කරනවානේ. වෙන කිසිම සභාවක එහෙම වෙන්නේ නෑ. අපිට ලැබෙන්න තියෙන ආදායමක් වළක්වා ගන්න අපි ඉල්ලීම් කරන්නේ නැහැ. ඒ ඉල්ලීමත් මම මේ සභාව වෙනුවෙන් ඉල්ලලා තියෙනවා සභාව හරහා. ඉතිං අපි එතනදී ඒවාටත් අනුගත වෙන්න ඕන. සියලු දේ ප්‍රතික්ෂේප කරමින් තමන්ගේ අඩුපාඩුකම් විතරක් තියාගෙන යන්න නම් බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අනිත් එක සභාපතිතුමා මේ තක්සේරුව කරන්නේ අවුරුදු තුනකට සැරයක්. එතකොට මේ අය අවුරුද්දෙන් අවුරුද්දට වැඩ කරන ක්‍රමවේදයක් නම් ඕන විරුද්ධ වෙන්න. මේ තක්සේරුව දෙන්නේ අවුරුදු තුනකට සැරයක්. එතකොට ඒ අයට බැහැයි කියන්න බැහැ. රු. 4500/- කට කියන්න කොහෙන්ද නවාතැන්පොළක් කාමරයක් ගන්න පුළුවන්. අනිත් එක මේ හොඳම තැනක්. මම නම් කියන්නේ ඒ අය ඉල්ලන ඒවාට සහන දෙන්න නෙමෙයි. සභාව පැත්තෙන් මේවා නඩත්තු කරන්න ඕන. ජනතා සුභසාධනය ඉෂ්ඨ කරන්න ඕන. ඒක නිසා මේ රු. 4500/-, රු. 6000/- ක් නෙමෙයි රු.10,000/- ක් වත් වෙන්න ඕන. අනිත් එක හොයලා බලන්න අපේ නිලධාරියෙක් යොදවලා නීත්‍යානුකූලව කඩ ලබා ගනිපු අය නෙමෙයි මේ කඩවල ඉන්නේ. එතකොට ඒ අයගේ වෙළඳ ව්‍යාපාර පාඩුයි කියලා ඒ අයගේ දුක්ගැනවිලි කියනවා නම් කඩේ භාර දීලා අයින් වෙන්න කියන්න. ඒකට පරීක්ෂණයක් පවත්වන්න. කඩේ භාරදීලා අයින් වෙන්න කියන්න. මේ අය කඩ පිටට විකුණලා අධික ලාභ ලබනවා. මේවා නඩත්තු කරන්නෙත් නැහැ. තක්සේරුව ඔබතුමාලා ගන්න තීන්දුවක් නෙමෙයිනේ. තක්සේරු දෙපාර්තමේන්තුවක් මේ රටේ පිහිටුවලා තියෙන්නේ ඇයි. අපිට බැරි දේ කරන්න. තක්සේරුව ඒ අයගේ නිර්ණායකයන් අනුව තමයි ඒ අය හදන්නේ. එතකොට අවුරුදු තුනකට පස්සේ තමයි නැවත වෙන්නේ. පහකට පස්සේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** 2013 තක්සේරුවෙන් පස්සේ 2018 ආයේ තක්සේරුවක් එන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක නිසා මේ හිඟයත් ගන්න ඕන මම කියන්නේ. අනිත් එක තමයි තක්සේරු දෙපාර්තමේන්තුවත් හැල්ලුවට ලක් වෙනවා ඒ අය දීපු නිර්ණායකයන් අපි තව අඩු කරන්න කියලා පළාත් පාලන කොමසාරිස්ට යවන එක. ඒක වැරදියි. එතකොට ඒ අයගේ උපදේශනයෙන් වැඩක් නැති වෙනවා. ඒ නිසා රාජ්‍ය නිලධාරීන් රකින ගමන් සභාව අංක 01 ට රකින්න ඕන. ඔබතුමාලා පොරොන්දු දීලා ඇවිල්ලා ඉන්නේ වෙළඳ ප්‍රජාව නඩත්තු කරන්න නෙමෙයි. ඔබතුමන්ලට ඡන්දය දීපු අති මහත් සාතිශය ජනතාවක් ඉන්නවා. ඒ අය වෙනුවෙන් තමයි මේ ලැබෙන මුදල් ඔබතුමාලා යොදවන්නේ. ඒක නිසා මේ අවුරුදු පහෙන් පහට දෙන නිර්ණායකයන් වෙනස් කරනවාට මම නම් කැමති නෑ. දීපුවත් ඒ අය මග හරිමින් ඉන්නවා. තවත් මේකට සහන දෙනවා නෙමෙයි මේක තව මදියි මම නම් කියන්නේ. අද කඩ කාමරයක් කොහෙද මේ ගාණට තියෙන්නේ. නේවාසික කාමරයක් ගන්න පුළුවන්ද අඩුම ගානේ. ඒකත් රු.6000/- , රු. 7000/- ක් වත් වෙනවා කැමත් නැතුව. එතකොට මේ අයට උපරිම සහන දෙන්න බෑ. උපරිම මෙතන 25 දෙනෙක් ඉඳීවි. ඒ 25 කියන දේ නෙමෙයි ඔබතුමා සභාව විදියට සමස්ත සභා බල ප්‍රදේශයට වැඩ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අලුතින් වැසිකිළි වලක් ඒකේ හදන්න වුනේ තිබුණ වල සම්පූර්ණයෙන් පිරිලා ගලියක් දාන්න ගිහින් කඩාගෙන වැටුණ නිසා. කඩන් වැටුණට පස්සේ කොන්ක්‍රීට් කරලා වෙනම තැනකට ඒක ගෙනයාම වැදගත් වුණා. නැත්නම් අරක තියෙද්දි වෙන එකක් කරා නෙමෙයි අරක කඩාගෙන වැටිච්ච වලක් ඒකයි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** අර කුණුගොඩවල් දෙක අස්කරන්න බැරිද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බලමු මොකක්ද කරන්න පුළුවන් කියලා. මේ දවස්වල කුණු ප්‍රශ්නය තියෙනවානේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 25.** නරාවල, කන්දේගොඩ වත්ත මාර්ගය සම්පූර්ණයෙන් කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒක යෝජනා කරාට පස්සේ තමයි මම ඒ මාර්ගය පිළිබඳ තොරතුරු දැන ගත්තේ. ඒක වෙලක නියරක හදපු මාර්ගයක්. ඒක අඩි 14 ක කම්බියක් ගැහුවට පස්සෙත් මඩ තියෙන්නේ. වැලි තට්ටුව අහුවෙන්නේ නැහැලු. මම හිතන්නේ අපේ සභාව මැදිහත් වෙලා ඒක කරන්න පුලුවන් ක්‍රමවේදය මම දන්නේ නෑ. ඒක නිසි ආකාරව හදන්නේ කොහොමද?. අඩි 14 ක් යටටත්, මඩ තමයි තියෙන්නේ. වැලි අහුවෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කොරිපස් දාලා හරිගැස්සුවා නම් හරිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කම්බි නෙට් එකක් දාන්න ඕන. නෙට් එක දාලා කරන්න වෙන්නේ. අර දූව වත්ත පාර ඒ විදියට කරපු නිසා තමයි අදටත් ඒක තියෙන්නේ. ඒ විදියට කරන්න වෙන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 26.** නරාවල සිට්‍රස් හන්දිය අසළ තිබෙන, නරාවල සිට්‍රස් වතුයායට අයත් පළාත් සභාව මගින් මෙහෙයවන වෛද්‍ය මධ්‍යස්ථානය සහිත ඉඩම ප්‍රාදේශීය සභාවට පවරාගෙන එහි සේවා පියසක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** නරාවල ග්‍රාම සේවා වසමට ප්‍රජා ශාලාවක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කා සතුද.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සිට්‍රස් වතුයායට. ඒක පවරා ගැනීමට නෙමෙයි. ඉල්ලීමක් කරලා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුණුකුල ප්ලාන්ටේෂන් එකට අයිති.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** නරාවල වසමට ප්‍රජා ශාලාවක් හදන්න ඉඩ කඩ නෑ. ඒක නිසා ඉල්ලීම කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 27.** කන්දේගොඩවත්ත, අතුරු මාර්ගය ජම්බුගහ අද්දර කුඹුර දක්වා මැන ගැසට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 28.** හෙරොයින් ඇතුලු විෂ මත්ද්‍රව්‍ය විකිණීම, ළඟ තබා ගැනීම හෝ භාවිතා කිරීම සාක්ෂි සමග ඔප්පු වූ විට අවම වසර දෙකක කාලයක් සඳහා අත්අඩංගුවට ගෙන ලංකාවේ තිබෙන පුරන් කුඹුරු අස්වැද්දීමට සහ කෘෂිකාර්මික කටයුතු සිදු කිරීමට දායක කර ගන්නා මෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, අග්‍රමාත්‍යතුමාටත්, ගරු පාර්ලිමේන්තුවටත් යොමු කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මගේ මේ යෝජනාවට මාධ්‍යවේදී මහත්වරුන්ගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. මේක ජාතික අවශ්‍යතාවයක්. මගේ කොට්ඨාශය ගත්තට පස්සේ කාසල් වත්ත, මුලන, වලවත්ත කන්ද කියන මේ ප්‍රදේශවල හෙරොයින් මත්ද්‍රව්‍ය වල විශාල ව්‍යාප්තියක් තියෙනවා. අපේ ගම තුළත් විශාල වශයෙන් මේක

වර්ධනය වෙලා තියෙනවා. බෝපෙ පෝද්දල බල ප්‍රදේශය විදියට ගත්තට පස්සේ කරාපිටිය වගේ විශාල පැතිවලට මේක ව්‍යාප්ත වෙලා තියෙනවා.

මේක අපේ රමේෂ් පතිරණ ඇමතිතුමාටත් යොමු කරන්න කියලා මම ඉල්ලීම කරනවා. තවදුරටත් මම විස්තර කරොත් මෙම අවුරුදු දෙකක කාලය තුළ මේ අයට එන්න අවස්ථාව ලබා දෙන්නේ නැතුව මේ අයගෙන් පුළුවන් තරම් රට වෙනුවෙන් වැඩ ගන්න ඕන. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රට නගා සිටුවන්න වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරලා තියෙනවා. මට හිතෙනවා ඒකටත් ලොකු හයියක් වේවි කියලා මේක. පුරන් කුඹුරු ටික අස්වද්දන කොට ජල ප්‍රශ්නයත් නැති වෙලා යනවා. කුඹුරු ටික පුරන් වෙලා නිසා ජලය බැහැලා යන්නේ නැතුව පොඩි වැස්සකටත් හැම තැනම ජල ගැලීමක් ඇති වෙනවා. ඒ නිසා මේක හොඳ යෝජනාවක් කියලා මම හිතනවා. මේ අයට මුදල් ගෙවීමක් කරන්නේ නැහැ. හැබැයි පවුල් පසුබිමක් නඩත්තු වෙනවා නම් ඒ අයට රජය හරහා යම්කිසි මුදලක් ලබා දීමට කටයුතු කරන්න පුළුවන්. අවුරුදු දෙකටම කිසිදු මුදලක් නැතුව ඒ අයට වැඩ කරන්න වෙන්නේ. මේක ඉබේම වෙන කොට අඩුවෙයි. මේක ඔප්පු නොවුණත් කමක් නෑ. පොලීසිය වුණත් කුඩු තියෙන කෙනෙක් අත්අඩංගුවට ගත්තොත් නම ගිය කෙනෙක් නම් පමණයි කුඩු අතේ තිබුණේ නැතත් වැරදිකාරයෙක් බවට පත් කරවන්නේ. සාමාන්‍ය කෙනෙක් අත්අඩංගුවට ගත්තට කුඩු තිබුණා කියලා වරද පටවන්නේ නෑ. ඒ ජාවාරම් සමග සිටින, ඒවා භාවිතා කරන අය සඳහා තමයි පොලීසිය මඟදි හමුවුණත් කුඩු පැකට් එකක් හරි දාලා අත්අඩංගුවට ගන්නේ. ඒක නිසා ඒ අය අත්අඩංගුවට අරගෙන මේ වගේ කටයුත්තක් කරන්න කියලා මම යෝජනා කරනවා. මේ දැනුම් දීම කරන්න. කලින් ජනාධිපතිතුමාට දැනුම් දෙන්න කිවුවට ඒ ලියුම් ගියේ නෑ. පාර්ලිමේන්තුවට දාන්න කිවුවා. ඒවාටත් සභාවෙන් ගියේ නෑ. ඒ නිසා කඩිනමින් මේ කටයුත්ත සඳහා අවධානය යොමු කරන්න කියලා සභාවෙන් ඉල්ලීම කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒක හොඳ යෝජනාවක්. මොකද දැන් ගොඩක් වෙලාවට ඒ අයව ප්‍රජා සංවර්ධන වැඩවලට දායක කර ගන්නවා. සමහර වෙලාවට පාසල් වලට, පන්සල් වලට දවසක් වගේ වැඩට යොමු කරවන්නේ. මෙතුමාගේ යෝජනාව ඇත්තටම හොඳ යෝජනාවක්. මම හිතන්නේ ඇත්තටම හොඳ යෝජනාවක් මන්ත්‍රීතුමා. ඒ වගේ මත්ද්‍රව්‍ය උවදුරට යොමු වී සිටින අය ඇත්තටම මේ වගේ කුඹුරු අස්වද්දවන්න යොමු කරවන්න පුළුවන් නම් සෞභාග්‍යකරා රට යොමු කරවන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 29.** දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ලැන්දෑව මාම්පිටිය පාරේ ඇති බෝක්කු සියල්ලම සුද්ධ කරදෙන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** මේ පාර බද්දේගම ඔෆිස් එකට අයිති. මේ පාරේ තියෙන සියලුම බෝක්කු ඇහිරිලා තියෙන්නේ. බෝක්කු හතක් විතර තියෙනවා මම දන්න තරමට. ඒ බෝක්කු සියල්ල ඇහිරිලා තියෙන්නේ. ඒ ඇහිරීම නිසා අද ඩෙංගු තත්ත්වයක් පවා ඇවිල්ලා තියෙනවා. මේ පාරේ එක බෝක්කුවක් හදන්න ගියොත් ලක්ෂ 05 කට වැඩි මුදලක් යනවා. එම නිසා තමයි මම මේ යෝජනාව ගේන්නේ මේක සුද්ධ කරන්න. පමණක් සිලින්ඩර් අස්සේ ගස් වල මුල් ගිහිල්ලා තියෙනවා. මේක ප්‍රාදේශීය සභාවේ අපේ කම්කරුවෝ යොදවලා සුද්ධ කරන්නත් ගියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වලා යවන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** මේක දන්වලා යවන්න. මම පැහැදිලි කරේ මේක. මේක කෝටි ගාණක් වියදම් කරලා හදපු පාරක්. නමුත් මේ පාර භාවිතයට ගන්න බැරි වෙනවා මේ තත්ත්වය දිගට තිබුණොත්. මේ පාරත් විනාශ වෙනවා. ඊට පස්සේ අනෙක් පැත්තෙන් ඩෙංගු උවදුරත් එක්ක මදුරුවෝ බෝවීමත් සිදු වෙනවා යම් යම් තැන්වල. සෝභිත විද්‍යාලය අසල මේ තත්ත්වය තියෙනවා කියලා විදුහල්පතිතුමා කිවුවා. මේක දන්වලා යවලා ඉක්මනින් පිළිසකර කරලා දෙන්න කියලා අපි ඉල්ලීම කරනවා. සියලුම බෝක්කු ටික ලැන්දෑව හන්දියේ සිට මාම්පිටිය පාලම දක්වා, වක්වැල්ල පාර දක්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 30.** අප ප්‍රාදේශීය සභාවට අත් ට්‍රැක්ටර් දෙකක් මිලදීගෙන ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කසළ එකතු කිරීම සඳහා යෙදවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** හේතුව මොකක්ද දන්නවාද. වරිපනම් බදු ගෙවන ජනතාව ඉන්නේ. මේ බෝපෙ පෝද්දල සමහර පාරවල්වල මහා ට්‍රැක්ටරය යන්න බැහැ. මේ වාහන යන්නෙත් නෑ. හැබැයි ඒ පාරවල් වල ඉන්න අයත් අපිට වරිපනම් ගෙවනවා. විශේෂයෙන්ම මම උදාහරණයක් විදියට කියන්නම්. පියදිගම උඩ බෝක්කුව ළඟින් පහළට තියෙන පාර. ඒ පාරේ මුස්ලිම් ජනතාව වගේම සිංහල ජනතාවත් ඉන්නවා. දෙගොල්ලොම ඉන්නවා. ඒ අයගෙන් කුණු ටික ගැනෙන්නේ නැහැ. ඒ අය මැසිවිලි කියනවා අපේ කුණු ටික ගන්නේ නෑ මේක අපිට ප්‍රශ්නයක් කියලා. වරිපනම් ගෙවනවා. නමුත් අපේ කුණු ටික ගන්නේ නෑ කියනවා. ඒ නිසා එම පාරවල් වලට යෙදවීම සඳහා අත්ට්‍රැක්ටර් දෙකක් මිලදී ගන්න මම යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 31.** වැලිපිටිමෝදර කොට්ඨාශයේ අබලන් වූ වීදි පහන් ඉවත් කර යෙදීමට හා අවශ්‍යම ස්ථාන වලට යෙදීම සඳහා වීදි පහන් කට්ටල 50ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 32.** ගිංතොට තුනී ලෑලි සංස්ථාවට අයත් භූමියෙන් අක්කර තුනක ප්‍රමාණයක් පොදු ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා පවරා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** කලින් යෝජනාවේ තියෙනවා මුළු ඉඩමම සභාවට පවරාගෙන ඒ අවශ්‍ය කාර්යයන් කරන්න කියලා. ඒ යෝජනාව තියෙද්දි මේක යෝජනා කරේ ඒ ප්‍රදේශයේ ජනතාවට, ක්‍රීඩා කරන ජනතාවට ක්‍රීඩා පිටියක් සකස් කිරීම සඳහා අවශ්‍ය ඉඩකඩ ලබා ගන්න.

මේ සඳහා පහුගිය දිනවල මම පත්තරේ දැක්කා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ සඳහා විමසීමක් කරපු අවස්ථාවේ එතුමා කියලා තියෙනවා මෙම ඉඩම අත්පත් කර ගන්න කටයුතු කරන්න කියලා. අපි ස්තුතිවන්ත වෙනවා එතුමාට. මේක ආන්දෝලනයට ලක් වෙච්ච කාරණාවක්. මේ ඉඩම කෙසේ හෝ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් භාවිතා කරන්න ඒ අවශ්‍ය කටයුතු කරලා දෙන්න කියලා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට නැවත ස්තුතිය පළ කරනවා. ඒක අපිට ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා. එම ඉඩමෙන් අක්කර තුනක ප්‍රමාණයක් ලබා ගෙන ක්‍රීඩා කරන දරු දැරියන් සඳහා ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 33.** කිතුලම්පිටිය කොට්ඨාශයේ අවශ්‍ය ස්ථාන සඳහා සවිකිරීමට වීදි පහන් කට්ටල 30ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 34.** කිතුලම්පිටිය, ගෝනකොළ දෙණිය මාර්ගයේ උයන්ගොඩ මහතාගේ නිවස අසල පෙට්ටි බෝක්කුවක් ඉදිකර එම මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 35.** තුංහිරිපාන සමන් බේකරිය ඉදිරිපිට මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 36.** උදාර පෙදෙසේ පී.පී.පී කුමාරි මියගේ නිවස අසල කාණුව කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්තටම මේක ගැන පොඩි සඳහන් කිරීමක් කරන්න ඕන. ගරු සභාපතිතුමනි, මීට වසර පහකට පමණ ඉහතදී මේ පලාගල කන්ද ප්‍රදේශයේ කඳු මුදුනේ සිට ජලය බැස යාමට මෙම සභාව මගින් කොන්ක්‍රීට් කාණුවක් ඉදිකරලා තියෙනවා සභාව මුදලක් වියදම් කරලා. මේ සභාවේ සේවය කළ හරිෂ්ප්‍රිය මහතාගේ නිවසේ මායිමෙන් පටන් ගනිපු ඒ කාණුව මේ කුමාරි මියගේ මායිමෙන් නතර කරලා තියෙනවා. ඒ නිසා ඒ කාණුව තුළින් ගලා එන විශාල ජල ධාරාව කුමාරි මහත්මියගේ ඉඩම බාදනය කරමින් තමයි ගලා බසින්නේ. ඉතිං මේ නිසා එතුමිය විසින් කාණුවේ කොටසක් තනාගෙන තියෙනවා. ඉතිරි කොටස තනා ගැනීමට වත්කමක් නැති නිසා ඉල්ලීම කරේ. එතුමිය මීට පෙර ගෞරවනීය ස්වාමීන්වහන්සේ සභාපතිධුරය දරණ අවස්ථාවලදී කීපවතාවක්ම ලිඛිතව සභාවට දන්වලා තියෙනවා. නමුත් කිසිදු පියවරක් අරගෙන නැහැ. ඒක නිසා ඒ කාරණයට අවසර ලබා දෙන්න කියලා ගෞරවයෙන් යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 37.** පලාගල කන්ද බුදු පිළිමය ඉදිරිපිට පෙට්ටි බෝක්කුවක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 38.** පලාගල කන්ද පාරේ ශ්‍රියානි මියගේ නිවස අසළ පෙට්ටි බෝක්කුව සකස් කිරීමටත්, කාණුව කොන්ක්‍රීට් කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 39.** නාවින්න පුවක්වත්ත පාරේ හිඹුටුගහවත්ත ඉඩම හරහා ජලය බැසයාමට කොන්ක්‍රීට් කාණුවක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 40.** රත්නගිරිවත්ත ව්‍යාපෘති මාර්ගයේ පැතිකාණු කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 41.** පැලවත්ත වසන්ත මහතාගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමත්, චමින්ද මන්ත්‍රීතුමත්, ගරු රමේෂ් පතිරණ අමාත්‍යතුමත්, ගාල්ල නගරාධිපතිතුමත් මමත් මෙම ස්ථානය නිරීක්ෂණය කරන කොට වේලාව රාත්‍රී 10.45 යි. ෆෝන් ටෝච් එළිවලින් තමයි අපි ගියේ. මෙම ස්ථානයේ ගැටළුව හඳුනා ගත්තා. මේ ස්ථානයේ පාර පුළුල් කිරීමට ආසන්න ඉඩමේ ගල පුපුරවලා බැම්මක් ඉදිකිරීමට ඒ අවස්ථාවේදී එකඟ වුණා. ඒක තමයි මේ යෝජනා කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ස්තුතිවන්ත වෙනවා ඒකට. අපේ කැබිනට් අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ ඇමතිතුමා රාත්‍රී 10.45 ට විතර තමයි මේ මාර්ගය නිරීක්ෂණය කරේ. අපි ස්තුතිවන්ත වෙනවා එතුමාට අපේ නායකයා විදියට ඒ සඳහා සහභාගිවුණාට රාත්‍රී කාලයේ වුණත්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 42.** අපේගම ප්‍රධාන මාර්ගයේ වීරක්කොඩි මහතාගේ නිවස අසළ කාණුව කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ- 43.** කුඩා බැකෝ යන්ත්‍රයක් යොදා කුරුඳුවත්ත කොට්ඨාශයේ අවහිර වී ඇති ඇළවල් සුද්ධ කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ-** මේ යෝජනාව ඉදිරිපත් කරන්න විශේෂ හේතුවක් තියෙනවා ගරු සභාපතිතුමනි, අපේ ගෞරවනීය ස්තුතිය පුදකරනවා සභාපතිතුමාට. ගිංතොට ප්‍රදේශයේ ශ්‍රමදාන වැඩසටහනක් කරා අපේ සංවිධානයකින්. අපේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, ලේකම්තුමත් ඒ වගේම සියලුම නිලධාරීන්, කාර්ය මණ්ඩලය සියලු සහයෝගය අපිට ලබා දුන්නා. සියලු ස්ථාවර වත්කම්, සියලු ශ්‍රමය අපිට ලබා දුන්නා. සභාපතිතුමා කීප අවස්ථාවකම එම ස්ථානයට ආවා. ඒක හොයලා බැලුවා. අඩුපාඩු ඔක්කොම ටික සලසලා දුන්නා. ලේකම්තුමත් ඒකට මැදිහත් වුණා. විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ සම්බන්ධව අපේ සංගමයෙන් සභාවට ලිපියකුත් යොමු කරලා ඇති. ඒකට විශේෂ ගෞරවනීය ස්තුතිය මේ ප්‍රාදේශීය සභාවට පිරිනමනවා ඒකට දක්වපු සහයෝගයට. අපිට විශාල සේවයක් කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒ පිළිබඳව වචනයක් කියන්න ඕන. ගිංතොට සංවර්ධන පදනම කියලා අලුත් සංවිධානයක් පිහිටුවා ගෙන තියෙනවා. මුලු ගිංතොට, කුරුඳුවත්ත, මහ හපුගල යන සියලුම ප්‍රදේශ, සියලුම පාරවල් ආවරණය වන පරිදි ඉතාමත්ම සාර්ථක වැඩපිළිවෙලක් කරා. ඒකට මුස්ලිම් ජනතාව විතරක් නෙමෙයි සිංහල ජනතාවත් තමන්ගේ සක්‍රීය දායකත්වය ලබා දුන්නා. අවුරුදු විසිගාණකට විතර කලින් කොන්ක්‍රීට් කරපු කාණු වල තිබුණු පස් තට්ටු සම්පූර්ණයෙන්ම ඉවත් කරා, ගෙවල් අයින්වල දාපු කොන්ක්‍රීට් ලෑලි පවා පුද්ගලිකව ගලවලා ඉවත් කරලා ඒ සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දුන්නා. අති විශාල වැඩ කොටසක් කරා. සභාවේ කම්කරුවෝ කරා නම් මාසයක් විතර කරන වැඩ ඒ දිනය පුරාවට කරා. ඉතාමත් අති සාර්ථකයි. මම ඒ පිළිබඳව ඒ සංවිධානය ඇතුළු ඒකට සහභාගි වෙච්ච සියලුම දෙනාට ස්තුතිවන්ත වෙනවා. ඒකට ගියා නම් දැක ගන්න පුළුවන් අතිසාර්ථක, ඉතාමත් හොඳ කාර්යභාරයක් ඒ අය කරේ. එතනදී මම ප්‍රකාශ කරා, මට දින ලබා දෙන්න සම්පූර්ණ සතියක් පුරාවට සභාවේ කම්කරු මහත්වරු, ඒ වගේම සභාවේ තියෙන යන්ත්‍රෝපකරණ, බැකෝ යන්ත්‍රය ලබා දෙන්නම් කියලා. කාණු අවහිර වෙලා, මදුරු පණුවෝ බෝවෙලා, ඇලවල් අවහිර වෙලා. මම කිව්වා සතියක් එක දිගට දායකත්වය දෙන්න අපි සභාවෙන් එක දිගට සතියක් මන්ත්‍රීවරුන් සම්බන්ධ වෙලා සභාවේ දායකත්වය දෙන්නම් කියලා. මම ඒක පොරොන්දු වුණා. ඒ අය අපිට කියන්නේ නැතුව අපි ලබාදෙන දේක බලාපොරොත්තුවක් නැතුව ඒ අය කරපු කාර්යය ඇස් දෙකට දැකපු නිසා තමයි ඒ පොරොන්දුව වුණේ. ඒකට සභාවේ සියලුම දෙනාගේ ස්තුතිය ඒ සංවිධානය ඇතුළු ප්‍රදේශවාසීන්ට සභාපතිවරයා විදියට මම පුදකරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ-** ඒකෙදි කුණු ට්‍රැක්ටර් 150 ක් 200 ක් විතර අපි අයින් කරා. ඒවා දාන්න ඕන තැන්වලට දාලා වහලා දැම්මා. ලොකු කැප කිරීමක් කරා. ඒ වගේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයටත් අපි ස්තුතිවන්ත වෙනවා. එහෙනුත් අපිට සහයෝගය ලබා දුන්නා. ඒක නිසා ලොකු වැඩපිළිවෙලක් කරා. ඇළවල් ටිකක් තියෙනවා ගරු සභාපතිතුමනි වතුර බහින්නේ නැති. වර්තමානයේ පස් පර්මිට් එක ඕන නැති නිසා හොඳයි. දුන්න එකට විරෝධතාවය ප්‍රකාශ කරනවා නෙමෙයි. ඒකෙන් අයුතු ප්‍රයෝජන ගන්න කට්ටියකුත් ඉන්නවා. ඒකෙන් දැන් ඇළවල් ටික ඔක්කොම වහගෙන වහගෙන යනවා කට්ටියක්. මම නම් ඊට දැඩි විරුද්ධයි ඇළවල් හා කාණු වහනවාට. පොඩ්ඩක් හරි වැස්සම සම්පූර්ණ ප්‍රදේශයම යටවෙනවා. එතකොට බනින්නේ අපිට. පොඩ්ඩක් හරි යටවුණාට පස්සේ කෑම ගෙනාවේ නෑ, අරවා ගෙනාවේ නෑ කියලා බනින්නේ අපිට. ඒ නිසා මෙතනදී කාණු, ඇළවල් වහනවා නම් සභාවෙන් ගන්න පුළුවන් ඉහළම ක්‍රියාමාර්ගය ගන්න.

එකක්වත් වහන්න දෙන්න එපා. පහුගිය දවස්වල මම දැකලා එකක් තාක්ෂණ නිලධාරි යවලා ඒක නැවැත්වුවා. ඒක කාණුවක්. ඒ මනුස්සයා පර්චස් දෙකක් විකුණලා තියෙනවා යාබද ඉඩමේ කෙනාට. එතනින් කාණුවක් ගියේ. ඒ මනුස්සයා විකුණලා තියෙන්නේ කාණුව. මම ඒක ගැන සභාපතිතුමාට කිවුවම තාක්ෂණ නිලධාරි ගිහින් ඒක නැවැත්වුවා. දැන් කාණුව හාරනවා. ඒ ඇළවල් ටික සුද්ධ කරන්න ඕන ගරු සභාපතිතුමනි. ගිංතොට මහ හපුගල තියෙනවා ඇළක් මුළු කන්ද උඩ ඉඳන් එන වතුර ටික බහින්නේ එතනින්. ඒ වතුර ටික කැපු ඇළට බහින්නේ. ඒක කපන්න අනිවාර්යයෙන් එක්ස්කැවේටර් යන්ත්‍රයක් දාන්න ඕන. අර පෙට්ටියක් වගේ දාගෙන යන එක තිබුණා නම් හරි. ඒක තිබුණා නම් ගිංතොට යටවෙන එක සම්පූර්ණයෙන්ම නතර කරන්න පුළුවන්. ඒ සහයෝගය ගන්න ඕන නිසා තමයි මේ යෝජනාව දැම්මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සතියක් ඔබතුමා නම් කරන්න, අපි ඒක ලබා දෙන්නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ-** ඒ වගේම පොඩි පොඩි පාරවල් ටිකක් තියෙනවා. කතරගම පල්ලිය ළඟත් තියෙනවා. අබ්දුල් අසීස් මාවත ගාව ඉඳන් කෙලින්ම යන්නේ කතරගම පල්ලිය ගාවට. වැලිපිටිමෝදරත් තියෙනවා. ඒක යන්නේ කැපු ඇළ ගාවට. ඒකට සුගත් මන්ත්‍රීතුමාගේ සහයෝගයත් අරගෙන සම්පූර්ණයෙන්ම ඒ පැත්ත සුද්ධ කර ගන්න පුළුවන් අපිට. දවසක් දාගෙන ඒ ටික ඔක්කොම කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ- 44.** මහ හපුගල, ගොඩවත්ත හරස් පාරේ මාරිෆා මියගේ නිවසට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ-** ඒ යෝජනාව පහුගිය දවස්වල දාලා තිබුණේ. ඒක ලක්ෂ තුනක් විතර යන වැඩක්. තාක්ෂණ නිලධාරි ඇවිල්ලා මැන්නා. අඩි 05 ක් කියලා ඒ පාර කරන්න බැහැ කිවුවා. සභාවෙන් කරන්න කිවුවා. පොඩි පාරක් තියෙන්නේ. ඒක කොන්ක්‍රීට් කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ- 45.** මහ හපුගල, ගොඩවත්ත හරස් පාරේ පොකුණ අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ- 46.** මහ හපුගල, පින්නකොළ දූව පාර කුට්ටිය දූව කඳු මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ- 47.** අබ්දුල් අසීස් මාවතේ ඉම්රාන් මහතාගේ නිවස අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ-** පොඩි පොඩි පාරවල් මේ. ලක්ෂ 03 ක් 04 ක් යන්නේ මේවට. පහුගිය දවස්වල ලක්ෂ 05, ලක්ෂ 10 යෝජනා වලට දා ගන්න බැරි වුණ ඒවා මේ. මේ ටික ඉටු කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

<u>**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** සුභ දහවලක් වේවා සියලු දෙනාටම. ගරු සභාපතිතුමනි, මා හිතවත් මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, මාධ්‍යවේදීන් හා සභාවේ සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ගෙන් අවසරයි.

මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා මගේ කොට්ඨාශයට ප්‍රජා ශාලාවක් සාදා ගැනීමට ඔබතුමන්ලා මට දක්වපු සහයෝගය නිසා අද ඒ ඉඩම මැනුම් කටයුතු සිදු කරා. අපේ කලේගාන උතුර හා දකුණ යන ග්‍රාමසේවා වසම් දෙක එකතු වෙලා ප්‍රජාශාලාවක් හා කැටයම් ශිල්පීන්ගේ මධ්‍යස්ථානයක් පිහිටුවා ගැනීමට ආධාර කිරීම පිළිබඳව සභාපතිතුමා ඇතුළු ඔබ සියලු දෙනාටම මාගේ ස්තුතිය පුද කරනවා.

**48.** දෙණියවත්ත සිට නාගරුක්ඛාරාම දක්වා ගලා බසින දොළ එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා සුද්ධ පවිත්‍රකොට කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 49.** වටරැක නැගෙනහිර වැඩිහිටි නිවාසයේ ඇති බුදුගෙය වීදුරු යොදා, පින්තාරු කොට අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** වටරැක නැගෙනහිර වැඩිහිටි නිවාසයක් තියෙනවා ගරු සභාපතිතුමනි, ඒකේ වයසක අපේ අම්මලා වගේ කට්ටියක් ඉන්නේ. එතන මිනිස්සුන්ට බුදුන් වඳින්න බුදුගෙයක් තියෙනවා. ගොඩනැගිල්ල හදලා තියෙන්නේ. බුදුපිළිමයකුත් ගෙනැල්ලා තියෙන්නේ. ඒක වඩම්මවන්න පින්තාරුකරලා, වීදුරු දාලා ආවරණය කරන්න මම යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කොහොමද කරන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ-** ඒක ඔබතුමාගේ පෞද්ගලික ධනයෙන් කරන්න. පිං අතේ වැඩක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 50.** බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ සිටින ලී කැටයම්කරුවන් වෙත සහනදායි මිලට කලුවර හා අනෙකුත් ලී දැව සංස්ථාව හරහා ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසන ලෙස අතිගරු ජනාධිපතිතුමා වෙත දන්වා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපේ ශිල්පීන් ඉන්නවා කලේගාන උතුර, කලේගාන දකුණ හා මාම්පිටිය ප්‍රදේශවල පවුල් තුන්සීයකට ආසන්න ප්‍රමාණයක්. අපි මියගියත් කළුවර ලී කැල්ල රඳා පවතිනවා. ඒ ලී මිල වැඩියි. මිල වැඩි හින්දා ශිල්පීන්ට ඒකෙන් නිෂ්පාදන කරන්න අමාරුයි. ඒවා සහන මිලට ලබා දෙන්න. කියුබික් අඩි 05ක් ගන්න ශිල්පියාට තියෙනවා පර්මිට් එකක්. ඒවා සහන මිලට ගන්න මිල අඩු කිරීමක් කරන්න මම යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 51.** අප ප්‍රාදේශීය සභාවේ අනියම් සේවකයෙකු ලෙස වී.සී පාරේ පදිංචි පී.ජී. නිරෝෂන් මයා බඳවා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එක්කෙනෙක් එන්නේ නෑ. ඒ වෙනුවට ගත්තේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ- 52.** ගම ගෙදර වත්ත පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** කොන්ක්‍රීට් කරලා තියෙන්නේ ඒ පාර. ස්ථානයන් දෙකක් යාමට නොහැකි තත්ත්වයේ තියෙනවා ඒක සංවර්ධනය කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>**

**<u>01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව.</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2019.12.20 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** II. 2020.01.07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>02. තාක්ෂණික සේවා කමිටුව</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-01-09 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-01-09 දින පැවති නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>04. පරිසරය සහ පහසුකම් කමිටුව</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-01-09 දින පැවති පරිසරය සහ පහසුකම් කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u>**

**<u>01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**04. වෙනත් ලේඛන** ඃ- නැත

**(උ෴) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ජනවාරි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට අර පස් දාලා කාණු වහන එක ගැන පැහැදිළි කිරීමක් කර ගන්න ඕන. අපිට කොහෙද ප්‍රතිපාදන තියෙන්නේ දැන් කාණුවක් ගොඩ කරොත් ඒක නවත්වන්න. ඒක කරන්නේ කොහොමද, ඒක වහනවා නම් ඒකට නීතිමය පැත්ත මොකක්ද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අපිට බලතල තියෙනවා. ජලය බැස යාමක් අවහිර කරනවා නම් පනතේ බලතල තියෙනවා සභාපතිවරයාට ඒ අවහිරතාවය ඉවත් කිරීමට. අපිට පුළුවන් සැලසුම් කමිටුවට දාලා අදාළ ක්‍රියාමාර්ග ගැනීමට. සැලසුම් කමිටුවට දාලා ගන්නත් පුළුවන්. නැතත් පුළුවන්. නීතිමය ක්‍රියාමාර්ග එවෙලේම ගන්න බලය තියෙනවා පැය 48 ක් ඇතුළත. අනවසර ඉදිකිරීමක් නම් සැලසුම් කමිටුවට දාලා නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා.

27 වෙනිදා උදේ 09.00 ට තුනිලැලි සංස්ථාව ඉදිරිපිට උද්ඝෝෂණයක් පැවැත්වෙනවා. ඒකට සියලු මන්ත්‍රීවරු සහභාගි වෙන්න. පළවෙනිදා හවස 04.30 ට තියෙනවා උත්සවයක්. පර්සි කේ. ජයතිස්ස අපේ සාහිත්‍යධරයට, කලාකරුවාට සම්මානයක් හම්බ වුණා. ඒ සම්මානයට එතුමාට කෘතවේදීත්වය පළ කිරීම පිණිස සභා මට්ටමින් නෙමෙයි, නමුත් අපිත් සහභාගි වෙලා දායකත්වය ලබා දීලා පළවෙනිදා හවස 04.30 ට කිතුලම්පිටිය ආනන්ද විද්‍යාලයේ එතුමාට උපහාර උත්සවයක් රමේෂ් පතිරණ ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙනවා. ඒ සඳහා සියලු මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ලාට ආරාධනා කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේකේ තියෙනවා ගරු මන්ත්‍රීවරුන්වෙත මුදල් ගෙවීමකින් තොරව සමූහ ඡායාරූපය ලබා දීම සඳහා ප්‍රාදේශීය සභා පනත මඟින් ප්‍රතිපාදන සැලසී නොමැති බව දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස් විසින් දැනුවත් කරන ලදි කියලා. මේක ප්‍රගතියක් නෙමෙයි සභාපතිතුමා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ප්‍රගතියට වැටෙන්න ඕන දේවල් ප්‍රගතියට වැටෙන්නේ නෑ. අනවශ්‍ය දේවල් තමයි ප්‍රගතියට වැටෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීවරුන්ට දන්වන්න කැමතියි ප්‍රීමික්ස් ව්‍යාපෘතිය නැවත පටන්ගෙන තියෙනවා. නමුත් මන්ත්‍රීවරුන්ට මම කියා සිටිනවා මුලින්ම ඒ ටික කරන්න ඕන. මම තාක්ෂණ නිලධාරිතුමාට දැනුම් දුන්නා වතුර ගැනීමට කඩපු තැන් විතරක් මූලික වටයේ කරන්න කියලා. ඒක ගැන ලොකු චෝදනාවක් තියෙනවා. ගිය සැරේ අපි මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශ වලින් වැඩ පටන් ගත්තා. අර පාරවල් කැඩිච්ච ඒවා කරාට වතුර ගන්න කඩපු ඒවා කරේ නෑ කියලා චෝදනාවක් ආවා. මූලික වටයේ සම්පූර්ණයෙන්ම බෝපෙ පෝද්දල ආවරණය වෙන්න

වතුර වලට කඩපුවා විතරයි වහන්නේ. ඒකට මන්ත්‍රීවරු බලපෑම් කරන්න එපා තාක්ෂණ නිලධාරීට. ඒ විදියට තමයි මම උපදෙස් ලබා දුන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ ආසන්නයේ තිබුණොත් බැරිද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මන්ත්‍රීතුමා ඒක නිර්ණායකයක් විදියට ගත්තොත් අපිට ගැටළුවක් මතු වෙනවා. ප්‍රායෝගික ගැටළුවක් තියෙනවා. එහෙම කරන්න වුණොත් පාරවල් දිගින් දිගට කරන්න වෙනවා. මේක හැදුවා ඉතුරු ටික හැදුවේ නෑ කියනවා. කෙලින් කියන්න පුළුවන් වතුර වලට විතරක් කඩපුවා හදනවා නම් වතුර ගන්න කඩපුවා විතරයි හදන්නේ කියලා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ජලය ලබා ගැනීමේ අලුත්වැඩියා කටයුතු සඳහා හාරපු වලවල් විශාලයි. දැන් ධම්මරතන මාවතේ ඒවගේ ස්ථාන හතරක් විතර තියෙනවා. ඒවා ගැඹුර වැඩියි. ඒකට ප්‍රීමික්ස් විතරක් දාන්න බෑ සභාපතිතුමා. ඒවාට පස් ටිකක් හරි දාලා තලලා තමයි හදන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** A.B.C. දාලා තලනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අන්න එහෙම ක්‍රමවේදයකට යන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගැඹුර වැඩි ඒවාට A.B.C. දාලා කරන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අන්න එහෙම කරන්න. ධම්මරතන මාවතේ ඒ වගේ ස්ථාන හතරක් විතර තියෙනවා. දැන් ඒ ස්ථාන අපි දන්වන්න ඕනද තාක්ෂණ නිලධාරි මහත්වරු හොයා ගන්නවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැම පාරක්ම ගිහින් බලලා එතුමාට තීරණය කරන්න කියලා කිවුවා.

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2020.02.18 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.